# ශ්‍රී ලංකාවේ සමූහ සුසාන හා අසාර්ථක කැනීම්



**2023 ජූනි**


JDS
Journalists for Democracy in Sri Lanka

FOD
No More Disapperances

CHRD

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

මාතලේ  සමුහ මිනීවල ගැන කතාව අහපුවම අපි හිතුවා මරලා දාපු මගේ මල්ලි ඇතුළු අනිත් හැම දෙනාටම මොකක් හරි සාධාරණයක් වෙයි කියලා.  අඩුම ගානේ මොකද වුනේ කියලා වත් දැන ගන්න ලැබෙයි කියල.  අපේ අම්මා තවම ජිවත් වෙනවා  ඒ  මල්ලි නැති වීම විඳ දරා ගෙන. අපිත් ගිහින් පොලිසියට ප්‍රකාශ දුන්නා අපේ මල්ලිලා මේ සමුහ මිනිවලේ  මරා දාලා ඇති කියලා,  ඒ ගැන සාධාරණ පරීක්ෂණයක් කෙරෙයි කියලා හිතලා.  ඒත් දැන් අවුරුදු ගානක් ගෙවිලා ගිහිල්ලත් කිසිම පරීක්ෂණයක් නැහැ.  ඔක්කොම යටගහලා. ඒ දවස්වල මේ ගැන උනන්දුවෙන් ක්‍රියා කරපු  මාධ්‍ය  වගේම දේශපාලන පක්ෂත් ඒවා අමතක කරලා.  සමහරු මේ මරා දාපු අයගේ  පින්තුර  ඒ ගොල්ලන්ගේ දේශපාලන වාසියට පාවිච්චි කරනව මිසක්  ඒ අයට  යුක්තියක් ඉටු කරන්න අඛණ්ඩ අරගලයක් ගෙනියන්නේ නැහැ.  මාතලේ  ඝාතන වලට දායක වුනු හුඟ දෙනෙක්  රටේ ලොකු තැන්වලටත්  ඇවිත්  හොඳට ඉන්නවා. ඒත් අමානුෂිකව මරා දාපු අය  පොලවට යට කරලා හංගන්න හදනකොට මාතලේ මිනිවලෙන්  ඒ කතන්දර මතු වුනත්  ආයෙමත් ඒක වහලා දාලා  ඒ හැම එකක්ම අමතක කරලා. මරා දාපු උදවියගේ ළඟම අයට විතරයි ඒ දුක වේදනාව. මාතලේ සමූහ මිනීවල කියලා විශේෂයක් නැහැ, අනික්  අපරාධ වලට වගේම තමයි, මේ  රටේදී යුක්තිය ඉටු වෙනවා කියන එක හුදු බලාපොරොත්තුවක් විතරයි.

**1989 දී අතුරුදහන් වූ ආනන්ද ඉඩමේගමගේ සොයුරු**
**බන්දුල ඉඩමේගම**
සම්මුඛ සාකච්ඡාව - 2023 මැයි 3

# ශ්‍රී ලංකාවේ සමූහ සුසාන සහ අසාර්ථක කැනීම්

## සාරාංශය


'මම හාර හාරා ඉඳලා මහන්සි වෙලා තවදුරටත් වැඩ කරන්න එපා වෙනකොට, මට හිතෙනවා මම හාරන වලේ ඉන්නේ මම නම් කොහොම වෙයිද කියලා. මාව හොයාගන්න හාරන එක නවත්තනවට මම කැමති නෑ.'

2000 දී පළවූ මයිකල් ඔන්ඩච්චිගේ Anil's Ghost (අනිල්ගේ අවතාරය) නවකතාවේ අනිල් තිසේරා

මේ ඒකාබද්ධ වාර්තාවෙන් විභාග කෙරෙන්නේ විවිධ වකවානුවල ගැටුම්වලින් ඇතිවූ සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කටයුතු කළ ආකාරයට අදාළ වාර්තාවයි. අනාවරණය නොවූ දස දහස් සංඛ්‍යාත සිරුරු දිවයින පුරා සමූහ මිනීවළවල්වල මිහිදන් කර තිබේ. පසුගිය දශක තුන තුලදී සමූහ මිනීවළවල් විස්සක් පමණ තරමක් දුරට ගොඩ දමා තිබුනත්, කිසිදු කුටුම්භයකට තම සමීපතමයන්ගේ ශේෂයන් භාරදී නැත.

ශ්‍රී ලංකාවේ කොමිෂන් සභා අනේකයක් අතුරින් එකකවත් විෂය පථයට සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් සොයා බැලීම ඇතුලත් වූයේ නැත. ඒ වෙනුවට සිදුවුයේ, සත්‍යය හෙළි කරගැනීම සඳහා ගන්නා ලද උත්සාහයන්ට බාධා පැමිණවීමයි. මහේස්ත්‍රාත්වරුන් සහ වෝහාරික විශේෂඥයන් හිටිඅඩියේ මාරු කර යවන ලදී, උසාවි නියෝග ක්‍රියාත්මක කිරීම පොලිසිය විසින් පමා කරන ලදී, මිනීවළවල් ඇති ස්ථානවලට ඥාතීන්ට සහ නීතිඥයන්ට ප්‍රවේශවීමේ ඉඩකඩ අහුරා ලන ලදී, ජීවතුන් අතර සිටින සාක්ෂිකරුවන් සොයා ගැනීමට කිසිඳු උත්සාහයක් නොදරන ලදී, පූර්ව මරණ දත්ත කිසිවක් රැස් කර නොගන්නා ලදී, යමකු අධිකරණය විසින් වරදකරු ලෙස තීන්දු කරන ලද අතිශය දුර්ලභ අවස්ථාවලදී පවා සිදුවුයේ ඔවුන්ට සමාවක් දීමයි. එය දේශපාලන අධිෂ්ඨානයක් නැති කමත්- නොසරිලන නීති රාමුවක්, සංගත ප්‍රතිපත්තියක් නැතිකමක් සහ සම්පත් හිගකමත් පිළිබඳ අන්දරයකි. අතුරුදහන්වුවන්ගේ ඥාතීන්ට නම් එය නොවිසඳුණු ශෝඛාන්තයක් පිළිබඳ කතාවකි; දුකට පත් වුවෝ පන පිටින් කඹුරා සිය ප්‍රියාදරයන් නොදැකම මියැදෙන්නෝය.

මෙතාක් කැනීම් බොහොමයක් සිදු කිරීමට බලධාරීන්ට සිද්ධවී ඇත්තේ ඉදිකිරීම් කටයුතුවලදී සමූහ මිනීවළවල් පිහිටි ස්ථාන අහම්බෙන් හෙළිවූ විටදීය. එසේත් නැතිනම්, 1999 දී යාපනයේ දිස්ත්‍රික්කයේ චෙම්මනිහිදී සිදුවූ ආකාරයට ආරක්ෂක අංශ සාමාජිකයන් විසින් දෙනලද තොරතුරු පදනම් කරගෙනය. කැනීම්වල අඩුපාඩු මෙම වාර්තාවෙන් විශ්ලේෂණය කෙරේ. 2013 දී මල සිරුරු 155ක් ගොඩගත් මාතලේත්, 2013 දී හා 2018 දී ස්ථාන දෙකක පිලිවෙලින් සිරුරු 81 ක් හා සිරුරු 318 ක් (දරුවන් 28ක්ද ඇතුළුව) ගොඩගත් මන්නාරමේත් අත්දැකීම් ගැන විශේෂයෙන් අවධානය යොමුකෙරේ. මානව හිමිකම් හා සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය (මාසම), අතුරුදහන්වුවන්ගේ පවුල් එකතුව (පඑ), ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (ප්‍රම) සහ සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (සයජ) දන්නා තවත් කැනීම් පිළිබඳව මේ වාර්තාවේ ඇමුණුමේ ඇත.

සිදුකරන ලද කැනීම්වලට අදාළ දුර්වලතා මේ වාර්තාව විසින් ඉස්මතු කර දක්වන්නේ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා යහ භාවිතා ඇසුරිනි. එහිදී ප්‍රධාන වශයෙන් මුලාශ්‍ර කොටගෙන ඇත්තේ බහිර් නීතික, අත්තනෝමතික සහ ලඝු ඝාතන සාර්ථක ලෙස වලක්වා ලීම සහ විමර්ශනය පිළිබඳ 2016 සංශෝධිත එක්සත් ජාතීන්ගේ අත්පොත (මිනීවළවල් කැනීම සම්බන්ධ මාර්ගෝපදේශ ද ඇතුලත් එය මිනසෝටා මුලලේඛය ලෙසද හැඳින්වේ) සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ (ජාරකක) මගපෙන්වීම සහ අතුරුදහන් තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසමේ (අජකො) සමූහ මිනීවළවල් ආරක්ෂා කිරීම සහ විමර්ශනය පිළිබඳ 2020 බෝර්න්මත් මුලලේඛයයි. .

ශ්‍රී ලංකාවේ කැනීම්වල ප්‍රධානතම දුර්වලතාවක් වී ඇත්තේ ඥාතීන් සම්බන්ධ කර නොගැනීමයි. අසතුටුදායක ලෙස හෝ අපරාධ

පරීක්ෂණ කෙරුණු අවස්ථාවලදී පවා ඥාතීන් බොහෝ විට නොතකා හරින ලදී.

ගොඩගන්නා ලද සිරුරු අයත් පුද්ගලයන්ගේ අතුරුදහන් කිරීමට සහ ඝාතනයට වගකිවයුත්තන්ට නඩු පවරා වරදකරුවන් බවට පත් කිරීම පසෙක තිබියේවා, වින්දිතයන් හඳුනාගැනීමට හෝ ඔවුන්ගේ මරණ සිදුවූ ආකාරය පැහැදිලි කරගැනීමට හෝ මේ තාක් දුරට මග පාදා තිබෙන කැනීම් ප්‍රමාණය ඉතා අල්පය.

සමූහ මිනී වලක් සොයාගෙන කනිනු ලබන ප්‍රදේශයක ජීවත්වන අතුරුදහන් වුවන්ගේ ඥාතීන්ගෙන් පූර්ව මරණ දත්ත රැස් කරගැනීමේ විධික්‍රමයක්, පටිපාටියක් හෝ සැබවින්ම පුරුද්දක් හෝ ශ්‍රී ලංකාවේ නැත. එවැනි  තොරතුරු රැස් කිරීමේ අරමුණ වන්නේ ශේෂයන් හඳුනාගෙන ඒවා නෑසියන්ට භාරදීමයි. උදාහරණ වශයෙන්, මන්නාරමේ හෝ මාතලේ එවන්  පූර්ව මරණ දත්ත රැස් කිරීමක් සිදුවී නැත. 1996 අගෝස්තු 19 වැනිදා හමුදා නිලධාරීන් විසින් අත් අඩංගුවට ගන්නා ලදුව අතුරුදහන් වූ ගරාජ් කාර්මිකයන් දෙදෙනකු  1999 දී පවුලේ සාමාජිකයන් විසින් චෙම්මනිහිදී හඳුනා ගන්නා ලද්දේ ඔවුන්ගේ ඇඳුම්වලිනි. එක් අයකුගේ දෑස් ඔහුගේ කමිසයෙන් වසා බැඳ තිබුණු අතර, අනික් තැනැත්තාගේ දෑත් ඔහුගේ බැනියමින් ගැට ගසා තිබුණි. ඒ අවස්ථාවේ වුවද, ශේෂයන් කිසිදාක ඥාතීන්ට බාර දුන් බවක් නැත.

විවිධාකාර ජනාධිපති විමර්ශන කොමිෂන් සභා විසින්ද, බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් හෝ අතුරුදහන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (WGEID) සහ සත්‍යය, යුක්තිය, හානිපූරණය හා පුනරාවර්තනය නොවීම සහතික කිරීම පිළිබඳ විශේෂ නියෝජිත වැනි එක්සත් ජාතීන්ගේ විශේෂ පටිපාටීන් විසින්ද කිහිප වාරයක් පෙන්වා දී ඇති පරිදි ශ්‍රී ලංකාවේ නීති රාමුව සප්‍රමානික එකක් නොවේ. අත්තනෝමතික පටිපාටීන්, පාත්‍ර වර්ගයා අතර සම්බන්ධීකරණය මඳකම සහ උපදේශක අධිකරණ වෛද්‍ය නිලධාරියකුගේ අනිවාර්ය සහභාගිත්වය නැති වීම; මිනීවළවල් ලෙස සැකකෙරෙන ස්ථාන පිළිබඳ අතීත විමර්ශනවල ඌනතා සම්බන්ධයෙන් සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ 2016 අතුරු වාර්තාව විසින් අවධාරණය කර ඇති උදාහරණ වේ.

මරණ පරීක්ෂණ නීතිය සහ සම්මත ක්‍රියා පටිපාටීන් පිළිබඳ කෙටුම්පතක් 2015 සිට සකස් කෙරෙමින් පැවතුනද, ඒවා හමාර කර නැතුවාක් මෙන්ම, එම කෙටුම්පත් ප්‍රසිද්ධියට පත්කර හෝ ප්‍රවිචාරණය සඳහා  අදාළ පාර්ශව හමුවට පමුණුවා හෝ නොමැත. 2016 දී නීතිගත කරන ලද අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) ට කැනීම් නිරීක්ෂණය කිරීමට බලය පවරා ඇති හෙයින් එය මෙම ක්‍රියාදාමයට සම්බන්ධ වී සිටියේය. එය මේ සම්බන්ධයෙන් 2018 දී අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමග සාකච්ඡාවලට මුල පුරා තිබුණි. CHRD, FoD, JDS හෝ ITJP හට එහි පිටපතක් ලබා ගැනීමට හැකි වී නැත. ඒ, FoD සංවිධානය තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ 2023 අප්‍රේල් මාසයේ ඉල්ලීමක් කර තිබියදීය.

OMPය පිහිටුවීම ඇතැමුන්  තුළ බලාපොරොත්තු ජනිත කළත්, ස්වකීය වරම ප්‍රකාර ප්‍රතිඵල ලබා දී වින්දිතයන්ගේ පවුල්වල විශ්වාසය දිනා ගැනීමට එම කාර්යාලය අසමත් වී සිටී. සමූහ මිනීවළවල් සම්බන්ධ ඔවුන්ගේ භූමිකාව පිළිබඳව OMP කාර්යාලයේ අලුත්ම වාර්ෂික වාර්තාවේ  (2021) ඇත්තේ ඉතාමත් ලුහුඬිණි. නිල වශයෙන් ඉල්ලීමක් කළත් වැඩිදුර විස්තර ලබා දී නැත.

සමූහ මිනීවළ ගොඩලෑම් සම්බන්ධ තවත් ප්‍රධාන ගැටළුවක් වී ඇත්තේ කිසියම් දේශපාලකයකු හෝ ඔහුට සමීප අය හෝ අපරාධවලට ගෑවී ඇති නම්, කාර්යාවලියට හානි පැමිණවීමේ අටියෙන් දේශපාලන ඇඟිලි ගැසීම් සිදුවීමයි. මෙය කැනීම් ක්‍රියාදාමයේ සෑම අදියරකම අංගයක් ලෙස පවතී. මඩකලපු දිස්ත්‍රික්කයේ කලුවන්චිකුඩි වළේ විමර්ශන 2014 දී මුලින්ම යුහුසුළු කෙරුණේ ශේෂයන් දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයෙන් පීඩාවට පත් වුවන්ගේ යයි උපකල්පනය කොටගෙන ය. එහෙත්, ඊළඟට සිදුවුයේ විමර්ශන ඇණ හිටීමයි. ඊට හේතුව ලෙස ඇතැමුන් පවසන්නේ 2004 දී බඹඹෑය අතහැර මහින්ද රාජපක්ෂ තන්ත්‍රයට හවුල් වූ විනයාගමූර්ති මුරලිදරන් (කර්නල් කරුණා) මෙම සමූහ මිනීවලට සම්බන්ධ බවට රාජ්‍යය විසින් අවබෝධ කරගැනීමයි.  මහේස්ත්‍රාත්වරයකුට පැමිණිලි කොට දස වසරකට ආසන්න කාලයක් ගතවී තිබුනත්, කැනීම් තවමත් සිදුවී නොමැත.

දේශපාලන අත පෙවීම් සම්බන්ධ පරම උදාහරණය වන්නේ මාතලේ කැනීම්වලදී එවක ආරක්ෂක ලේකම් වූ ගෝඨාභය රාජපක්ෂගේ භූමිකාවයි. 1989 ජුලි සිට 1990 ජනවාරි දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ හමුදා සම්බන්ධීකරණ නිලධාරියාව සිටි ඔහු පසුව රටේ ජනාධිපති විය. මාතලේ ඇතුළු මධ්‍යම පළාතේ සියලු පොලිස් ස්ථානවල අවුරුදු පහකට වඩා පැරණි වාර්තා සියල්ල විනාශ කර දමන්නට ඔහු අණ දුන් බව කියැවේ. විමර්ශන කාර්යදාමය අඩාල කිරීමේ භූමිකාවට සම්බන්ධ බවට චෝදනා ලබන ගෝඨාභය රාජපක්ෂ ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස්

නිලධාරීන්ට එරෙහිව ශ්‍රී ලංකාවද පාර්ශවකරුවකු වන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතියේ 12(4) වගන්තිය ප්‍රකාර රාජ්‍යය පියවර ගත යුතු ය. ගෝඨාභයගේ සහෝදර එවක ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පිහිටුවන ලද ජනාධිපති කොමිසමක් මාතලේ මහේස්ත්‍රාත් පරීක්ෂණයට සමාන්තරව ක්‍රියාත්මක විය. කාබන් කාල නිර්ණය සඳහා ශේෂයන් විදේශයකට යැවීමට ජනාධිපති කොමිසම කටයුතු කළ අතර, එයින් ලද ප්‍රතිඵලය ශ්‍රී ලංකාවේ වෝහාරික විශේෂඥයන්ගේ නිගමනවලට පරස්පර විය. ශේෂයන් 1950ට පෙර වකවානුවකට අයත් යැයි විදේශීය නිගමනය (වධහිංසාවේ සහ ඝාතනයේ ලකුණු ශේෂයන්ගේ දකින්නට ඇති බවත් වාර්තාවේ දැක්වුනත්) වූ අතර, දේශීය නිගමනය වූයේ ඒවා 80 දශකයේ අග භාගයට අයත් බවයි. 80 දශකය අග භාගයේ මාතලේ දිස්ත්‍රික්කය භාරව සිටි නිලධාරීන්ගේ වගඋත්තරදායකත්වය සහතික කිරීමට අසමත් වීම ගැන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම ඇතුළු එජා විශේෂ පටිපාටි ආයතන හතරක් 2023 ජනවාරියේදී ආණ්ඩුවට ලියා දැන්වීය.

ශ්‍රී ලංකාවේ සැබෑ වෝහාරික ධාරිතාව සීමිත වන අතර, කවර කැනීමකින් හෝ හමුවන දෑ පරීක්ෂණ සඳහා පිටරට යැවිය යුතුව තිබේ. වෙනත් රටවල් හා සංසන්දනය කරන කල, ශ්‍රී ලංකාවේ වෝහාරික විශේෂඥයන් විසින් ස්වකීය වාර්තා මහේස්ත්‍රාත්වරුන්ට ලබාදීම සෑහෙන කල්ගතවන ක්‍රියාවක් වී පවතී. උදාහරණයකට ගතහොත්, මන්නාරමේ සතොස පරිශ්‍රයේ කැනීම් සම්බන්ධ වෝහාරික වාර්තාව 2019 ජූනි 30 දා භාරදීමට නියමිතව තිබුනත්, 2023 මැයි වන විටත් එය ලැබී තිබුනේ නැත. ප්‍රමාදයට හේතුව ලෙස දක්වා තිබුනේ කැනීමෙන් ගොඩගන්නා ලද ඇතැම් බඩු බාහිරාදිය විමර්ශන කණ්ඩායමට ලබාදී නැත යන්නයි. කෙසේවෙතත්, ප්‍රමාදයට දක්වන හේතු දෙස මේ කැනීම් මැනවින් නිරීක්ෂණය කරන්නන් බලන්නේ සැකයෙනි.

කැනීම් සන්දර්භයෙහි ලා ගත් කල, සැකකරුවන් අත් අඩංගුවට ගන්නා ලද දුර්ලභ අවස්ථාවලදී, ඔවුන්ට ඇප ලබා නිදහස්ව යාමට ඉඩ සැලසීම හෝ කල්ගිය ක්‍රියා පටිපාටීන්ට ප්‍රමුඛතාව දීමට මැලිවීම හෝ ඔස්සේ නඩු ඉවත ලෑමේ තීන්දු ගැනීමට මුල් වී ඇත්තේ නීතිපති කාර්යාලයයි. උදාහරණයක් ලෙස ගතහොත්, යාපනය දිස්ත්‍රික්කයේ චෙම්මනි හි සමූහ මිනීවළවල් කනින ලද අවස්ථාවේ පංච පුද්ගල කමිටුවක් විසින් ආරක්ෂක හමුදාවල 15 දෙනකු වගකිව යුත්තන් ලෙස හඳුනා ගන්නා ලද අතර යුද හමුදා නිලධාරීන් හතර දෙනකු අත් අඩංගුවට ගන්නා ලදී. එහෙත් කමිටු වාර්තාව කිසිදාක ප්‍රසිද්ධියට පත් කෙරුනේ නැත. ඒ වෙනුවට සිද්ධ වූයේ නීතිපති කාර්යාලයේ එවක ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥයා වූ මොහාන් පීරිස්ගේ අණින් 2000 ජූලියේදී සැකකරුවන් ඇප පිට නිදහස ලැබීමයි. හතර දෙනාටම පසුව උසස්වීම් දෙන ලදී.

එයාකාරයෙන්ම, 1995 දී නීතිපති කාර්යාලය අධිකරණයේ පෙනී සිටීමට අසමත් වූ අවස්ථාවක කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් කළේ බොල්ගොඩ වැවේ සහ කොළඹ අසල තවත් ජලාශවල පාවෙමින් තිබූ මළ සිරුරු 21ක් සම්බන්ධයෙන් ඝාතනයට සැකපිට චෝදනා නැගුනු විශේෂ කාර්ය සාධක බලකායේ නිලධාරීන් තුන් දෙනකුට එරෙහි නඩුව ඉවත දැමීමයි. නීතිපති කාර්යාලය නොපැමිණීම යුක්තියට අවහිර කිරීමක් ලෙස මහේස්ත්‍රාත් විසින් පවසන ලදී. ඔවුන්ට එරෙහිව ප්‍රමාණවත් සාක්ෂි නැතැයි පසුව තීරණය කළ නීතිපති කාර්යාලය ඒ වෙනුවට විනය පියවර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණි.

සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ පුනරාවර්තනය නොවීම සහතික කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා 2019 ශ්‍රී ලංකාවේ සංචාරයක් අවසානයේ **'ශ්‍රී ලංකාව වැනි මැදි ආදායම් රටවල එවැනි ප්‍රශ්න ඇතිවීම අසාමාන්‍යයැ'** යි ප්‍රකාශ කරමින් මෙසේද සඳහන් කළේය:

'සංස්ථාපිත අපරාධ - වෙනත් වචනවලින් කියතොත් ජාතන්තර මානව හිමිකම් හෝ ජාත්‍යන්තර මානුෂික නීතිය මහා පරිමානයෙන් උල්ලංඝනයට සහ කෙලෙසීමට මග පාදන ආකාරයෙන් ක්‍රමානුකූලව සහ සම්බන්ධීකරණයෙන් යුතුව රාජ්‍ය ආයතන සම්බන්ධ වන අපරාධ - විමර්ශනය කොට නඩු පැවරීම සඳහා තමන් සතු අල්ප විශේෂඥතාව ශ්‍රී ලංකාව විසින් වහාම වැඩිදියුණු කරගත යුතු ය. විමර්ශනයේ, වෝහාරික විද්‍යාවේ සහ අභිචෝදක උපායමාර්ග සැලසුම් කරගැනීමේ විශේෂඥතාව මීට ඇතුළත් වනු ඇත. සංස්ථාපිත අපරාධවලට අදාළ අධිකරණමය ධාරිතා වැඩිදියුණු කිරීම හදිසි කටයුත්තක් හෙයින් එයද එපමණටම අවශ්‍ය වෙයි.'

**මේ වාර්තාවේ කර්තෘත්වය දරන සංවිධාන ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට කරන ප්‍රධාන නිර්දේශ පහත දැක්වේ:**

1. සමූහ මිනීවළවල් කළමනාකරණය සහ කැනීම් සම්බන්ධයෙන් විශේෂිත නීතියක් සහ ප්‍රතිපත්තියක් පැනවිය යුතු ය. ශේෂයන් හඳුනාගැනීම, සංරක්ෂණය හා කාල නියමයකින් තොරව විමර්ශනය කිරීම ඊට ඇතුළත් විය යුතුය. සොහොන් බිම්වලින් හෝ පසින් ගොඩගන්නා ලද අස්ථි කොටස් සුරක්ෂිතව ගබඩා කිරීමද සංරක්ෂණයට ඇතුළත් විය යුතු අතර භාරකාරත්ව දාමය නොකැඩී පවත්වාගෙන යාමට වගබලා ගත යුතුය;

2. සමූහ මිනීවළවල් සඳහා යෝජිත නීති රාමුව, ප්‍රතිපත්තිය සහ සම්මත ක්‍රියා පටිපාටීන් සම්බන්ධයෙන් එක්සත් ජාතීන් සහ වෙනත් ජාත්‍යන්තර විශේෂඥයන්ද ඇතුලත් කොටගත් පාරදෘශ්‍ය ප්‍රවිචාරණ ක්‍රියාදාමයක් පවත්වා සම්මත ක්‍රියා පටිපාටීන් ද ඇතුළුව කවර හෝ රාමුවක් හෝ ප්‍රතිපත්තියක් හෝ වේවා, මිනසෝටා සහ බෝර්න්මත් මූලපත්‍රවල (Minnesota and Bournemouth Protocols) අදාළ ප්‍රතිපාදන මුළුමනින්ම අන්තර්ගත කරගන්නා බව සහතික කළ යුතු ය;

3. සමූහ මිනීවළවල්වලට අදාළ වීම ද ඇතුළත්ව, රටේ වෝහාරික ධාරිතාව ශක්තිමත් කළ යුතු ය. අවශ්‍ය කරන නිපුනතාව තිබෙනා තුරු සියලු කැනීම් කටයුතුවලින් වැළකී සිටීමට අතුරුදහන් වීම් පිළිබඳ ජනාධිපති කොමිසම විසින් කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කොට, DNA හඳුනාගැනීම්, පරිගණක ආශ්‍රයෙන් මුහුණු ප්‍රතිනිර්මාණය සහ හඳුනාගැනීම, වීඩියෝ අධිස්ථාපනය සහ මානවමිතික විශ්ලේෂණය ඇතුළුව ව්‍යාධිවේදීන් සහ වෙනත් විද්‍යාඥයන් පුහුණු කිරීම සඳහා මානව අනන්‍යකාරක මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතුය;

4. නීතිපති කාර්යාලය ප්‍රතිව්‍යුහගත කොට, කැනීම්වල ප්‍රතිපලයක් ලෙසින් කෙරෙන නඩු පැවරීම් ස්වාධීන සහ අපක්ෂපාතී ආකාරයෙන් සිදුවීම සහතික කිරීම සඳහා ස්වාධීන මහජන අභිචෝදක සේවාවක් නිර්මාණය කිරීම;

**වඩාත් නිශ්චිතවම යට දැක්වෙන පියවර ගන්නා ලෙස සංවිධාන සමූහය අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් සහ ජාත්‍යන්තර ප්‍රජාවෙන් (විශේෂයෙන්ම ජාත්‍යන්තර රතු කුරුස කමිටුවෙන් (ICRC) සහ අතුරුදහන් තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසමෙන් (ICMP) ඉල්ලා සිටී:**

1. තිබිය හැකි වෙනත් සමූහ මිනීවළවල් ඇති ස්ථාන සම්බන්ධයෙන් විභාග කිරීම සඳහා වෘත්තීය නිපුනතාව සහිත විශේෂඥ ඒකකයක් ස්ථාපිත කොට ඔවුන්ගේ වෝහාරික ධාරිතාව සවිබල ගන්වා, එම ඒකකයට DNA පරීක්ෂණ පැවැත්වීම ඇතුළු පරීක්ෂණ සඳහා ප්‍රමාණවත් සම්පත් ලබාදීම සහතික කළ යුතු ය.

2. සමූහ මිනීවළවල් තිබීමේ විභවයක් ඇති සියලුරුම ස්ථාන අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව පරීක්ෂා කොට, ඒවායේ ආරක්ෂාව සහතික කිරීම පිණිස බෝර්න්මත් මූලපත්‍රයේ දක්වා ඇති මානයන්ට අනුකූලව දත්ත ගබඩාවක් පිහිටුවිය යුතු ය.

3. ධූර කාලයේ ආරක්ෂිත බව, සේවා කොන්දේසි, කාර්ය මණ්ඩල පරිපාලනය සහ උසස්වීම් සහ සේවයෙන් පහ කිරීම් මෙන්ම ජාත්‍යන්තර අපරාධ සම්බන්ධ පුහුණුව ද ඇතුළත්ව අධිකරණයේ ස්වාධීනත්වය ශක්තිමත් කළ යුතු ය.

# ඇතුළත

හැඳින්වීම........................................................................ 8

1. ජාත්‍යන්තර හා ජාතික නීති රාමුව .................................................. 11
1.1 ජාත්‍යන්තර ප්‍රමිතීන් .................................................. 11
අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය...................... 12
අදාළ ජාත්‍යන්තර අපරාධ නීතිය.............................. 14
අදාළ ව්‍යවහාරික ජාත්‍යන්තර මානුෂවාදී නීතිය............ 14

1.2 ශ්‍රී ලංකාවේ ජාතික නීති................................................. 16

2. නැවත නැවතත් කැනීම් අසාර්ථකයි............................................. 22
2.1 ඥාතීන්ගේ සහභාගිත්වය සහ ඔවුන්ගේ ආරක්ෂාව............ 23
අතුරුදහන් වූවන්ගේ ඥාතීන් හෝ
ඔවුන්ගේ නීතිඥයන්ට හෝ තහංචි දැමීම................... 23
මහජන සහාය ලබාගැනීමට මහේස්ත්‍රාත් දුන් නියෝග
නොතකා හැරීම, මහේස්ත්‍රාත් මාරු කර යැවීම............ 24
ඥාතීන් හා පවත්වන සම්මුඛ පරීක්ෂණ ප්‍රමාණවත්
නොවීම හෝ කිසිම සම්මුඛ පරීක්ෂණයක් නොතැබීම.... 24
පූර්ව මරණ දත්ත නොමැතිවීම නිසා
ශේෂයන් හඳුනා ගැනීමේ ඉඩ ප්‍රස්තාව අඩුවීම............. 24
මනෝ සමාජීය සහාය මඳ වීම................................ 25
හඳුනාගැනීමේ සහ ශේෂයන් ආපසු බාර දීමේ දෝෂය... 25

2.2 උපයෝගී කරගත හැකි නෛතික, ප්‍රතිපත්තිමය හා
මෙහෙයුම් රාමුවෙහි ව්‍යාකූලතාව............................. 26
ජීවතුන් අතර සිටින සාක්ෂිකරුවන් හඳුනා නොගැනීම... 27
පාරදෘශ්‍යභාවයේ ඌනතාව.................................... 28

2.3 දේශපාලන අත පෙවීම්................................................ 29

2.4 සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව හා පරිශ්‍ර කළමනාකරණය....... 31
අසම්පූර්ණ කැනීම්................................................ 32

2.5 මාරුකිරීම් මැරිගෝ රවුම............................................ 32

2.6 තාක්ෂණික ශිල්ප ඥානය.............................................. 35

2.7 සම්පත් සීමා කිරීම...................................................... 38

2.8 නීතිපති කාර්යාලයේ භූමිකාව....................................... 39

3. නිගමන සහ නිර්දේශ.................................................................. 41

3.1. අතීත මෘතදේහ ගොඩගැනීම්
ප්‍රතිස්ථාපනය සඳහා නිර්දේශ.............................................. 43

3.2. ඉදිරියේදී මෘතදේහ ගොඩගැනීම් සඳහා OMP වෙත සහ
ICRC හා ICMP ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව වෙත නිර්දේශ........ 46

ඇමිණුම ......................................................................... 47

සමාප්ත සටහන්............................................................ 59

"මාතලේ අතුරුදහන් වුවන්ගේ ඥාතීන් එක්ක කවුරුත් කතා කරලා නෑ. කැනීම්වලින් අපේක්ෂාවන් ඉහලට එසවුණේ නැවත බිමට ඇද දමන්නට පමණයි; මොකද, නඩුව දැන් ආයෙත් ගල්වෙලා. අපි මේක වෙන තැන්වලදිත් දැකපු දෙයක්."[1]

# හැඳින්වීම

1983 සහ 2009 අතර සිදුවූ බලහත්කාර අතුරුදහන් කිරීම්වල දස දහස් සංඛ්‍යාත වින්දිතයන්ගේ සිරුරු රැගත් සමූහ මිනීවළවල් දහස් ගණනක් නොවෙතොත්, නිශ්චිත වශයෙන්ම සිය ගණනක් ශ්‍රී ලංකා දෙරණ පුරා විසිරී පවතී.[2] මේ තාක් දුරට කැනීම් සිදුකර ඇත්තේ විස්සක් පමණ වූ සංඛ්‍යාවකය. දකුණේ කනින ලද ඒවා අනාවරණය කරන්නේ පුළුල් ලෙස පැතිරුණු මානව හිමිකම් උල්ලංඝනයවීම් ය. විශේෂයෙන්ම, කුරිරු ලෙස තලා දමන ලද ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ කැරලිකරුවන්ට එරෙහිව රජයේ හමුදා විසින් 1987 හා 1990 අතර කාලය තුළදී සිදුකරන ලද බලහත්කාරී අතුරුදහන් කිරීම් ය. උතුරු නැගෙනහිර කනින ලද අනෙක්වා රුදු ලෙස සිහිපත් කර දෙන්නේ දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය (LTTE) සමග 1983 සිට 2009 දක්වා සන්නද්ධ ගැටුමක නිරතව සිටියදී ආරක්ෂක අංශ විසින් කරන ලද පුළුල්ව පැතිරුණු සංස්ථාපිත මානව හිමිකම් උල්ලංඝන කිරීම් ය. මඩකළපුව දිස්ත්‍රික්කයේ කලුවන්චිකුඩියේ වැනි වෙනත් සමූහ මිනී වළවල්වල ඇත්තේ LTTEය විසින් ඝාතනය කරන ලද පුද්ගලයන්ගේ තවමත් ගොඩ නොගත් ශේෂයන් ය.

මේ තාක් කැනීම් බොහොමයක් සඳහා බලධාරීන්ට බලකෙරී ඇත්තේ 2013 මාතලේදී[3] හා 2018 දී මන්නාරමේදී සිදු වූවාක් මෙන්, ඉදිකිරීම් කටයුතුවලදී සමූහ මිනීවළවල් පිහිටි ස්ථාන අහම්බෙන් හෙළිවූ විටදී ය. එසේත් නැතිනම්, 1999 දී යාපනයේ දිස්ත්‍රික්කයේ චෙම්මනිහිදී[4] සිදුවූ ආකාරයට ආරක්ෂක අංශ සාමාජිකයන් විසින් දෙන ලද තොරතුරු පදනම් කරගෙන ය. ඒ සෑම කැනීමක්ම තම ආදරණීයයන් හමුවෙතියි යන බලාපොරොත්තුව ඥාතීන් තුළ දල්වාලීය. ඔවුන් අතුරුදහන් කළවුන් යුක්තිය හමුවට ගෙන ඒම කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රාජ්‍යයේ පිළිවෙත නිසා මේ තාක් දුරට සහතික වී ඇත්තේ ඉතා සුළු දේහ ශේෂ ප්‍රමාණයක් හඳුනා ගැනීමට හැකිවීම පමණෙකි.

සිරුරු 155ක් ගොඩගනු ලැබූ මාතලේත්, 2013 හා 2018 ස්ථාන දෙකක පිලිවෙලින් සිරුරු 81ක් හා 318 ක් (ළමුන් 28ක්ද සමග) ගොඩගනු ලැබූ මන්නාරමේත් ඇතුළුව කැනීම්වල දෝෂ මේ වාර්තාවේ විශ්ලේෂණය කෙරේ. මානව හිමිකම් හා සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය (CHRD), අතුරුදහන්වූවන්ගේ පවුල් එකතුව (FoD), ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS) සහ සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) දන්නා තවත් කැනීම් පිළිබඳව මේ වාර්තාවේ ඇමුණුමේ දැකගන්නට පුළුවන. නීතිවිරෝධී ලෙස වළදැමූ ස්ථාන (චෙම්මනි වැනි), විවෘත සමූහ මිනීවළවල් (හෝකන්දර වැනි), වැව් සහ ගංගා වලින් හමුවූ සිරුරු (බොල්ගොඩ වැනි)[5] මෙන්ම අස්ථි ශේෂ තිබුණු සමූහ මිනී වළවල් සම්බන්ධයෙන් කෙරුණු කැනීම් සහ වෝහාරික පරීක්ෂණ ද ඒවාට ඇතුළත් වේ.

චෝදනා නැගෙන කේන්ද්‍රීය ජාත්‍යන්තර අපරාධ සහ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝන කවර කලෙක, කුමන ගැටුමකදී සිදු වුවද නොතකා, ඒ සම්බන්ධ වගඋත්තරදායකත්වය සහතික කරන්නට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අසමත් හෝ අකැමැති බවට කැනීම්වල බහුවිධ දෝෂයන් විසින් තවදුරටත් සාක්ෂි සපයයි.

උතුර නැගෙනහිර යුද්ධයේ අගභාගය වූ 2009 දී අතුරුදහන් කරන ලද හා ඝාතනය කරන ලද පුද්ගලයන්ගේද ඇතුළුව තවත් බොහෝ සමූහ මිනී වළවල් කනින්නට ඇතැයි අපේක්ෂා කළ හැකි බව පෙනී යන කරුණකි. පසුගිය කැනීම්වල දෝෂ මගහරවා සත්‍යය, යුක්තිය හා හානිපූරණය සඳහා ඥාතීන් සතු අයිතිය මුළුමනින්ම සපුරමින් ඉදිරි කැනීම් සිදුකිරීමට කාලය එළඹ තිබේ.[6]

# ශ්‍රී ලංකාවේ සමූහ සුසාන



# 1. ජාත්‍යන්තර හා ජාතික නීති රාමුව

## 1.1 ජාත්‍යන්තර ප්‍රමිතීන්

සමූහ මිනීවළක් යනු කුමක්දැයි ජාත්‍යන්තර නිර්වචනයක් නොමැති වීම සමූහ සුසාන සම්බන්ධයෙන් කටයුතු කරද්දී හමුවන එක් අභියෝගයක් වෙයි. එමෙන්ම, වළ දමා ඇති පුද්ගලයන්ගේ අවම සංඛ්‍යාවද ඇතුළත්ව සමූහ මිනීවළක ලක්ෂණ පිළිබඳව කිසිදු නෛතික සම්මුතියක් නැත. ඇතැමුන්ට අනුව සමූහ මිනීවළක එකට වල දමා ඇත්තේ පුද්ගලයන් හය දෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකි.[7] තවත් අයට අනුව එක් අයකුට වැඩියෙන් වළදමා ඇතිනම් එය සමූහ මිනීවළකි.[8] කෙසේවෙතත්, පුද්ගලයන් ගණනාවකගේ,[9] බොහෝවිට සම්මිශ්‍රනය වූ ශේෂයන් සහිත විවිධාකාර ජ්‍යාමිතික හැඩවලින් සංවිධිත, කොටස් කරන ලද, විචල්‍ය ඝනත්වයෙන් සිරුරු රැගත් අගලක්, වළක්," යනුවෙන් වෝහාරික විශේෂඥයන් විසින් සමූහ මිනීවළ නිර්වචනය කොට ඇත.[10]

බහිර් නීතික, ලඝු හෝ අත්තනෝමතික ඝාතන පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරිය ඇග්නස් කැලමා[11] විසින් මිනීවළවල් කැනීම සම්බන්ධ මාර්ගෝපදේශද ඇතුළත් 2016 සංශෝධිත බහිර් නීතික, අත්තනෝමතික සහ ලඝු ඝාතන සාර්ථක ලෙස වළක්වාලීම සහ විමර්ශනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ අත්පොත (නීතිවිරෝධීව සිදුවිය හැකි ඝාතන විමර්ශනය සඳහා වන මිනසෝටා මූලපත්‍රය (මිනසෝටා ප්‍රොටෝකෝලය - ලෙසද හැඳින්වේ)[12], සහ අතුරුදහන් තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසමේ සමූහ මිනීවළවල් ආරක්ෂා කිරීම සහ විමර්ශනය පිළිබඳ 2020 බෝර්න්මත් මූලපත්‍රය - බෝර්න්මත් විශ්ව විද්‍යාලය (බෝර්න්මත් ප්‍රොටෝකෝලය)[13] ඇසුරින් පහත දැක්වෙන නිර්වචනය නිර්දේශ කර ඇතඃ සමූහ මිනීවළක් යනු 'මරණය සිදුවූ ආකාරයේ සහ/හෝ සිරුරු බැහැර කිරීමේ ක්‍රමයේ නීත්‍යානුකූල භාවය සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුව ඇති සිරුරු වළ දමා තිබෙන ස්ථානයකි.[13] රාජ්‍යයේ සහ/හෝ රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ වගකීම් කුළු ගන්වන අවස්ථා දෙකක් වන භූමි කම්පාවක් හෝ සුනාමියක් වැනි ස්වාභාවික ආපදාවකට ප්‍රතිචාර වශයෙන් හෝ, වසංගතයකට ප්‍රතිචාර වශයෙන් හෝ ඇතිකරන සමූහ මිනීවළවල්ද ඇතුළත් කරගැනීමට මේ නිර්වචනය ඉඩ සලසයි. කැලමාට අනුව මරණයට හේතු සහ පසුබිම කවරක් වුවද, 'අවසාන හිමිකම්' සහ අවසන් වත් පිළිවෙත් උල්ලංඝනය කිරීම ඔස්සේ සමූහ මිනීවළවල් අනිකුත් සමූහ සුසානවලින් වෙන්කොට හඳුනා ගැනීමට මේ නිර්වචනය ඉඩ සලසයි.[16] එහි වෙන්කොට හඳුනාගත හැකි විශේෂ ලක්ෂණය වන්නේ මරණයේදීත්, ඉන් අනතුරුවත් දේහයන්ට දක්වා ඇති සැළකිල්ලයි. විශේෂයෙන්ම, ශේෂයන් මිහිදන් කර ඇත්තේද, ඒ කෙසේද යන්නද ඇතුලුව, ශේෂයන් පරිහරණය කර ඇති ආකාරයයි.

'වින්දිතයා' යනුවෙන් හැඳින්වෙන්නේ 'ශාරීරික හෝ මානසික ආතුර වීමට, චිත්ත පීඩාවට, ආර්ථික අලාභයට හෝ රාජ්‍යයේ බලපවත්නා අපරාධ නීති යටතේ උල්ලංඝනයක් සේ ගැනෙන පැහැර හැරීමේ ක්‍රියා මගින් හෝ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතල ලෙස උල්ලංඝනයෙන් හෝ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීමේ ක්‍රියා මගින් හෝ තමන්ගේ මූලික අයිතිවාසිකම් බරපතල ලෙස කෙලෙසනු ලැබීමට තනිව හෝ සාමූහිකව හෝ ගොදුරුවී පීඩා විඳි පුද්ගලයන්' ය.[17] ජාත්‍යන්තර නීතිය ප්‍රකාර සමූහ මිනීවළක හමුවූ පුද්ගලයන් ('ප්‍රාථමික' හෝ 'ඍජු' වින්දිතයන්) පමණක් නොව, ඔවුන්ගේ ඥාතීන්ද, අදාළ තත්හිදී ප්‍රජාවන්ද ('ද්විතීයික' හෝ 'වක්‍ර' වින්දිතයන්) වින්දිත යන නිර්වචනයට ඇතුළත් වෙයි. මේ වෙනස පදනම් කොට ගන්නේ නිශ්චිත සමූහ මිනීවළක් සම්බන්ධයෙන් පුද්ගලයකුගේ වින්දිතභාවයට අදාළව මතුවන

විවිධාකාර නෛතික රැකවරණයි.

සමූහ මිනීවළවල් සහ ජාත්‍යන්තර ගනයේ අපරාධ විය හැකි ඒවා ඇතුළුව බරපතල මානව හිමිකම් උල්ලංඝනවලින් ඍජු හා වක්‍ර වින්දිතයන් ට නිතැතින්ම ආරක්ෂාව සලසන නෛතික රාමු කිහිපයක්ම වෙයි. ඒ අනුව, ජාත්‍යන්තර නීතිය, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර අපරාධ නීතිය වෙන් වෙන්වද, යම් පමණකට අතිපිහිත වෙමින් ද සමූහ මිනීවළවල්වලට සහ ඒවා විමර්ශනයට ආරක්ෂාව සලසා දෙයි. වඩාත් තීරණාත්මක වන්නේ සමූහ මිනීවළවල්, ඒවායේ ඇති මානව ශේෂ හා තිබිය හැකි සාක්ෂි අපවේශනය නොකිරීමට, ජාත්‍යන්තර නීතිය ප්‍රකාර ශ්‍රී ලංකාව වගකීමෙන් බැඳී සිටීමයි. ඊටත් අමතරව, මෘතදේහ ගොඩගෙන, ඒවා හඳුනාගෙන හැකි සෑම අවස්ථාවකම ඒවා ඥාතීන්ට භාරදීමේ වගකීමක් පවතී. වැඩි දුරටත්, ශ්‍රී ලංකාවේ දේශීය නීති රාමුව න්‍යායික වශයෙන් නෛතික රැකවරණ සලසන්නකි.

## අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය

බරපතල මානව හිමිකම් උල්ලංඝනවල වින්දිතයන්ට සහ එයින් දිවි ගලවාගත්තවුන්ට සත්‍යය දැනගැනීමේ අයිතිය පාවිච්චි කිරීමට ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ අයිතියක් තිබේ. සත්‍යය දැනගැනීමේ අයිතිය අතීතයේදී මුලින්ම සම්බන්ධ වී තිබුනේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට[18] අදාළව පමණක් වුවත්, වධහිංසාව සහ බාහිර නීතික ඝාතන ඇතුළු වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝන ක්ෂේත්‍රවලටද සත්‍යය දැනගැනීමේ අයිතිය පැතිර ගොස් තිබේ. සමූහ මිනීවළවල්වලට අදාලව එය අතිශයින් වැදගත් වන්නේ සමීපතමයකුට කුමක් වීදැයි දැනගැනීම සඳහා වින්දිතයන්ට සහ ගැලවී ගත්තවුන්ට එමගින් නෛතික මංපෙතක් සලසා දෙන හෙයිනි.[19] දණ්ඩ මුක්තියට එරෙහිව සටන් වැදීම සඳහා වන ජොයිනේ/ ඔරෙන්ට්ලයිකර් මූලධර්ම[20] සහ එක්සත් ජාතීන්ගේ 2006 මූලික මූලධර්ම[21] බරපතල උල්ලංඝනවල[22] වින්දිතයන්ට නෛතික පිළියම් සාදා දීම සම්බන්ධයෙන් තීරණාත්මක වෙයි. එහෙයින්, තමන් පීඩාවට පත් කළ අපයෝජනයට හේතු සහ වාතාවරණය පිළිබඳ තොරතුරු සොයන පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සපුරා ලීම සඳහා විධික්‍රම සකස් කිරීමට රජය බැඳී සිටී. ප්‍රතිඵලය සමූහ මිනීවළවල් බවට පත්වූ බරපතල මානව හිමිකම් උල්ලංඝන ද මීට ඇතුළත් වෙයි. සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් පිළිතුරු දීමට වගකීමෙන් බැඳී සිටින රාජ්‍යයෙන් අපයෝජන විමර්ශනය කිරීම සහ සිදුවූයේ කුමක්ද, එය සිදුවූයේ ඇයිද යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම, ඊට ඍජුව හා වක්‍රව වගකිවයුත්තන් හඳුනාගැනීම, සහ අපයෝජනයේ රටාව[23] වටහා ගැනීම පිණිස, අඛණ්ඩව සහ ක්‍රමානුකූලව වීරිය දැරීම සඳහා ඵලදායී හා තිරසාර ක්‍රියාකාරීත්වයක් අවශ්‍ය වෙයි. මේ වගකීම් ඉෂ්ඨ කිරීම පිණිස රාජ්‍යය සතුව දේශපාලන අභිප්‍රායක් හෝ හැකියාවක් හෝ නැතිනම් සහාය දීමේ වගකීමක් ජාත්‍යන්තර ප්‍රජාව සතුව පවතී.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ (CED) 24 (4) වගන්තියේ ද සත්‍යය දැනගැනීමේ අයිතිය ඇතුළත් වේ. එමගින් බලහත්කාරී අතුරුදහන් කිරීම සිදුවූ වාතාවරණය, විමර්ශනයේ ප්‍රගතිය සහ ප්‍රතිඵල සහ අතුරුදහන් තැනැත්තාගේ ඉරණමට අදාළ සත්‍යය දැනගැනීමේ අයිතිය සෑම වින්දිතයකුටම සලසා දෙයි. මීට අදාළ නිසි පියවර ඒ ඒ රාජ්‍ය පාර්ශවය විසින් ගත යුතුය.[24] CED සම්මුතිය ශ්‍රී ලංකාව විසින් 2016 දී අපරානුමත කරන ලදී.[25] ඒ අනුව ශ්‍රී ලංකාණ්ඩුව අතුරුදහන්වූවන්ගේ ඥාතීන් ඇතුළු ඕනෑම වින්දිතයකු සතු සත්‍යය දැනගැනීමේ අයිතිය සහතික කිරීමට බැඳී සිටින අතර අතුරුදහන්වූවන් සොයාබැලීමේ වගකීමක්ද උසුලයි.[26] එමෙන්ම මරණයක් සිදුවී ඇති විට ශේෂයන් සොයා, ගෞරව දක්වා, ආපසු භාරදී, මරණයට පත්වූවන්ගේ අනන්‍යතාව තහවුරු කළ යුතුය.[27]

තවද, බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් හෝ අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (WGEID) සත්‍යය දැනගැනීමේ අයිතිය ගැන සිය පොදු සඳහනේ පැහැදිලිව දක්වා ඇත්තේ 'අතුරුදහන් තැනැත්තන්ගේ ඉරණම හා ඔවුන් ඇත්තේ කොහිද යන්න පිළිබඳව දැනගැනීමට ඥාතීන් සතු අයිතිය කිසිදු සීමාවකට හෝ බාල කිරීමකට හෝ යටත් නැති පරම අයිතියකි' යනුවෙනි.

ඥාතීන්ට නීති විරෝධී ඝාතනවලට අදාළ විමර්ශනවලට දායකවීමට ඉඩකඩ සැලසීම, වාතාවරණය සම්බන්ධයෙන් තිබෙන තොරතුරු ලබාදීම සහතික කිරීම, මරණය සිදුවූ ආකාරය හා හේතු දැක්වීම, ශේෂයන් ඇති ස්ථාන දන්නේ නම් ඒවා පිළිබඳ දැනුවත් කිරීම පිණිස රාජ්‍යයන් සතු වගකීමක් තිබේ.[28]

මේ පසුබිමෙහි ලා ගත් කල, සමූහ මිනීවළවල් තිබෙන බව වසන් නොකිරීමේ හෝ ප්‍රතික්ෂේප නොකිරීමේ පූර්ණ වගකීමක් රාජ්‍යයන්ට ඇති බව ජාත්‍යන්තර නීති විශාරදයන් සඳහන් කර තිබේ. ඊට අමතරව, පරිශ්‍රයන්ට හානි පැමිණවීම හෝ ඒවා විනාශ කිරීම හෝ නොකළ යුතු අතර, සමූහ මිනීවළවල් ගැන සොයා බලන, ඒ ගැන කතා කරන පිරිස් තර්ජනයට, සිර දඬුවමට

හෝ නිහඬ කිරීමට ගොදුරු නොවිය යුතු ය. බලහත්කාරී අතුරුදහන් කරවීම්වලට එරෙහි තහනම, බිහිර් නීතික ඝාතන විමර්ශනය කිරීමේ වගකීම, සත්‍යය දැනගැනීමේ අයිතිය, මෙන්ම, සාමූහික සංස්කෘතික, ජාතික, වාර්ගික, ආගමික, දේශපාලනික හෝ වෙනත් අනන්‍යතාවක් මෙන්ම පුද්ගල අනන්‍යතාව යටපත් කිරීම හෝ මුලිනුපුටා දැමීම ඇතුළු බහුවිධ මානව හිමිකම් උල්ලංඝන ගණයට මේ ක්‍රියා ඇතුළත් වේ.[29]

සමූහ මිනීවළවලට දක්වන සැලකිල්ල හා ඒවා කළමනාකරණය සම්බන්ධයෙන් සියල්ලන් ඇතුලත් ප්‍රවිචාරණ කාර්යදාමයක් පදනම් කොටගෙන තීන්දු ගන්නා තාක් කල්, සමූහ සුසානවල සංරක්ෂණය හා ආරක්ෂාව සහතික කිරීමේ වගකීමෙන් ආණ්ඩු බැඳී සිටී.[30] සමූහ මිනීවළවල් ගැන මුලින්ම වාර්තා කෙරුණු හෝ අනාවරණය වූ විට ඒවාට ඇති සම්බන්ධය වසන් කිරීමට වීරිය කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පාත්‍රයා අතින් දැනුවත්ව එසේත් නැතිනම්, ස්වකීය සමීපතමයන්ගේ ශේෂයන් පිළිබඳ සාක්ෂි ළඟ තබා ගැනීමට අපේක්ෂා කරන ඥාතීන් අතින් නොදැනුවත්ව ඒවාට හානි සිදුවීමේ බරපතල අවදානමක් පවතී. එම හානිය කරණකොටගෙන ඉහත දැක්වුණු එක් එක් අයිතිවාසිකම් හා වගකීම් සපුරාලීම උගහට වනු ඇත. ඛාදනයෙන්, විනාශයෙන්, සංචලනයෙන් හා කොල්ලයෙන් සමූහ මිනීවළවල් ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩු කඩිනමින් පියවර ගත යුතුය.[31]

එසේ හෙයින්, සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ගෞරවනීය හා නීත්‍යානුකූල ලෙසින් කටයුතු කිරීමේදී අතුරුදහන්වූවන් සහ ආගිය තැනක් නැත්තවුන් පිළිබඳව විමර්ශනය, සොයාබැලීම හා ඔවුන් හඳුනාගැනීමට, සහ ශේෂයන් වේ නම් ඒවා ඥාතීන්ට භාරදීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. ළඟම ඥාතියාගේ විධිමත් පැමිණිල්ලක් හෝ ඉල්ලීමක් මත විමර්ශනයක් පදනම් විය යුතු නැත.[32] ඒ වෙනුවට සිදුවිය යුත්තේ එය නිතැතින්ම ආරම්භ වීමයි. ඊට අමතරව ආගමික හා සංස්කෘතික අයිතිවාසිකම් රකිමින්, වෙනස්කම් නොපා සිටීමට රාජ්‍යයට වගකීමක් ඇත. මියගියවුන් අයත් ආගමට අනුව යුද නීතිය යටතේ[33] පවත්නා තත්වයට අනුකූලව ඉඩ සැලසෙන වාතාවරණයක් යටතේ හෝ වෙනත් තත්වයන් යටතේ[34] වෙනත් ආකාරයෙන් හෝ වත් පිළිවෙත් සිදු කිරීමද ඊට ඇතුළත් ය. 'මානව වර්ගයාගේ අඳුරු කලාපයේ මතකයද අනාගත පරම්පරා වෙත ගෙනයාමේ'[35] අරමුණටද මෙය අදාළ ය.

මේ තාක් දුරට, සමූහ මිනීවළවල් පිළිබඳ ඉදිරි දර්ශනය බොහෝසෙයින් කේන්ද්‍රගත වී ඇත්තේ මෘත දේහ ගොඩ ගැනීම සහ ශේෂයන් හඳුනා ගැනීම කෙරෙහි ය. එවැනි ප්‍රවේශයක් තේරුම් ගත හැකි වුවත්, එය අතිශයින් පටු ය. ආකාරගත දණ්ඩනීය යුක්තියට වැඩි යමක් ප්‍රතිෂ්ඨාපන යුක්තිය විසින් ඉල්ලා සිටිනු ලැබේ. සිරුරු ගොඩ දැමීමක් නැති තැන වුව එය සලසා දිය හැකි අතර මතකයට අදාළ කරුණු ඇතුළු තවත් බොහෝ සැලකිල්ලට ගතයුතු දෑ හා පියවර ඒ සඳහා අවශ්‍ය වේ.

එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරිය මෙසේද සඳහන් කර ඇත:[36]

* සුනාමියක් හෝ වසංගතයක් හෝ වැනි ස්වාභාවික ව්‍යසනයක් වළක්වාලීමට හෝ එහි බලපෑම අවම කිරීමට හෝ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කිරීමට අසමත් වීම ඇතුළුව ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කිරීමට රාජ්‍යය අසමත් වීම මගින් බරපතල ලෙස මානව හිමිකම් සහ මානුෂීය නීති උල්ලංඝනය කිරීම පිළිබඳව සමූහ මිනීවළවල් සාක්ෂි දරයි;

* අවසාන සහ භූමදානවත් පිළිවෙත් සහ ශේෂයන් ගරුකටයුතු ලෙස පරිහරණය ඇතුළු 'අවසන් අයිතීන්' උල්ලංඝනයක් සමූහ මිනීවළවලින් සිදුකෙරෙන්නට ඉඩ ඇත. ඒවායේ ඇතුළත් පුද්ගලයන්ගේ අනන්‍යතාව සඟවා තබමින් එක් එක් වින්දිතයාට මරණයේදී හිමිවිය යුතු අනන්‍යතාවයේ අයිතියත්, තම සමීපතමයන්ගේ ඉරණම දැනගන්නට නොලැබීම මගින් වින්දිතයන්ගේ ඥාතීන්ගේ අයිතියත්, එමගින් උල්ලංඝනය කෙරේ;

* බොහෝවිට සැඟවී තිබෙන සමූහ මිනීවළවල් පසු කලෙක විනාශ කොට කෙලෙසනු ලැබිය හැකි අතර ඒ පිළිබඳව සඳහන් කිරීම පවා අපරාධයක් බවට හෝ අඩන්තේට්ටමට හේතුවක් බවට හෝ පත් කළ හැකි ය. මේ සියලු ක්‍රියා බලහත්කාර අතුරුදහන් කිරීම්වලට එරෙහි තහනමත්, බිහිර් නීතික ඝාතන විමර්ශනය කිරීමේ වගකීමත්, සත්‍යය දැනගැනීමට ඇති අයිතියත් උල්ලංඝනය කරන්නේ වෙයි.

* නීති විරෝධී ඝාතන සිදුවූ වාතාවරණයත්, මරණයට හේතුවත් මෙන්ම සිරුරු බැහැර කළ ආකාරයත් පිළිබඳ විමර්ශන පැවැත්වීමේ අවශ්‍යතාව සමූහ මිනීවළවල් විසින් යුක්තියුක්ත කෙරෙයි.

සමූහ මිනීවළවල් හමුවූ කල්හි දේහ ගොඩගැනීම, අපරාධය සිදුවූ ස්ථානය විමර්ශනය සහ සාක්ෂි එකතු කිරීම මගින් ඊට පෞද්ගලීභවනය සහ හඳුනාගැනීම සම්බන්ධ වන හෙයින්, රාජ්‍යයේත් වින්දිතයන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේත්, සමාජයේත් අරමුණු අතර තරගයක් පවතින බව විශේෂ නියෝජිතවරිය තම වාර්තාවේ

සඳහන් කර ඇත. ඊට ස්මරණයත්, අවසානයේදී (නැවත) මිහිදන් කිරීමත් ඇතුළත් වෙයි.

සමූහ මිනීවළවල් අනාවරණය වීමෙන් සිරුරු ගොඩ ගැනීමේ ගැටලුවද මතු වේ. ඵලදායී සහ ගෞරවනීය දේහ ගොඩලෑමකට ගැලපෙන කොන්දේසි පරිපූර්ණ වූ විට, එම ක්‍රියාවලිය නිසියාකාරව සිදු කෙරෙතොත්, රාජ්‍යයේ මානව හිමිකම් වගකීම් සම්බන්ධයෙන් එය ප්‍රබල දායකත්වයක් සපයනු ඇත. කෙසේ වෙතත්, විශේෂයෙන් අපරාධකරුවන් සහ වින්දිතයන් ජීවතුන් අතර සිටින විටත්, අපරාධ චූදිතයන් දැනටමත් රඳවා සිටින විටත් මිනීවළවල් අවුස්සන්නේ නැතිව යුක්තිය පසිඳ ලීමේ වෙනත් ක්‍රම තිබේ. එමනිසා, පුද්ගල තොරතුරු සුරක්ෂිතව තබාගැනීමේත්, ගෞරවනීය ලෙස නැවත මිහිදන් කිරීමේත්[37] ධාරිතාව ඇතිකර ගන්නා තාක් කල්, ගොඩලෑම් සිදු නොකළ යුතුය. එයින් අදහස් වන්නේ මානව ශේෂයන් ගබඩා කිරීමට, භාරකාර දාමය සුරක්ෂිතව තබා ගැනීමට සහ නිසියාකාර වෝහාරික පරීක්ෂණ පැවැත්වීමට හැකියාවක් නොමැති නම්, රාජ්‍යය විසින් මිනීවළවල් ගොඩ ගැනීම නොකළ යුතු බවයි.

විමර්ශන හා බලහත්කාර අතුරුදහන් කිරීම්වලට අදාළ ඒවා හැරුනුකොට, වින්දිතයන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ ස්වකීය භූමි ප්‍රදේශයේ සමූහ මිනීවළවල් කළමනාකරණය සම්බන්ධයෙන් පහත දැක්වෙන අයිතිවාසිකම්[38] ඵලදායී ලෙස සාක්ෂාත් කිරීමේ වගකීමක් ද රාජ්‍යය සතුව ඇත.

**ජීවත්වීමේ අයිතිය,**

- බලහත්කාරී අතුරුදහන් කිරීම් හා ඈඳුණු අයිතිවාසිකම්ඃ නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීම, පුද්ගලයාගේ නිදහස සහ ආරක්ෂාවට ඇති අයිතිය, වධහිංසාවට සහ වෙනත් කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට හෝ දඬුවම්වලට ලක් නොවීමේ අයිතිය,

- මළවුන්ගේ ඥාතීන්ට බොහෝ සෙයින් සම්බන්ධ, මරණයේදී දේහයට ගෞරවනීය ලෙස සැළකීම හා බැඳුනු 'අවසන් හිමිකම්' සහ සිවිල්, සංස්කෘතික හා ආගමික අයිතීන්.[39]

**එසේ හෙයින්, වින්දිතයන්ද, ඔවුන්ගේ ඥාතීන්ද, පුළුල් වශයෙන් සමාජයද පහත දැක්වෙන අයිතිවාසිකම් සඳහා සුදුසුකම් ලබතිඃ**

- විමර්ශනයක් සඳහා වන අයිතිය
- පිළියමක් සහ හානිපූරණයක් සඳහා අයිතිය[40]
- ශිෂ්ට සම්පන්න ලෙස සැලකිලි ලැබීමේ අයිතිය
- ඇදහීමේ සහ විශ්වාසයේ නිදහස භුක්ති විඳීමේ අයිතිය
- රැස්වීමේ සහ ප්‍රකාශනයේ නිදහස සඳහා අයිතිය
- සංස්කෘතික ජීවිතයකට සහභාගී වීමේ අයිතිය[41]

මෙකී අයිතීන්ගේ සමුච්චිත බලයෙන් සංස්ථාපනය වන්නේ සත්‍යය දැනගැනීමේ අයිතියයි. ඥාතීන්ට හා සමාජයට ලැබිය යුතුව තිබෙන එයට අතීත සිදුවීම් පිළිබඳ සත්‍යය දැනගැනීමේ 'අනුල්ලංඝනීය අයිතිය'ත්, මතකය සංරක්ෂණය කිරීමේ යුතුකමකුත්, දැනගැනීම සඳහා වින්දිතයකු සතු අයිතියත් අඩංගු වෙයි.[42] 'කරුණු තහවුරු කරගැනීම සහ පූර්ණ සත්‍යය ප්‍රසිද්ධියට පත් කිරීම' ද හානිපූරණ අයිතියේ කේන්ද්‍රීය සංඝටකයක් වෙයි.[43]

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය (CED) ප්‍රකාර; බලහත්කාර අතුරුදහන් කිරීමක් සිදුකරන, ඊට අණදෙන, එය සිදු කිරීමට පොළඹවන, හෝ සිදු කිරීමට උත්සාහ කරන හෝ එම අපරාධයට සහාය වන හෝ හවුල්වන හෝ කිසියම් පුද්ගලයකු[44] හෝ, 'තමන්ගේ අධිකාරිය හා පාලනය යටතේ ඉන්නා කණිෂ්ඨයන් බලහත්කාරී අතුරුදහන් කිරීමේ අපරාධයක් කළ හෝ කරන්නට යන බව දැන සිටි හෝ ඒ බවට ලැබුණු පැහැදිලි තොරතුරු නොතකා හැරියාවූ හෝ කිසියම් ප්‍රධානියකු වුව' සාපරාධී වගකීමෙන් බැඳ තැබීම රාජ්‍යයන් විසින් කළ යුතුව ඇත.

**අදාළ ජාත්‍යන්තර අපරාධ නීතිය**

සමූහ මිනීවළවල්, ඒ සම්බන්ධ සාක්ෂි සහ ඒවායේ අඩංගු දෑට ඇඟිලි ගැසීම ජාත්‍යන්තර අපරාධ නීතිය යටතේ තහනම් ක්‍රියා විය හැකිය. ශ්‍රී ලංකාව වැනි අභ්‍යන්තර යුද ගැටුමක් තිබෙන විට යුද අපරාධ හා මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධ යන දෙකම වලංගු වේ. පසුව සඳහන් දෑ සාමකාමී සමයක ද සිදුවන්නට පුළුවන. මේ සන්දර්භයෙහිලා ගත් කල, පහත දැක්වෙන මානව වර්ගයාට එරෙහි අපරාධ පාදක ක්‍රියා ද අදාළ වෙයිඃ

- මිනීමැරීම
- වධහිංසාව
- දූෂණය සහ වෙනත් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩතා
- හඳුනාගත හැකි කණ්ඩායමකට හෝ සාමූහිකයකට එරෙහි හිංසනය
- ශරීරයට හෝ මානසික හෝ ශාරීරික සෞඛ්‍යයට බරපතල පීඩා හෝ තුවාල සිදු කරන අරමුණින් ඒ හා සමාන අමානුෂික ක්‍රියා කිරීම

පහත දැක්වෙන යුද අපරාධ පාදක කොටගත් ක්‍රියා ද ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී අදාළ වන්නට පුළුවනඃ

- මිනීමැරීම

■ අංග ඡේදනය
■ කෲර ලෙස සැලකීම
■ වධහිංසාව
■ පුද්ගලික ගරුත්වයට එරෙහි සැහැසි කම්

### අදාළ ව්‍යවහාරික ජාත්‍යන්තර මානුෂවාදී නීතිය

ව්‍යවහාරික ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සම්බන්ධයෙන් ගත්කල, 'ව්‍යවහාරික ජාත්‍යන්තර මානුෂීය නීතිය (CIHL) අධ්‍යයනය'[45] යන හිසින් යුත් 2006 දී කරන ලද අධ්‍යයනයක් ජාත්‍යන්තර මෙන්ම අභ්‍යන්තර යුද ගැටුම් යන දෙකෙහිදීම මළවුන්, සුසානභූමි, සහ ආගිය අතක් නැති පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා සම්පාදනය කළ අංගසම්පූර්ණ ප්‍රතිපාදන සංක්ෂිප්ත කොට දක්වයි.[46]

තවද, මළවුන් සොයා ඔවුන්ගේ ශේෂයන් ගොඩ ගැනීමේදී ජිනීවා සම්මුතියේ පාර්ශවකරුවන් විසින් ඉටුකළ යුතු වගකීම්වල සවිස්තර ප්‍රමිතීන් ජාත්‍යන්තර මානුෂීය නීතියේ භාරකාරත්වය ලෙසින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් සම්පාදනය කර තිබේ.[47]

මේ වගකීම් ඉෂ්ඨ කිරීමට දේශපාලන අභිප්‍රායක් හෝ හැකියාවක් හෝ රාජ්‍යයන්ට නැති තැන, සහාය වීමේ වගකීමක් ICRC හෝ ICMP ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව සතුව ඇත. සමූහ මිනීවළවල් නිසියාකාර විමර්ශනය කොට ආගිය අතක් නැත්තවුන් සොයා ගැනීමට උපකාරී වීම සඳහා[48] 'චෝහාරික මානව විද්‍යාව හා පුරාවිද්‍යාව විශේෂ කොටගත් චෝහාරික ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර තාක්ෂණික සහාය' ශ්‍රී ලංකාවට ලබාදීමේ අවශ්‍යතාව මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් සෙයිඩ් රාද් අල් හුසේන් විසින් 2015 සැප්තැම්බරයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයට ඉදිරිපත් කළ වාර්තාවෙන් අවධාරණය කරන ලදී.

මෙය ප්‍රධාන ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ ඉතා කෙටි සාරාංශයකි. මේ තාක් ශ්‍රී ලංකාවේ කරන ලද මෘතදේහ ගොඩලැම්වල දෝෂ දෙවැනි පරිච්ඡේදයෙන් විභාග කෙරෙනු ඇත. එහිදී ප්‍රධාන වශයෙන් ඇසුරු කරගනු ලබන්නේ මිනීවළවල් කැනීම පිළිබඳ මාර්ගෝපදේශ රැගත් මිනසෝටා මූලපත්‍රය සහ සමූහ මිනීවළවල් සංරක්ෂණය සහ විමර්ශනය පිළිබඳ බෝර්න්මත් මූලපත්‍රය යි.[49]

## 1.2 ශ්‍රී ලංකාවේ ජාතික නීති

අදාළ දේශීය නීති රාමු බොහොමයක් විද්‍යාමාන වූයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ යටතේ 2015 සිට 2019 දක්වා පැවති යහපාලන ආණ්ඩු සමයේ ය. ඉහත සඳහන් කළ පරිදි එම ආණ්ඩුව විසින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අපරානුමත කරන ලදී.

ශ්‍රී ලංකාවේ වගඋත්තරදායකත්වය සහ ප්‍රතිසන්ධානය තගා සිටුවීම සඳහා ගතයුතු අධිකරණමය හා අධිකරණමය නොවන පියවර පිළිබඳවත්, මානව හිමිකම් සුරැකීමටත්, ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ ආධිපත්‍යයේ ශක්තිමත් කිරීම[50] සඳහාත් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කරන ලද විමර්ශන වාර්තාව පදනම් කොටගෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලය විසින් 2015 මාර්තුවේ සම්මත කරගන්නා ලද 30/1 යෝජනාවට ශ්‍රී ලංකාව ද හවුල්කාර අනුග්‍රාහකයෙක් විය.[51] එමෙන්ම, අලුතින් මිනීවළවල් හඳුනා ගැනීමට 'වෘත්තීය වශයෙන් නිපුන විශේෂඥ ඒකකයක්' පිහිටුවීමටත්, විමර්ශන අධීක්ෂණය කරන විනිශ්චයකරුවන්ට 'DNA පරීක්ෂණ, වෝහාරික මානව විද්‍යාව හා පුරාවිද්‍යාව' සම්බන්ධ විශේෂඥ සේවා ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් සම්පත් සලසාදීමටත් බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් හෝ අතුරුදහන් කිරීම් පිළිබඳ එජා ක්‍රියාකාරී කණ්ඩායම විසින් 2015 නොවැම්බරයේදී නිර්දේශ කරන ලදී.[52]

2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් 2018 මාර්තුවේදී බලාත්මක කරන ලදී.[53] එවිසින් සම්මුතියේ ප්‍රතිපාදන දේශීය නීතියට ඇතුළත් කරගන්නා ලද අතර විශේෂයෙන්ම, බලහත්කාරී අතුරුදහන් කිරීම් තහනම් කරන ලදී. කිසියම් රාජ්‍ය නිලධාරියකු හෝ ඔවුන්ගේ ප්‍රධානියකු හෝ වේවා අතුරුදහන්වීමක් සම්බන්ධයෙන් වරදකරු බවට පත්වූ විට අවුරුදු 20 කට නොවැඩි සිර දඬුවමක් සහ රුපියල් දස ලක්ෂයක දඩයකට යටත් කෙරේ. ඊට අමතරව ඔවුන් රුපියල් දස ලක්ෂය දකවා වූ වන්දි මුදලක් වින්දිතයාට ගෙවිය යුතුය.[54] බලහත්කාරී අතුරුදහන් කිරීම් මානව වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස පිළිගැනීමට[55] එය විශේෂයෙන්ම අසමත් වී ඇති ආකාරය ඇතුළුව එම පනත මගින් බලහත්කාරී අතුරුදහන් කිරීම් සාපරාධී කටයුත්තක් බවට ප්‍රමාණවත් ලෙස පත් කර නැති බව ජාත්‍යන්තර හා දේශීය සංවිධාන විසින් පෙන්වා දී ඇත.

බලහත්කාරී අතුරුදහන් කිරීම් යනු, ක්ෂමා, මුක්ති හෝ සීමාකාරී නීති හෝ වලංගු නොවන අඛණ්ඩව සිදුවෙමින් පවතින අපරාධයක් ලෙස සලකනු ලබන බව සටහන් කරනු වටී.[56] ඒ අනුව, සිදුවෙමින් පවතින පුද්ගල අතුරුදහන් කිරීම් (උදාහරණයක් ලෙසින් මුලින්ම 1980 ගණන්වල හෝ 90 ගණන්වල අතුරුදහන් වූ) සම්බන්ධයෙන් පනත බලාත්මක වූ කාලයේ (2018 මාර්තු) සිට අද දක්වා පුද්ගලයන් වගඋත්තරදායකත්වයෙන් බැඳ තැබිය හැකි ය.[57]

සිදු කෙරෙමින් පැවති මෘතදේහ ගොඩලෑම් කිහිපයක්ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වූ 2019 නොවැම්බර් මාසයෙන් පසු නවතා දමන ලදී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ යෝජනා අංක 30/1 පුළුල් සන්දර්භයට අදාළව එක්සත් ජාතීන් සමග ශ්‍රී ලංකාව පවත්වාගෙන ගිය සීමිත සහයෝගිතාව ද හමාර කරන ලදී.[58] 30/1 යෝජනාවේ කොන්දේසි ප්‍රකාර දණ්ඩ මුක්තිය සම්බන්ධයෙන් පියවර ගැනීමට දුන් පොරොන්දු ඉෂ්ඨ කිරීමට ද අසමත් වූ ශ්‍රී ලංකාව ඒ වෙනුවට බැහැර කිරීමේ ආඛ්‍යානයක් සහ

එක්සත් ජාතීන්ගේ ආයතන විසින් අනාවරණය කරගන්නා ලද දැට නිග්‍රහ කිරීමක් දිගටම පවත්වාගෙන ගියේය.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය රාජ්‍යයන් විසින් ක්‍රියාත්මක කෙරෙන ආකාරය අධීක්ෂණය සඳහා පනවා ඇති එක්සත් ජාතීන්ගේ සම්මුති අධීක්ෂණ මණ්ඩලයට ශ්‍රී ලංකාව අද වනතුරු සිය මූලික වාර්තාව බාර දී නැත. මේ වාර්තාව ලබා දිය යුතුව තිබුනේ 2018 මැද දීය. ශ්‍රී ලංකාවේ අතුරුදහන් කිරීම් සම්බන්ධ ලියකියවිලි බාර ගැනීමට හා සළකා බැලීමට කමිටුව සතු නිපුණත්වය පිළිගැනීමටද ලංකාණ්ඩුව මේතාක් දුරට අසමත් වී ඇත.

ජාත්‍යන්තර බලපෑම නිසාම එක්සත් ජාතීන්ගේ විශේෂ පටිපාටීන් සමග ගනුදෙනු කිරීමට සිදුවූ යහපාලන ආණ්ඩුව ඔවුන්ට ශ්‍රී ලංකාවට පැමිණෙන සේ 2015 දෙසැම්බරයේදී විවෘත ආරාධනයක් කළේය. පස් වතාවක් ශ්‍රී ලංකාවට ගිය සත්‍යය, යුක්තිය, හානිපූරණය හා පුනරාවර්තනය නොවීම සහතික කිරීම පිළිබඳ විශේෂ නියෝජිතවරයා අංග සම්පූර්ණ සංක්‍රාන්ති යුක්ති ප්‍රතිපත්තියක් සකසා ගැනීම සඳහා සවිස්තර නිර්දේශ ඉදිරිපත් කළත්, ඔහුගේ බොහෝ යෝජනා තවමත් ක්‍රියාත්මක වී නැත.[59] එජා මානව හිමිකම් මණ්ඩලයට 2021 අගෝස්තුවේ ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඔහු විසින් සඳහන් කරන ලද්දේ එවක බලයේ සිටි ආණ්ඩුව 'මානව හිමිකම් හා මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් එලදායි ලෙස විමර්ශනය කිරීමට, නඩු පැවරීමට සහ ඒවාට දඬුවම් දීම සම්බන්ධයෙන් ප්‍රගතියක් අත් කරගැනීමට මැලිකමක් හෝ නොහැකියාවක් හෝ විදහා දක්වන' බවයි. ඒ සන්දර්භය යටතේ ශ්‍රී ලංකාවේ බරපතල මානව හිමිකම් උල්ලංඝන හෝ ජාත්‍යන්තර මානුෂවාදී නීති බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වන අනාගත වගවීම් කාර්යාවලියක් සඳහා සාක්ෂි එක්රැස් කොට සංරක්ෂණය කිරීමත්, යුක්තිය සහ වගඋත්තරදායකත්වය ප්‍රදානය කරන්නේ කෙසේද යන්න[60] සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාවට නිර්දේශ කිරීමත් පිනිස මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) යටතේ ශ්‍රී ලංකා වගඋත්තරදායක ව්‍යාපෘතිය (OSLAP)[61] ස්ථාපිත කිරීම ඔහුගේ ප්‍රසාදයට ලක්විය.

බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් හෝ අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (WGEID) ද 1991, 1992, 1999 සහ 2015 යන වර්ෂවලදී වාර කිහිපයක් ශ්‍රී ලංකාවට ගොස් තිබේ. 2015 සිය සංචාරයෙන් අනතුරුව දෙන ලද සමූහ මිනීවළවල් ගොඩ දැමීම ඇතුළු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සවිස්තර සමාලෝචනයක් WGEID විසින් 2019 නොවැම්බරයේදී ඉදිරිපත් කරන ලදී.[62]

WGEID විසින් 2019 දී සාරාංශගත කළ පරිදි:

සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ගත් කල, මන්නාරම සමූහ මිනී වළේ කැනීම් තවමත් කෙරෙමින් පවතින බව ක්‍රියාකාරී කණ්ඩායම සටහන් කරයි. මාතලේ සමූහ මිනීවල නැවත කැනීමේ කටයුතු ඇනහිට තිබීමත්, වෙනත් සමූහ මිනීවළවල් ඇති බවට සැකකෙරෙන ස්ථාන විමර්ශනය කිරීමට ප්‍රගාමී උත්සාහයන් දරන බවක් පෙනී නොයාමත්, ඇතැම් පරිශ්‍රවල ඉදිකිරීම් සහ වෙනත් ක්‍රියාකාරකම්වලදී හමුවුණු තීරණාත්මක සාක්ෂි බලධාරීන්ට වාර්තා නොවෙන බවට තොරතුරු ලැබීමත් එහි අවධානයට යොමුවී තිබේ. ඇතැම් අතුරුදහන් වුවන්ගේ ඉරණම සහ ඔවුන් කොහිදැයි තහවුරු කරගැනීමට මේවා ඉතා ප්‍රධාන විය හැකි හෙයින් අනිකුත් සමූහ මිනීවළවල් තිබිය හැකි ස්ථාන සම්බන්ධ කටයුතු කඩිනම් කරන ලෙස ක්‍රියාකාරී කණ්ඩායම ඉල්ලා සිටී. මේ නයින් ගත් කල, තවත් සමූහ මිනීවළවල් තිබිය හැකි ස්ථාන විමර්ශනය කිරීමේ නිපුණතාවෙන් යුත් විශේෂ ඒකකයක් පිහිටුවන ලෙසත්, වෝහාරික ධාරිතාව තවත් ශක්තිමත් කරන ලෙසත් කළ නිර්දේශය නැවත අවධාරණය කරයි.[63]

## බලහත්කාරී අතුරුදහන් කිරීම් වසන් කිරීමට ඉඩ සලසන නීති රාමුව

අතුරුදහන් වුවන්ගේ ඉරණම තහවුරු කරගැනීමට කළ අසාර්ථක වෑයම් විග්‍රහ කිරීමට පෙර, සිරුරු රහසේ වළ දැමීම සහ වගකිවයුත්තන්ට දණ්ඩ මුක්තිය ප්‍රදානය කිරීම අතීතයේදී ඇතුළු අතුරුදහන් කිරීම් වසං කර ලීමට යොදාගත් පියවර කෙටියෙන් දක්වමු.

1988 ජනාධිපතිවරණයට දින කීපයක් තිබියදී වගකීමෙන් ආරක්ෂා කිරීමේ පනත සම්මත කරගන්නා ලදී. ආරක්ෂක අංශවල සියලු සාමාජිකයන්, ආණ්ඩුවේ සාමාජිකයන් සහ නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ රජයේ නිලධාරීන් 1977 අගෝස්තු 1 සිට 1988 දෙසැම්බර් 16 දක්වා කාලය තුල 'සද් චේතනාවෙන්' කළ යම් ක්‍රියාවක් වේ නම් ඔවුන්ට ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමෙන් මුක්තිය එම පනතින් සලසා දෙන ලදී. ඒ කාලය තුලදී රජයේ නිලධාරියකුගේ අධිකාරය යටතේ 'සද් චේතනාවෙන්' ක්‍රියා කළ බවට නිදහසට කරුණු දැක්විය හැකි වෙනත් ඕනෑම පුද්ගලයකුට ද එමගින් මුක්තිය හිමිකර දී තිබුණි.[64]

ජවිපෙ කැරැල්ල තීව්‍ර ලෙසින් පැවති 1988 ජුලි මාසයේදී, පශ්චාත් මරණ පරීක්ෂණ නොතියා ද, පළාතේ මහේස්ත්‍රාත්වරයාට වාර්තා නොකර ද, මළ සිරුරු බැහැර කිරීමට ආරක්ෂක හමුදාවලට ඉඩ දෙන හදිසි අවස්ථා රෙගුලාසි ER 55FF ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත්කරන ලදී.[65] මෙහි තේරුම වූයේ අතුරුදහන් වීම් සහ ඊට අනුබද්ධ ඝාතනවල භෞතික සාක්ෂි හදිසි නීති රාමුව යොදාගනිමින් විනාශ කර දමනු ලැබීමයි. ඊට අමතරව, මෙකී රෙගුලාසි හුදෙක් පවත්වාගෙන යාමෙන්ම ආරක්ෂක අංශවලට දෙන ලද පණිවිඩය වූයේ මානව හිමිකම් උල්ලංඝනය කරන ඕනෑම කෙනකුට දණ්ඩ මුක්තිය ප්‍රදානය කිරීමට ආණ්ඩුවේ තිබු අභිලාෂයයි. ජවිපෙ කැරැල්ල තලා දැමු පසුව, 1990 මාර්තු මාසයේදී ER 55FF අහෝසි කරන ලදී.

තවද, 1993 ජූනි මාසය දක්වා  බල පැවැත්වුණු ER 71 හදිසි නීති රෙගුලාසිය විශේෂ කොට සඳහන් කොට තිබු පරිදි, හදිසි නීති ප්‍රතිපාදන යටතේ  'සද් චේතනාවෙන්' කරන ලද කවර හෝ  කටයුත්තක් සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ අනුමැතියකින් හෝ මුල පිරීමකින් තොරව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් කිසිම අධිකරණයක නඩු පැවරිය නොහැක.

වෙනත් හදිසි නීති රෙගුලාසි මගින් 1993 ජූනි මාසයෙන් පසු නිසියාකාර විමර්ශන පැවැත්වීම දුෂ්කර කටයුත්තක් බවට පත් කර තිබුණි. උදාහරණයකට ගතහොත්, කවර හෝ මරණයක් සිදු වී ඇත්තේ සන්නද්ධ ගැටුමකින් යැයි කිසියම් ආරක්ෂක හමුදා නිලධාරියකු සතු විශ්වාසය පදනම් කරගෙන හදිසි නීති රෙගුලාසි යටතේ පරීක්ෂණයක් පවත්වන ලෙස පොලිස්පතිට කොළඹ මහාධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.[66] එවිට මහාධිකරණ විනිසුරුට සාක්ෂි ලෙස ලේඛන ගත කළ හැක්කේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව සහ පොලිසිය විසින් ලබාදෙන වෙනත් සාක්ෂි පමණකි. ඒ තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ නීතිපතිට පමණකි; මහාධිකරණ විභාගයේ ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීමේ විධිවිධාන සලසා නොතිබිණි. 1993 ජූනි මාසයට පෙර මෙම මහාධිකරණ විමර්ශන පැවැත්වුනේ අප්‍රසිද්ධියේය. මෙම විධිවිධාන මගින් සිදුකර ඇත්තේ පොලීසිය සහ අනෙකුත් වගකිවයුතු අයට දණ්ඩමුක්තිය සහතික කරමින්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සහ බහිර්නීතික ඝාතන වසං කිරීම චිරස්ථායි කිරීමයි.  මෙම පරීක්ෂණ සඳහා සකස් කර ඇති පටු කොන්දේසි මහාධිකරණ විනිසුරුවරුන්ගේ ස්වාධීනත්වයට බලපෑමක් ඇති කළේය. තවද, වින්දිතයන් සහ ඔවුන්ගේ ඥාතීන්  මෙන්ම තවත් ස්වාධීන සාක්ෂිකරුවන් ඇතුළු පොලිසියෙන් පරිබාහිර පාර්ශ්ව කරුවන්ගේ සාක්ෂි බැහැර කිරීම, සත්‍යය දැනගැනීමේ අයිතිය පදනම් කොටගත් විමර්ශනවලදී වින්දිතයන්ගේ භූමිකාව කේන්ද්‍රිය කොට ගන්නා ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් විය.

2016 දී යහපාලන ආණ්ඩුව විසින් අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත යටතේ OMP කාර්යාලය පිහිටුවන ලදී.[67] එහි වරම වූයේ ආගිය අතක් නැතියවුන්ගේ සහ අතුරුදහන් වූවන්ගේත්, ඔවුන්ගේ ඥාතීන්ගේත් අයිතිවාසිකම් සහ අපේක්ෂාවන් ආරක්ෂා කිරීමයි.[68] 2018 පෙබරවාරියේදී නිලධාරීන් පත් කරන ලදී. එහි පළමු වසර තුන තුළදී OMPය බෙහෙවින් ක්‍රියාකාරී වූ අතර, තම වරම ඉටු කිරීමට හැකියාවක් ඇතිය යන බලාපොරොත්තුව අතුරුදහන් කරනු ලැබූවන්ගේ ඇතැම් ඥාතීන්ගේත් ජාත්‍යන්තර ප්‍රජාව තුළත් දල්වාලීය. එහෙත් බොහෝ දෙනා ආරම්භයේ සිටම ඒ දෙස බැලුවේ සැකමුසුව ය. සාලිය පීරිස්ගේ ධුර කාලය 2020 අගෝස්තු අවසානයේ දීත් , ආරම්භක නිලධාරීන්ගේ ධුර කාලය 2021 පෙබරවාරියේදීත් අවසන් වීමෙන් පසු විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න OMP සභාපති ලෙස පත් කිරීමත් සමග තත්වය වෙනස් විය.[69] විනිසුරු අබේරත්න 2015 ජනවාරි 8 වැනිදා සිට 2019 නොවැම්බර් 16 වැනිදා දක්වා සිදුවූ දේශපාලන පළිගැනීම් ගැන විමර්ශනය කිරීමට පත්කළ ජනාධිපති කොමිෂන් සභාවේ ප්‍රධානියා ලෙස මීට ඉහතදී කටයුතු කළේය. මෙය වින්දිතයන් හා සාක්ෂිකරුවන් අඩන්තේට්ටමට ලක් කිරීමේ හා අධිකරණ ක්‍රියාවලියට හානි පැමිණවීමේ අරමුණින් පිහිටුවන ලද කැලෑ උසාවියක් බව බොහෝ දෙනාගේ පිළිගැනීම විය. අබේරත්න සිය ධුර කාලය අවසන් වීමට පෙර ඉල්ලා අස්වූ බව වාර්තා වේ. එවක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් ඔහු තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසමේ ප්‍රධානියා ලෙස පත්කිරීමෙන්[70] ඇතිවූ බැඳියාවන් පිළිබඳ ගැටුමක් නිසා එසේ වීමේ සම්භාවිතාවක් පවතී.

මේ ලියන අවස්ථාව වනවිට OMP සභාපති වන්නේ මහේෂ් කටුලන්දයි.[71] කොමසාරිස්වරුන් OMP ප්‍රාදේශීය කාර්යාලවලට යමින් මේ වනවිටත් OMP වෙත පැමිණිලි කර ඇති ඥාතීන් හමුවී ඔවුන් විසින් ලබා දී ඇති තොරතුරුවල සත්‍ය අසත්‍යතාව තහවුරු කරගෙන කාරණාව තවත් හඹා යාම සඳහා අලුත් තොරතුරු තිබේද නැතහොත් කාරණය හකුලා දමන්නේද යන්න තීරණය කිරීමටත් කටයුතු කරමින් සිටින බව වාර්තා වේ. OMP ක්‍රියා කලාපය ගැන ඥාතීන්ගේ සැකය වර්ධනය වී ඇත.[72] අතුරුදහන් කරනු ලැබූ බවට පැමිණිලි කෙරුණු පනස් දෙනකු පිටරට ජීවත් වන බව OMP ය විසින් තහවුරු කරගෙන ඇතැයි සභාපතිවරයා උපුටා දක්වන මාධ්‍ය වාර්තා පළවීමත් සමග ඔවුන්ගේ සැකය තවත් වැඩි දියුණු විය.[73] ආගමන හා විගමන කාර්යාලයෙන් විමසා බැලීමෙන් අනතුරුව 'සංචාරක ඉතිහාසයක් ඇති 93 දෙනකු' හඳුනා ගන්නා ලද බව[74] 2021 OMP වාර්ෂික වාර්තාවේ සඳහන් වෙයි. මෙයින් අදහස් කෙරෙන්නේ අතුරුදහන් වූ බවට ඔවුන්ගේ ඥාතීන් විසින් පැමිණිලි කරන ලද පුද්ගලයන් තමන්ගේ ජීවිත කාලයේ යම් අවස්ථාවක විදේශගත වූ බවට වාර්තාවක් ඇති බවද, නැතහොත් ඔවුන් සඳහටම ආපසු නොඑන්නට ශ්‍රී ලංකාවෙන් පිටව ගිය බවට වාර්තා වී ඇතිද යන්න පැහැදිලි නැත.

සමූහ මිනීවළක් ලෙස සැකකෙරෙන පරිශ්‍රයක කැනීමක් සහ/හෝ ගොඩලෑමක් සිදුකිරීම සඳහා අධිකරණ නියෝගයක් ලබාගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම් කිරීමෙත්, එවැනි කැනීමකදී හෝ ගොඩගැනීමකදී නිරීක්ෂකයකු ලෙස ක්‍රියා කිරීමටත් OMP කාර්යාලයට අධිකාරී බලයක් ඇත.[75] මන්නාරම් නගරයේ සතොස සමූහ මිනීවළ සම්බන්ධයෙන් ඔවුන් එම අධිකාරය ප්‍රයෝජනයට ගත්තේය. (මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක ඊ/232/2018). 2020 අගභාගය වනවිට එය තවත් සිද්ධි 5ක් සම්බන්ධයෙන් එසේ කළේය.[76] 2021 අවසානය වනවිට එසේ කර ඇති සමස්ත සිද්ධි සංඛ්‍යාව 11කි.[77]

මානව ශේෂ පිළිබඳ විමර්ශන සිදු කෙරෙන්නේ 1979 අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ (සංශෝධිත) 9 වැනි වගන්තියේ, XXX පරිච්ඡේදය (මරණ පරීක්ෂණ) හෝ V කොටස (අපරාධ පරීක්ෂණ) හෝ යටතේ (මරණයට හේතුව තහවුරු කිරීමට) මරණ පරීක්ෂණයක කොටසක් ලෙසිනි. විධිවිධාන සංග්‍රහය යටතේ, මරණයට හේතුව රාජ්‍යය විසින් තහවුරු කරගැනීම සඳහා සහ අපරාධ විමර්ශනයක් සිදු කිරීමට අවශ්‍ය අවස්ථාවලදී (370 (3) වගන්තිය) (370 (1) වගන්තිය) මානව ශේෂ සම්බන්ධයෙන් ළඟම ඇති මහේස්ත්‍රාත් අධිකරණයට, පොලිස් ස්ථානයට, සාම නිලධාරියකුට හෝ ළඟම ගම්මානයේ ග්‍රාම නිලධාරියාට (21 වැනි වගන්තිය) වාර්තා කිරීමේ වගකීමක් පවතී (370 (1) වගන්තිය). කෙසේ වෙතත්, මෙම විධිවිධාන මගින් සොහොන් බිම් බවට සැකකෙරෙන ස්ථාන පිළිබඳ විමර්ශන එලදායී ලෙස සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ලබා දෙන්නේ අල්ප වූ මග පෙන්වීමකි. උදාහරණයක් ලෙස, හඳුනා නොගත් සියලු මානව ශේෂ හඳුනා ගැනීම සඳහා ක්‍රියා පටිපාටියක් නීතියේ දක්වා නොමැත. බලහත්කාර අතුරුදහන්වීම්වලදී මියගිය වින්දිතයන් සඳහා ව්‍යතිරේකයක් බලහත්කාර අතුරුදහන්කිරීම් පිළිබඳ පනතේ 14(4) වගන්තිය යටතේ දැක්වෙන අතර, ඒ අනුව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් ශේෂයන් හඳුනාගෙන ඥාතීන්ට ආපසු බාර දීම කළ

යුතුව ඇත.[78]

සොහොන් බිමක් සොයාගැනීම ගැන මහජනතාව සහ/හෝ පොලිසිය විසින් වාර්තා කිරීමෙන් අනතුරුව නීතිය යටතේ, සාමාන්‍යයෙන් මූලික නඩු විභාගයකින් පසුව මහේස්ත්‍රාත්වරයකු විසින් ගොඩගැනීම සඳහා නියෝග කරනු ලැබේ.[79] මහේස්ත්‍රාත් උපදෙස් හා නියෝග යටතේ ගොඩගැනීම් සිදු කෙරෙන අතර අධිකරණ වෛද්‍ය නිලධාරීන් (JMO) විසින් තමන් අනාවරණය කරගන්නා තොරතුරු මහේස්ත්‍රාත්වරුන්ට වාර්තා කරනු ලැබේ.[80] ප්‍රමාණවත් පුහුණුවක්/දැනුමක් නොමැති ප්‍රාදේශීයබඳ තවත් කනිෂ්ඨ වෛද්‍ය නිලධාරීහු ද ඇතැම් විට කැනීම්වලට සහභාගී වෙති.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 373 වගන්තිය පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම පිණිස මෘතදේහ ගොඩගැනීම සඳහා පැහැදිලි විධිවිධාන සලසා ඇති අතර, එම ප්‍රතිපාදන මගින් ඇඟවෙන්නේ මෑතකදී වළ දමන ලද පුද්ගලයාගේ සිරුරයි. සමූහ මිනීවළවල් ගොඩගැනීමට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණ රාමුවටම අයත් වන වෙනම අධිකරණ වෛද්‍ය ක්‍රියා පටිපාටි නොමැත. ඒ එවැනි ගොඩලැම් සඳහා අවශ්‍ය සංකීර්ණ සහ පුළුල් පරාසයක චෝහාරික විශේෂඥතාවක (මානව විද්‍යාත්මක පමණක් නොව චෝහාරික හා වෙනත් ක්ෂේත්‍රවල) අවශ්‍යතාවය නොතකමිනි.

පුළුල් විරෝධතා මධ්‍යයේ ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස්වීමට සිදු වූ 2022 ජූලි මාසයේ දී පාර්ලිමේන්තුව විසින් අගමැති රනිල් වික්‍රමසිංහ ජනාධිපති ලෙස පත් කරන ලදී. 1995 දී දකුණු අප්‍රිකාවේ පිහිටුවන ලද කොමිසම ගැන සඳහන් කරමින් සත්‍ය හා සංහිඳියා කොමිසමක් (TRC) පිහිටුවීමේ සැලසුම් ගැන ජනාධිපති වික්‍රමසිංහ පුන පුනා කතා කර තිබේ.[81] එකී සැලැස්ම පිළිබඳව ශ්‍රී ලංකාව තුළ ඇත්තේ බරපතල සැකයකි. අඩුම තරමින් අතුරුදහන් වූවන්ගේ ඥාතීහු මීට පෙර කොමිෂන් සභාවල ක්‍රියාකාරකම් සහ ඒවා සත්‍යය, යුක්තිය සහ වන්දි සලසා දීමට අසමත් වීම ගැන සිහිපත් කරති.[82]

සමූහ මිනීවළවල් පිළිබඳව විමර්ශනය කිරීමට දකුණු අප්‍රිකානු TRC යට වරමක් නොතිබූ බවත්, වසර ගණනාවක් පුරා පත්කරන ලද අතුරුදහන් වූවන් පිළිබඳ ශ්‍රී ලංකාවේ විවිධ විමර්ශන කොමිෂන් සභා කිසිවකටත් ඒ සඳහා වරමක් නොතිබුණු බවත් පෙන්වා දෙනු වටී.[83] 1994 දී පිහිටුවන ලද 'කලාප' කොමිෂන් සභා තුන සහ 1998 දී චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය විසින් පිහිටුවන ලද සමස්ත ලංකා කොමිෂන් සභාව විසින් තමන් හමුවට පැමිණි සාක්ෂිකරුවන් විසින් ලබාදුන් සමූහ මිනී වළවල් පිළිබඳ තොරතුරු ජනාධිපතිවරියට දන්වා ඒවා ගොඩ ගැනීමට නිර්දේශ කරන ලදී. ඉන් අනතුරුව හෝකන්දර, එස්සැල්ල, වවුල්කැලේ, වල්පිට ගොවිපල සහ අංකුඹුර මිනීවළවල් ආශ්‍රිත කැනීම් සිදුකොට මෘතදේහ ගොඩ ගන්නා ලදී.[84] කෙසේ වෙතත්, මෙම කිසිදු කැනීමක ප්‍රතිපලයක් ලෙසින් වගකිවයුත්තන් නීතිය හමුවට පමුණුවනු ලැබුවේ නැත.

ඉහත 'කලාප' කොමිෂන් සභා තුනට පැමිණිලි 27,526ක් ලැබී තිබුණු අතර - විමර්ශනය කිරීමට කාලය තිබූ ඒවායින් - 16,742ක් බලහත්කාර අතුරුදහන් කිරීම් බවට තීරණය කර ඇත.[85] ඉතිරි පැමිණිලි විමර්ශනය කළ සමස්ත ලංකා කොමිසම තවත් අතුරුදහන්වීම් 10,136ක් ලේඛන ගත කොට ඇත.[86] වෙනත් වචන වලින් කිවහොත්, 1990 ගණන්වල අග භාගය වන විට තිල කොමිෂන් සභා විසින් ඒ වන විටත් අතුරුදහන් කිරීම් 27,000ක් පමණ තහවුරු කර තිබුණි. ඉහත සඳහන් කළ පරිදි, එවක් පටන් විශේෂයෙන් ආරක්ෂක අංශ සහ එල්.ටී.ටී.ඊ සංවිධානය අතර යුද්ධයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශවල අතුරුදහන් වූ තවත් දස දහස් ගණනක් වෙති.

තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ 2023 අප්‍රේල් මැද භාගයේදී ඉල්ලීමක් කරන අතුරුදහන්වූවන්ගේ පවුල් එකතුව (FoD), OMP වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාවත්, ඊට අදාළ කාල වකවානුවත්, OMPය විසින් නිරීක්ෂණය කරන ලද කැනීම් සංඛ්‍යාවත්, ශ්‍රී ලංකා රාජ්‍ය ලේඛනාගාරයේ තබා ඇති පෙර කොමිෂන් සභා විසින් රැස් කරන ලද ලිපිගොනු සහ සාක්ෂි වෙත ප්‍රවේශ වීමට හැකියාවක් ලැබුනිද යන්නත් පිළිබඳ පැහැදිලි කිරීමක් ඉල්ලා තිබුණි. ඊට පිළිතුරු වශයෙන් 2023 මැයි 3 වැනිදා OMP ය FoD වෙත දැනුම් දී තිබුනේ එම පැහැදිලි කිරීම සිය 2021 වාර්ෂික වාර්තාවේ (මුදල් ගෙවා ලබාගත යුතු) දැක්වෙන බවයි. කෙසේ වෙතත්, 2021 වාර්ෂික වාර්තාව සමාලෝචනය කිරීමෙන් යම් පැමිණිලි සංඛ්‍යාවක් සහ ඒවා අදාළ කාලසීමාව සහ දිස්ත්‍රික්කත් අනාවරණය වූවත් එම තොරතුරු අසම්පූර්ණ විය. නිදසුනක් වශයෙන්, පැමිණිලි 14, 988ක් අතරින් 6,086 ක් 2000-2021 කාල වකවානුවට අයත් බව වාර්තාවේ සඳහන් වුවද, අනිකුත් සිද්ධීන් අයත් වන්නේ කවර කාල වකවානුවලට දැයි එහි වෙන්කොට දක්වා නොමැත.[87] නිරීක්ෂණය කරන ලද කැනීම් සංඛ්‍යාව (11) වාර්තාවේ දැක්වෙතත්, ඊට වැඩි විස්තරයක් සපයා නොමැත. දේහ ගොඩගැනීම් සම්බන්ධයෙන් පාරදෘශ්‍යභාවය සහතික කරගැනීම සඳහා අතුරුදහන්වූවන්ගේ පවුල් එකතුව තවදුරටත් OMP ය සමග සම්බන්ධවී කටයුතු කරයි.[88] 2021 සඳහා OMP හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන 2022 ජූනි 23 දින විගණකාධිපතිවරයාගේ

වාර්තාව ඔවුන්ගේ වැඩකටයුතු
විවේචනය කරමින් විශේෂයෙන්
මෙසේ සඳහන් කර තිබේ:

'විගණනය කරනු ලබන
අවුරුද්ද අවසාන වන විට
අතුරුදහන් තැනැත්තන්
39,473ක් පිළිබඳ පැමිණිලි
ලැබී තිබුනද, මේ වනතුරු
ප්‍රකාශයට පත් කර ඇති
අතුරු වාර්තා සංඛ්‍යාව 67ක්
පමණක් බව නිරීක්ෂණය වේ.
ලැබී ඇති එවැනි පැමිණිලි
අතරින් ලිපිගොනුවල
ඇත්තේ පැමිණිලි 21,171ක්
පමණක් වන අතර, විමර්ශන
ක්‍රියාවලිය සඳහා කැඳවා
ඇත්තේ පවුල් 702ක්
පමණකි. මෙය පවත්වාගෙන
යන ලිපිගොනු සියල්ල
අතරින් සාපේක්ෂ වශයෙන්
අවම ප්‍රගති අනුපාතය වන
3.32% කරා ළඟාවී ඇත.'[89]

# 2. කැනීම් නැවත නැවතත් අසාර්ථකයි

මේ තාක් දුරට සිදුකරන ලද මෘතදේහ ගොඩ ගැනීම් අකර්මන්‍ය වීම මේ පරිච්ඡේදයේ සම්පිණ්ඩනය කරන්නෙමු. මෙය සිදුකෙරෙන්නේ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා යහ භාවිතා ඇසුරිනි. එහිදී ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර කොටගෙන ඇත්තේ බහිර් නීතික, අත්තනෝමතික සහ ලඝු ඝාතන සාර්ථක ලෙස වලක්වා ලීම සහ විමර්ශනය පිළිබඳ 2016 සංශෝධිත එක්සත් ජාතීන්ගේ අත්පොත (මිනීවළවල් කැනීම සම්බන්ධ මාර්ගෝපදේශ ද ඇතුළත් එය නීතිවිරෝධී විය හැකි ඝාතන විමර්ශනය කිරීම සඳහා වන මිනසෝටා මූලපත්‍රය ලෙසද හැඳින්වේ) සහ අතුරුදහන් තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසමේ (ICMP) සමූහ මිනීවළවල් ආරක්ෂා කිරීම සහ විමර්ශනය පිළිබඳ 2020 බෝර්න්මත් මූලපත්‍රයයි.[90]

ගොඩගන්නා ලද සිරුරු අයත් පුද්ගලයන්ගේ අතුරුදහන් කිරීමට සහ ඝාතනයට වගකිවයුත්තන්ට නඩු පවරා වරදකරුවන් බවට පත් කිරීම පසෙක තිබියේවා, වින්දිතයන් හඳුනාගැනීමට හෝ ඔවුන්ගේ මරණ සිදුවූ ආකාරය පැහැදිලි කරගැනීමට හෝ මේ තාක් දුරට මග පාදා තිබෙන කැනීම් සංඛ්‍යාව ඉතා අල්පයකි. එක් ව්‍යතිරේකයක් වන්නේ ක්‍රිෂාන්ති කුමාරස්වාමි පාසල් දැරිය දූෂණය කොට කොට ඇය, ඇගේ මව, සොහොයුරා සහ අසල්වාසියකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් ලාන්ස් කෝප්‍රල් සෝමරත්න රාජපක්ෂට මරණ දණ්ඩනය පැනවීම ය. ඇයගේ දේහය ගොඩගන්නා ලද ස්ථානයේ තවත් සිරුරු 400ක් පමණ වළ දමා ඇති බව නඩු විභාගයේදී රාජපක්ෂ ප්‍රකාශ කළේය. එය එම ස්ථානයෙන් තවත් මෘත දේහ 15ක් ගොඩ ගැනීමට මග පෑදීය. මේ අතුරුදහන්කිරීම්වලට සම්බන්ධ බවට හමුදා නිලධාරීන් කිහිප දෙනකුම පසුව හඳුනා ගන්නා ලද නමුත්, කිසිවකුත් නීතිය ඉදිරියට පැමිණවුනේ නැත. සත්තකින්ම සිදු වූයේ සන්නද්ධ සේනා අතර දණ්ඩ මුක්තිය තවත් කිඳා බස්වමින්, බොහෝ දෙනකුට උසස්වීම් ලබා දීමයි.[91]

තවත් (ආංශික) ව්‍යතිරේකයක් වන්නේ යාපනයේ මිරුසුවිල්හි ළිඳකින් සිරුරු ගොඩ ගන්නා ලද දරුවන් තිදෙනකු ඇතුළු අට දෙනකු 2000 දී ඝාතනය කිරීම සම්බන්ධයෙන් 2015 දී මරණීය දණ්ඩනය පනවන ලද යුද හමුදාවේ දිගු දුර විහිදුම් බලකායේ (LRRP) සාමාජික සුනිල් රත්නායක ගේ නඩු විභාගයයි.[92] තවත් චූදිතයන් හතර දෙනකු නිදොස් කොට නිදහස් කරන ලද අතර සුනිල් රත්නායකට එරෙහි දඬුවම අභියාචනාධිකරණය විසින් තහවුරු කරන ලදී. දණ්ඩ මුක්තියට තවත් නිදසුන් දෙමින්, දේශීය හා ජාත්‍යන්තර යන නීති පද්ධති දෙකම උල්ලංඝනය කරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් ඔහුට සමාව දෙන ලදී.

අනික් සියලුම සිද්ධීන් පාහේ නඩු විභාගයකට යොමු නොවූ අතර නිල වශයෙන් අවසන් කරන හෝ නිකම්ම අතහැර දමන ලදී.[93] තිස් අවුරුද්දක් තිස්සේ සිදුකළ සමූහ මිනීවළවල් ගොඩ ලෑමෙන් අනතුරුව වුවද බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වල වින්දිතයන්ට යුක්තිය ළඟා කර දීමට ශ්‍රී ලංකාව අසමත් හා/ හෝ අකැමැති බව පැහැදිලිය.

# 2.1 පවුල්වල සහභාගිත්වය සහ ආරක්ෂාව

පවුල්වල සහභාගීත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් බවතින ජාත්‍යන්තර ප්‍රමිතීන් මූලාශ්‍ර ගණනාවකින් විස්තර කර ඇත. ඉන් ප්‍රධාන ඒවා වන්නේ:

■ බලහත්කාරී අන්දමින් අතුරුදහන් කිරීමෙන් සියලුම තැනැත්තන් ආරක්ෂාකිරීමේ ජාත්‍යන්තර සම්මුතිය මගින් බලහත්කාරී අතුරුදහන් කිරීම සිදු වූ තත්වයන්, විමර්ශනවල ප්‍රගතිය හා ප්‍රතිඵල සහ අතුරුදහන් තැනැත්තාට අත්වී ඇති ඉරණම පිළිබඳ සත්‍ය දැනගැනීමට පවුල්වල සාමාජිකයන්ට ප්‍රකාශිත අයිතිවාසිකමක් ස්ථාපිත කරයි.[94] යුක්තිය ඉටුකරගැනීම පිණිස සමාන සහ සඵලදායි ප්‍රවේශයක් උදෙසා අයිතිය, ප්‍රමාණවත්, ඵලදායිවන සහ කඩිනමින් හානිපූරණය; නීතිය හමුවේ වින්දිතයාගේ තත්වය පිලිගැනීම;[95] උල්ලංඝනයකිරීම් සහ වගවීමේ යාන්ත්‍රණ3 ගැන අදාළ තොරතුරු ලබාගැනීමට ඇති ප්‍රවේශයට ඇති අයිතිය එකී අයිතිවාසිකමට ඇතුළත්වෙයි.[96]

■ ඔවුන්ගෙන් යම් හානියක් සිදුවිය හැකි නම් ඒවාද අවමකරගනිමින්[97] මහජනතාවට සහ වින්දිතයන්ගේ පවුල්වලට සියුම් ලෙස පරීක්ෂාකිරීමට මුල සිට අග දක්වා විවෘතභාවය ඇතුළු සිදුවිය හැකි විමර්ශන ක්‍රියාවලිය සහ ඒවායේ ප්‍රතිඵල විනිවිදභාවයෙන් යුක්තවීම මිනසෝටා මූලපත්‍රය අනුව ඉටුකළ යුතු අවශ්‍යතාවයකි.

■ බෝන්මත් මූලපත්‍රය විසින් 'කිසිදු හානියක් නොකරීමේ' මූලධර්මය ප්‍රධාන මෙහෙයුම් මූලධර්මයක් වශයෙන්ද, මිනීගොඩගෙන පරීක්ෂණ පැවැත්වීම5 පාලනය කෙරෙන මූලධර්මවල කොටසක් ලෙස පැහැදිලි සන්නිවේදනය සහතික කිරීමට අවශ්‍යතාවද ලැයිස්තුගත කර ඇත.[98]

■ මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කර ඇති කලමා වාර්තාව[99] සටහන් කරන්නේ බහිර්නීතික මරණ සම්බන්ධයෙන් පවත්වන පරීක්ෂණවලට සහභාගිවීමට පවුල්වලට රාජ්‍යයන් බලය දිය යුතු අතර ඔවුන්ට මරණය සිදුවූ ස්වභාවයන්, සිද්ධි සහ මරණයට හේතුව මෙතෙක් නිගමනය කර ඇති පරිදි මළසිරුරු අති ස්ථානය සහ ඒවායේ තත්වය සම්බන්ධයෙන් පවතින තොරතුරු ලබාගැනීමට ඇති හැකියාව සහතික කළ යුතු බව ය.[100]

ඊට අමතරව, 1 වන පරිච්ඡේදයෙන් විශේෂයෙන් පෙන්වාදුන් පරිදි, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මියගිය අය සෙවීම සහ ඔවුන්ගේ මළසිරුරු[101] සොයාගැනීමට ජිනීවා සම්මුතිවල පාර්ශවකරුවන්ගේ බැඳීම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රමිති සකස්කර ඇත.

මේ සඳහන්වන්නේ ශ්‍රී ලංකා නීතියේ ප්‍රධාන අනුරූප නෛතික ප්‍රතිපාදන වේ:

බලාත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ පනතේ 25 සහ 14 (1) වගන්ති යටතේ අතුරුදහන් තැනැත්තන්ගේ පවුල්වලට සත්‍ය දැනගැනීමට අයිතිය ඇත.

■ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 260 වගන්තිය යටතේ, මහේස්ත්‍රාත් පරීක්ෂණයකදී අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන්ට නිතිඥයෙකු සමගින් නියෝජනය කිරීමට අයිතිය ඇත.

■ අපරාධයක වින්දිතයන් සහ. සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ. ආරක්ෂා කිරීමේ 2015 පනතේ 3 (එච්) වගන්තිය යටතේ අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන්ට අපරාධ වින්දියන් වශයෙන් අපරාධ සහ /හෝ අධිකරණ වෛද්‍ය විමර්ශනවලට සහභාගිවීමට අයිතිය ඇත.

### අතුරුදහන්වූවන්ගේ පවුල් හෝ ඔවුන්ගේ නීතිඥයන් වැළැක්වීම

මෙවැනි නෛතික ඇපවීම් පැවතියද, පවුල් සම්බන්ධ නොවීම

ශ්‍රී ලංකාවේ මළ සිරුරු ගොඩගෙන පවත්වන පරීක්ෂණවලදී පවතින එක් ප්‍රධාන අඩුපාඩුවකි.9 මෙම සිද්ධිවලදී පවා (අසතුටුදායක වුවත්) අපරාධ විමර්ශන සිදුකර ඇතත් අදාළ පවුල් සැමවිටම නොසලකා හැර ඇත. මිනෝසෝටා මූලපත්‍රය පවුල් සම්බන්ධීකරණය පිණිස තැනැත්තෙකු පත්කිරීම නිර්දේශ කරයි.[103]

CHRD, FoD, JDS සහ ITJP, සංවිධාන දන්නා පරිදි ශ්‍රී ලංකාවේ මළ සිරුර ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලියේදී මෙය කිසිදිනක සිදුකර නැත. මහේස්ත්‍රාත් පරීක්ෂණයේදී තමන්ගේ අභිලාෂයන් නියෝජනය කිරීමට පවුල්වලට නීතිඥයෙකු පත් කළ හැකි නමුත්, එම නීතිඥයන්ට සැම අවස්ථාවකදීම ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ දැනුම්දීමක් කරනු නොලැබේ. ඇත්ත වශයෙන්ම, 2018 දී මළසිරුරුවල ප්‍රභවය වැනි ශත වර්ෂයේ පමණවිය හැකි බව කාබන් පරීක්ෂණවල මූලික ප්‍රතිඵල පෙන්වාදීමෙන් පසුව, (පහතින් ඇති දෙයද බලන්න) නීතිපතිවරයාගේ කාර්යාලය නියෝජනය කරමින් රජයේ නීතිඥවරයා කළ අයදුම්පතක් අනුව මන්නාරම මහේස්ත්‍රාත් උසාවියේදී නීතිඥයන් විසින් පවුල් වෙනුවෙන් සිදුකළ පෙනීසිටීම නතර කරනු ලැබුණි. මහේස්ත්‍රාත්වරයාගේ තීරණය සංශෝධනය පිණිස වව්නියාවේ පළාත්බද මහාධිකරණයට සාර්ථක ලෙස අභියාචනයක් ඉදිරිපත්කිරීමෙන් පසුව පමණක් නීතිඥවරුන්ට සහභාගිවීමට නැවත අවසර දෙන ලදී.[104] අවස්ථා ගණනාවකදී, මහේස්ත්‍රාත්වරුන් විසින් උසාවියේ පටිපාටීන්ට සහ මළසිරුරු ගොඩගෙන පවත්වන පරීක්ෂණවලට නීතිඥවරුන්ගේ සහභාගිත්වය සීමාකර තිබේ.(ඉතා දුරින් තබාගැනීම වැනි)

**මහජනතාව සමීපවීම සඳහා මහේස්ත්‍රාත් නියෝග නොසලකා හැරීම - මහේස්ත්‍රාත්වරුන් මාරුකිරීම**

මිනසෝටා මූලපත්‍රය කරන තවත් යෝජනාවක් වන්නේ පරීක්ෂණයකට ප්‍රයෝජනවත් වියහැකි තැනැත්තන් සහ ද්‍රව්‍ය හඳුනාගැනීමට සහ ඇති ස්ථාන දැනගැනීමට 'මාධ්‍ය මගින් කෙරෙන ආයාචනයක් ප්‍රයෝජනවත් විය හැකි බවයි. මෙයට මිනිසුන්ට රහසිගතව හෝ නිර්ණාමිකව පවා පරීක්ෂණ පවත්වන අයට තොරතුරු සැපයීමට හැකිවන පරිදි දුරකථන මාර්ගයක් පිහිටුවීම, ඊමේල් ලිපිනයක් පළකිරීම සහ හෝ සමාජ මාධ්‍ය වෙබ් අඩවියක් භාවිතය ඇතුළත් විය හැකිය.[105] අදාළ තොරතුරු සැපයීම වෙනුවෙන් ත්‍යාග පිරිනැමීමට පවා සැළකිල්ල දැක්විය යුතු ය. මාතලේදී මහේස්ත්‍රාත් චතුරිකා ද සිල්වා, මාතලේ සමූහ මිනීවළෙන් ගොඩගත් මළසිරුරු 155 අතර ඔවුන්ගේ ඥාතීන්ද සිටිය හැකි බැවින් අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන් හඳුනාගැනීම පිණිස භාෂා තුනෙන්ම පුවත්පත්වල දැන්වීම් පළ කරන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කළාය. ශ්‍රී ලංකා පොලීසියේ මූලික විමර්ශන අංශය වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, එම මෙම සිද්ධිය සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම පළාතේ පොලීසියෙන් තමන් වෙත පවරාගෙන තිබුණද මහේස්ත්‍රාත් නියෝගය ක්‍රියාත්මක කිරීමට අසමත්විය.[106] මහේස්ත්‍රාත්වරිය වහාම ස්ථාන මාරුකොට යවනු ලැබුවාය. (පහත 2.5 , බලන්න)

පවුල් සමඟ ප්‍රමාණවත් තරම් සම්මුඛ සාකච්ඡා නොකිරීම හෝ සම්මුඛ සාකච්ඡා කිසිවක් නොපැවැත්වීම

අතුරුදහන්වූවන්ගේ පවුල් මළසිරුරු ගොඩගෙන කරන පරීක්ෂණවලට ඔවුන් සහභාගි කර නොගැනීම වශයෙන් පමණක් නොව, පොලිස් විමර්ශනවලට ද සහභාගි කර නොගැනීම සිදුවෙයි. මෙම මළසිරුරු පිලිබඳ පරීක්ෂණවලදී එම ප්‍රදේශයේ පොලීසිය මෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අතුරුදහන් තැනැත්තන්ගේ පවුල්වලින් ප්‍රකාශ සටහන් කර ගෙන ඇති නමුත් ඔවුන්ගේ ප්‍රකාශ පාවිච්චිකරන ආකාරය සම්බන්ධයෙන් ඔවුන්ට පැහැදිලිකිරීමක් නැති අතර ඒ ගැන ඔවුන්ට දැනුම්දීමක් කර නැත. මෙය මාතලේ ඇතිවූ සිද්ධියට උදාහරණයකි. මන්නාරමේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පොලීසිය ප්‍රදේශයේ අතුරුදහන් තැනැත්තන්ගේ පවුල්වලින් ප්‍රකාශ සටහන්කර ගැනීමක් කර නැති අතර පැරණි සුසාන භූමියක් පැවති බව සහතික කිරීම කෙරෙහි අවධානය යොමුකරමින් ඔවුන් රජයේ නිලධාරීන්ගෙන් සහ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගෙන්ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. බුද්ධි නිලධාරීන් විසින් මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලියට සහභාගිවූ බොහෝ පවුල්වලට නැවත නැවතත් අතරවරකිරීම් සහ බියගැන්වීම් කර ඇත.

**පශ්චාත් මරණ පරීක්ෂණ දත්ත නොමැතිවීම, මළ සිරුරු හඳුනාගැනීමේ අවස්ථා අඩුකරයි**

සමූහ මිනීවළක් සොයාගත් සහ මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පවත්වන ප්‍රදේශයේ ජීවත්වන අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වල ඥාතීන්ගෙන් පශ්චාත් මරණ පරීක්ෂණ දත්ත 14 රැස්කිරීම පිණිස ශ්‍රී ලංකාවේ ක්‍රමවේදයක්,

පටිපාටියක් හෝ ඇත්ත වශයෙන්ම පිළිවෙතක් නැත.[107] එවැනි දත්ත රැස්කිරීමේ අරමුණවන්නේ මළසිරුරු හඳුනාගැනීමට ආධාර කිරීමයි. උදාහරණයක් දක්වතොත් මන්නාරමේ හෝ මාතලේ එවන් පශ්චාත් මරණ පරීක්ෂණ දත්ත රැස්කිරීමක් සිදුවී නැත.[108] පේරුහි අධිකරණ වෛද්‍ය මානවවිද්‍යා කණ්ඩායමේ අධ්‍යක්ෂ හොසේ පැබ්ලෝ බරේබාර් විස්තර කරන පරිදි: 'ගොඩගන්නා මළසිරුර කාගේදැයි දැන ගැනීම සම්බන්ධයෙන් කිසිම තොරතුරක් නොමැතිව මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමෙන් ඔවුන් හඳුනාගැනීමට ඇති අවස්ථා ඉතා සුළුය .. සොයන වින්දිතයා කව්රුන්දැයි පැහැදිලි මතයක් නැතිවන විට හඳුනාගැනීම විශ්වාස කළ නොහැකි සේ දුෂ්කර කාර්යයක් වනු ඇත.'[109]

1999 ජූනි මාසයේ චෙම්මනි හි මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමේදී පරීක්ෂණයේ මුල් අදියරේදී අතුරුදහන් තැනැත්තන්ගේ පවුල් ඊට සම්බන්ධ වූහ. සමූහ මිනීවළවල් තිබෙන බව තමන්ගේ නඩු විභාගයේදී හෙලිකළ (ඉහත සඳහන බලන්න) සොල්දාදුවා සෝමරත්න රාජපක්ෂ මෙම ප්‍රකාශය කරන විට ඔවුහු මහේස්ත්‍රාත් උසාවියේ සිටියහ.[110] පසුව මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වෙන අවස්ථාවේදී ඔවුහු දුරින් තබනු ලැබූහ. එම පරීක්ෂණ නිමවූ වහාම ඔවුන්ට ගොඩගත් මළසිරුරු බලා යම් රෙදි හෝ මෙවලම් හඳුනාගැනීමට අවස්ථාව සලසන ලදී.[111] ඔවුන්ගේ ඇඳුම් පාදක කරගෙන, පවුල් විසින් ඔවුන්ගෙන් දෙදෙනෙකු 1996 අගෝස්තු 19 දා යුද හමුදාව විසින් අත්අඩංගුවට ගනු ලැබීමෙන් පසු අතුරුදහන් ව සිටි ගරාජ සේවකයන් බව හඳුනා ගන්නා ලදී. මිනීවළෙන් හමුවූ එක් වින්දිතයෙකු ඔහුගේම කමිසයෙන්ම ඔහුගේ ඇස් බැඳ තිබුණු අතර, අනික් තැනැත්තාගේ දෙඅත් ඔහුගේ බැනියමින් පිටුපසට තබා ගැටගසා තිබුණි.[112] ඇඳුම් හෝ මෙවලම් වැනි අධිකරණ වෛද්‍ය නොවන සාක්ෂි මගින් ඥාතීන්ට මළසිරුරු හඳුනාගැනීමට අවස්ථාව ලබාදුන් මෑතකදී පැවැත්වූ මළසිරුරු ගොඩගෙන කළ යම් පරීක්ෂණයක් ගැන CHRD, FoD, JDS සහ ITJP යන සංවිධානවලට, දැනගැනීමට නැත.

### මනෝ-සාමාජීය ආධාර නොමැතිවීම

ගොඩගත් මළ සිරුරු අතර තමන්ගේ ඥාතීන්ගේ සිරුරුද තිබිය හැකි පවුල් මනෝ-සාමාජීය ආධාර නොමැතිව අතහැර දමා ඇත.[113] OMP ට මනෝ සමාජීය ආධාර ලබාදීමට වරයක් ලැබී ඇති අතර එහි මණ්ඩලය 2020 දෙසැම්බර් මාසයේදී මේ සම්බන්ධයෙන් උපාය මාර්ගයක් අනුමත කර ඇත.[114] එසේවුවත්, එහි 2020 වාර්ෂික වාර්තාව අනුව, මේ සම්බන්ධයෙන් ප්‍රගතියක් ලබාගැනීමට මහජන සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ, කරුණු සහ කෝවිඩ් -19 කාලයේදී සීමාවන් පැනවීම සහ පරිශ්‍රවල සිදු කරන ලද වෙනස්කම් නිසා මහත්සේ බාධා ඇතිවිය.[115] 2021 වාර්ෂික වාර්තාව අනුව, පවුල්වලට ආධාර ලබාදීමේ නිලධාරීන් පවුල් සමග උපදේශන පැවැත්වීමෙන් පසුව[116] ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාලවලට මුදල් ගෙවා ලබාගෙන උපායමාර්ගය බලාත්මක කර ඇත.

### හඳුනාගැනීමක් සහ මළසිරුරු ආපසු බාරදීමක් නොමැතිවීම

2010 දී යාපනයේ දිස්ත්‍රික්කයේ මිරුසුවිල් හි ළිඳෙන් සොයාගත් මළසිරුරු හැරුණු විට ,මේ දක්වා සමූහ මිනීවළවල්වලින් ගොඩගත් කිසිම සිරුරක් ඥාතීන්ට ආපසු බාරදී ඇති බවක් CHRD, FoD, JDS සහ ITJP සංවිධාන නොදනී. චෙම්මනිහිදී ඔවුන්ගේ ඇඳුම් පාදක කරගනිමින් හඳුනාගන්නා ලද තැනැත්තන් දෙදෙනාගේ සිරුරුද ආපසු බාරදී නැති බව වාර්තාවෙයි; එමෙන්ම බොල්ගොඩ වැවෙන් හමුවූ පසුව මුහුණු ප්‍රතිනිර්මාණය මගින් හඳුනාගන්නා ලද අයගේ මළසිරුරුද ආපසු බාරදී නැත. මෙය සිදුවන්නේ පෙර පත්කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ සංහිඳියා යාන්ත්‍රණ සඳහා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් ස්ථිර ලෙස රජය අතුරුදහන් තැනැත්තන්ට සහ දක්නට නොමැති තැනැත්තන්ට අත්වී ඇති ඉරණම ස්ථාපිත කළ යුතු බවට සහ විශේෂයෙන් මරණයට පත්වූ තැනැත්තන්ගේ සිරුරු ඔවුන්ගේ පවුල්වලට ආපසු ලබාදිය යුතු බවත් අවධාරණ කර ඇතිවිටක ය.[117]

## 2.2 උපයෝගී කරගත හැකි නෛතික, ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් රාමුවෙහි ව්‍යාකූලතාව

ඉහතින් විදහා දැක්වූ ආකාරයට මෘත දේහ ගොඩගැනීම දැනට සිදුවන්නේ මරණ පරීක්ෂණයක හෝ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ සිදුවන අපරාධ විමර්ශනයක කොටසක් වශයෙනි. මෘතදේහ ගොඩගැනීම මේ දක්වා බොහෝදුරට සිදුවන්නේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 138 සහ 416 වගන්ති යටතේ වන අතර චූදිතයා නොදන්නා හෝ නොමැති අපරාධ පරීක්ෂණවලදී සාක්ෂි වාර්තාගත කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටීන් එමගින් විදහා දැක්වේ. අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේත්, අතුරුදහන්වූවන් සඳහා වූ කාර්යාංශ පනතේ සහ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතේත් (ඉහත 2.1 බලන්න) ඇති මෙකී ප්‍රතිපාදන එසේ තිබියදීත්, මෘතදේහ ගොඩගැනීමට පෙරත්, අතරතුරත්, පසුවත් ආණ්ඩුවේ තනි තනි දෙපාර්තමේන්තුවල වගකීම පිළිබඳ නොපැහැදිලිතාවක් සමස්තයත් වශයෙන් පවතින අතර එය සම්බන්ධීකරණයට හා සෑහෙන ප්‍රමාදයන් ඇතිකිරීමට තුඩු දෙයි. මිනිස් ශේෂයන් ගබඩා කරතැබීමට අදාළව අසංගත භාවිතාවන් දක්නට ලැබේ. ඇතැම් අවස්ථාවලදී, ඒවා, රජයේ වෛද්‍ය නිලධාරියකු අත හෝ රජයේ රස පරීක්ෂක හෝ රසායනාගාරයක් හෝ පොලිසිය භාරයේ අත්හැර දමා තිබේ. අයිතිකරුවකු නොමැති මිනිස් ශේෂයන් හඳුනාගැනීමට ඉවහල් වන මධ්‍යම දත්ත ගබඩාවක හෝ ජාතික ප්‍රතිපත්තියක හෝ කවර හෝ නිශ්චිත විධිමත් ක්‍රියා පටිපාටියක ඌනතාවක් ශ්‍රී ලංකාවේ පවතී.[118] මෙය වනාහී, මෘතදේහ ගොඩගැනීමට අදාළ පොදු ප්‍රතිපත්තියක් මගින් එක් එක් දෙපාර්තමේන්තුවල කාර්යභාරය නිශ්චිත කොට විදහා දක්වන දකුණු අප්‍රිකාව වැනි වෙනත් රටවල් සමග පවත්නා කැපී පෙනෙන වෙනසකි.[119]

සැකකරනු ලබන සුසාන බිම් පිළිබඳ අතීත පරීක්ෂණවලට අදාළ දුබලතා වශයෙන් සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ 2016 අතුරු වාර්තාව විසින් අවධාරණය කොට දක්වන්නේ 'අත්තනෝමතික ක්‍රියා පටිපාටීන්, ක්‍රියාකාරී භූමිකාවන් අතර සම්බන්ධීකරණයෙහි ඌනතාව සහ උපදේශන අධිකරණ වෛද්‍ය නිලධාරියකුගේ අනිවාර්යතාවයක අඩුව"යි.[120] එමගින් නිර්දේශ කරනු ලැබුවේ, මිනිස් ශේෂයන් සහ ඒවාට සම්බන්ධ වෙනත් දෑ ඔවුන්ගේ ප්‍රියාදරයන් අතට පෙරළා පත්කිරීම පහසුකරන නියාමන සේවා හඳුන්වා දිය යුතු බව ය.[121] අපරාධ නඩු විධාන සංග්‍රහ පනත සංශෝධනය කළ යුතු බවත්, මහා පරිමාණ සුසානබිම් ලෙස සැකකරනු ලබන ස්ථාන සම්බනධයෙන් නිශ්චිතව ක්‍රියාකාරීමට නව නීතියක් බලාත්මක කළ යුතු බවටද එමගින් නිර්දේශ කරනු ලැබුණි.[122] සුසානබිම් වශයෙන් සැකකෙරෙන ස්ථාන විමර්ශනය කිරීමට අවශ්‍ය ප්‍රමිතීන් සහ බලතල විදහා දැක්වෙන මරණ පරීක්ෂණ පිළිබඳ නීති කෙටුම්පතක් වසර ගණනාවක් තිස්සේ අධිකරණ අමාත්‍යාංශයේ අතීරණයට ගොදුරුව පවතී. මිනිස් ශේෂයන් හඳුනාගැනීමේ ක්‍රමවේදයන් හා ඒවා පවුල් වෙත පෙරළා ලබාදීම සන්නිවේදනය කිරීමේදී පිළිපැදිය යුතු ක්‍රියා පටිපාටීන්ද ඇතුළත් සම්මත මෙහෙයුම් කාර්ය පිළිවෙත් සංවර්ධනයට අදාළවද එම කෙටුම්පත් නීතිය දායක වේ.[123]

මරණ සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීමට අදාළව පවත්නා නීති රාමුව, ක්‍රියා පටිපාටීන් සහ භාවිතාවන් අධ්‍යයනය කර අවශ්‍ය සංශෝධන නිර්දේශ කරනු වස් දස පුද්ගල කමිටුවක් 2015දී පමණ අධිකරණ ඇමතිවරයා විසින් ස්ථාපිත කරන ලදී. අමාත්‍යාංශ හා නීතිපති දෙපාර්තමේන්තු නියෝජිතයන් මෙන්ම ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරීන් සහ වෙනත් ව්‍යවහාරික විශේෂඥයන් එයට ඇතුළත් විය.[124]

අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයද මෙකී ක්‍රියාදාමයට හවුල්ව සිටියි.[125] මේ

සම්බන්ධයෙන් අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පිළිබඳ අමාත්‍යාංශය සමග සාකච්ඡාවන්ට 2018දී එය විසින් මුලපුරන ලදී.[126] අද වනතෙක් අදාළ කෙටුම්පත ප්‍රසිද්ධියට පත්කොට හා විවාදයට භාජනය කොට නැති අතර එහි පිටපතක් ලබාගැනීමට CHRD, FOD, JDS සහ ITJP සංවිධානවලට නොහැකිව තිබේ. මේ වනාහී 2023 අප්‍රේල් මාසයේදී තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ එහි පිටපතක් ලබාදෙන මෙන් FOD සංවිධානය විසින් ඉල්ලා තිබියදීත් ය. ඡධෟ සංවිධානය විසින් මතුකරන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබාගැනීමට ඔවුන් යොමුකරන ලද අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයේ 2023 වාර්ශික වාර්තාවේ සමූහ සුසාන පිළිබඳ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටීන් පිළිබඳ කිසිදු තොරතුරක් අන්තර්ගත නොවේ.

අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයේ මුල් ප්‍රතිචාරයට පිළිතුරු වශයෙන් 2023 මැයි 24 වැනිදා ඡධෟ සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය මගින් හදිසි අවශ්‍යතාවක් සේ සළකා මෙකී තොරතුරු ඉල්ලා තිබේ.

මෘතදේහ ගොඩගැනීම පිළිබඳ මේ දක්වා නිරීක්ෂණය කරනු ලැබ ඇති අසාර්ථකතා හේතුවෙන් කවර හෝ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටියකට අන්තර්ගත කරගත යුතු මාතෘකා මේවා යඃ

■ මිනිස් ශේෂයන් අනාවරණය කරගැනීම, මෘතදේහ ගොඩගැනීම සහ චෝහාරික විශ්ලේෂණය යන සෑම අධියරකදීම මහේස්ත්‍රතාත්වරයාගේත්, ප්‍රාදේශීය පොලිසියෙත්, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේත්, නීතිපති කාර්යාලයේත්, (ප්‍රාදේශීය අධිකරණ වෛද්‍ය නිලධාරී, ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරීන්, චෝහාරික මානව විද්‍යාඥයන්, පුරා විද්‍යාඥයන්, විකලාංග දන්ත වෛද්‍යවරුන් සහ වෙනත් විශේෂඥයන්ද ඇතුළත්) තනි තනි චෝහාරික විශේෂඥයන්ගේත් තනි පුද්ගල වගකීම කවරේදැයි සවිස්තරාත්මකව විදහා දැක්විය යුතු ය. මන්නාරම් මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කර තිබියදීත්, මන්නාරමේ සතොස සමූහ මිනීවළ සම්බන්ධයෙන් මේ දක්වා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මැදිහත් වී නොමැත.

■ ප්‍රාදේශීය පොලිසිය හා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමට අදාළ අවශ්‍යතා පැහැදිලි කළ යුතු ය. 1994දී සූරියකන්ද සම්බන්ධ විමර්ශනය ආරම්භයේදී ප්‍රාදේශීය පොලිසිය වෙත පැවරී තිබුණි; පසුව, සමූහ මිනීවළ ආශ්‍රිත සොයාගැනීම් පිළිබඳ පරීක්ෂණ කටයුතු කිරීමට රජය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් කණ්ඩායමක් පත්කරන ලදී. එහි ප්‍රතිඵල වශයෙන් මෘතදේහ ගොඩගැනීමේ ක්‍රියාවලිය පැවති බොහෝ අවස්ථාවල අපරාධ පරීක්ෂණ නිලධාරීහු එම ස්ථානයේ රැඳී සිටියහ. 2018දී මන්නාරම වැනි මෘතදේහ ගොඩගත් වෙනත් අවස්ථාවලදී ද මෙය සිදුවුණි. ප්‍රාරම්භක අධියරේදී මහේස්ත්‍රාත් නියෝග ප්‍රකාරව ප්‍රාදේශීය පොලිසිය සහ අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීහු එහි පැමිණ සිටියහ. මහේස්ත්‍රාත්වරයාට ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂිවලට (බී වාර්තාව) අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ද හවුල්වන, අපරාධ ස්ථාන විමර්ශනයකට මහේස්ත්‍රාත්වරයා නියෝග ලබා දෙයි. එතැන් සිට ප්‍රාදේශීය පොලිසියේ මැදිහත්වීම සීමිත එකක් වන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීහු ස්වකීය වීධානයන් පොලිස් මූලස්ථානයෙන් ලබාගනිති.[127]

■ කිසිදු අපවේශනයක් කළ නොහැකි පරිදි සාක්ෂි පනත යටතේ සාක්ෂි මුද්‍රා තැබීමට අදාළ නිශ්චිත වගකීම් හා ක්‍රියාදාමය පැහැදිලි කළ යුතු ය.

■ කාලය කාර්යක්ෂමව උපයෝග කරගනිමින් හා ඥාතීන්ගේ හැඟීම්වලට ගරු කරමින්, සොයාගන්නා ලද මිනිස් ශේෂයන් පිරිසැකසීමටත්, විදේශයන්හිදී ඒවා පරීක්ෂා කිරීම සඳහා සාම්පල සූදානම් කිරීමටත් අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් තරම් වෙන් කළ යුතු ය.(මාතලේදී, අධිකරණය ලබාදුන් නියෝගය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සති හයක් ගතවන තුරු නොතකා හරින ලදී.)

■ අපරාධ ස්ථානයේ ආරක්ෂාව උවදුරෙහි නොහෙළන පරිදි, ඥාතීන් හා මහජනයාට විවෘතව තැබීම සහතික කළ යුතු ය.

### ජීවතුන් අතර සිටින කිසිදු සාක්ෂිකරුවකු හඳුනා නොගැනීම

බරපතල අපරාධ පිළිබඳ සාක්ෂිකරුවන් විය හැකිවුන් හඳුනාගැනීම සඳහා වන විමර්ශනවල ප්‍රකටව පෙනෙන ඌනතාවක් තිබේ. පෙරට ඒමට උවමනාවක් තිබිය හැකි සාක්ෂිකරුවන් ද ස්වකීය ප්‍රවේශම සහ ආරක්ෂාව පිළිබඳ බිය පළකොට තිබේ. 2015 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි රහසිගතව ප්‍රකාශ සටහන් කරගැනීමට අවසර සපයන ප්‍රතිපාදනයක් තිබේ.[128] කෙසේවුවද, ප්‍රමාණවත් නොවීම සම්බන්ධයෙන් මෙකී නීතිය විවේචනයට පාත්‍රව ඇත. 2015 පනත විවරණයට පාත්‍රකළ බවත්, එය වෙනුවට වෙනත් පනතක් ගෙනඒමට සූදානම් බවත් රජය එක්සත් ජාතීන්ගේ සංවිධානයට 2021දී හැඟවුවද, මේ දක්වා එය සිදුව නැත.[129] 2015 පනත යටතේ

2016 ස්ථාපිත කළ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය විනිසුරුවරුන් සහ පොලිසිය දැනුවත් කිරීම් පුහුණු වැඩසටහන්[130] පවත්වාගෙන ගියද, 2019 සිට කිසිදු වාර්ෂික වාර්තාවක් පළකොට නැත.[131]

**පාරදෘෂ්‍යභාවයේ ඌනතාව**

පොදු මහජනයාට හා වින්දිත පවුල්වලටත් විවෘතභාවයෙන් යුතු වන පරිදි, විමර්ශන පාරදෘෂ්‍ය විය යුතු යැයි මිනසෝටා මූල පත්‍රය නියම කර සිටියි.[132] ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත්වරු, ඇතැම් අවස්ථාවලදී ජනමාධ්‍යයන්ට මෘතදේහ ගොඩගැනීමට අදාළ තොරතුරු දැනගැනීමට සීමා පනවති. උදාහරණයක් වශයෙන්, 2018දී මන්නාරම මහේස්ත්‍රාත්වරයා විසින් මාධ්‍යවේදීන්ට මන්නාරමේ මෘතදේහ ගොඩගැනීම සිදුවන ස්ථානයට පැමිණීමේ ද, වීඩියෝ හෝ ඡායාරූප ගතකිරීමේ ද ඉඩ අවුරනු ලැබුණි. පසුව, අදාළ මාධ්‍යවේදීන් විසින් සාර්ථක ලෙස අධිකරණය හමුවේ පෙත්සමක් ගොණු කිරීමෙන් මෙම තීරණය වෙනස් කරනු ලැබුණි. ඉන්පසුව මන්නාරමේ සිටි මහේස්ත්‍රාත්වරයා ද, මෘත දේහ ගොඩගැනීමේ හවුල් වී සිටි වෝහාරික විශේෂඥයන් හා අවශේෂ අයවළුන්ට මාධ්‍යයට කතා කිරීම තහනම් කළේය. මෙම තහනම ද පසුව ඉවත් කෙරිණ.[133]

## 2.3 දේශපාලන අත පෙවීම්

සැක කටයුතු මරණ පිළිබඳ විමර්ශන ජාත්‍යන්තර නීතියට අනුව 'කඩිනම්, පලදායී සහ පරිපූර්ණද, ස්වාධීන සහ අපක්ෂපාතීද, විනිවිදභාවයෙන් යුක්තද' විය යුතු ය.[134] මේ නියමය ක්‍රියාවේ යොදවන්නේ කෙසේද යන්න මිනසෝටා මූලපත්‍රයේ සවිස්තරව දක්වා ඇත.[135] එක් මූලික නියමයක් වන්නේ විමර්ශන 'ආයතනික ධූරාවලියෙන් සහ විධාන දාමයන්ගෙන් පැන නැගිය හැකි අනිසි බලපෑම්වලින් නිදහස්' වීමයි.[136]

සත්‍යය සොයාගැනීමට සහ අතුරුදහන්වූවන්ට යුක්තිය ඉටු කිරීමට අද වන තුරා අසමත් වීමේ හරි මැද ඇත්තේ මෘතදේහ ගොඩගැනීමේ ක්‍රියාවලියට දේශපාලකයන් අත පෙවීමයි.

1994 දී රත්නපුර දිස්ත්‍රික්කයේ සූරියකන්දෙන් සිරුරු ගොඩගත් අවස්ථාවේ සිට (ඇමුණුම බලන්න) මිනිස් ශේෂ හමුවන අවස්ථාවල දේශපාලකයන් මැදිහත් වී ඇත්තේ ඔවුන්ගේ දේශපාලන වාසි තකා බව පැහැදිලි ය. අලුතින් බලයට පත් වූ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග ඇතුළු දේශපාලනඥයන් සූරියකන්ද ප්‍රදේශයේ මළ සිරුරු හමුවූ ස්ථානයට කඩිමුඩියේ ගොස් ගොඩ ගැනීමට කළ නියෝගයේ අවසාන ප්‍රතිඵලය වූයේ කඩිනම් ක්‍රියාවලියකින් අනතුරුව සාක්ෂි නැතිවී යාමයි.[137] ඇසින් දුටු සාක්ෂිකරුවෙක් මෙසේ පැවසීය:

'රත්නපුර දිස්ත්‍රික්කය, උද්ඝෝෂණාවල කේන්ද්‍රස්ථානයක් බවටත්, අතුරුදහන් කිරීම් සිදු කෙරෙන ප්‍රදේශයක් බවටත් පත්ව තිබුණා. දකුණු පළාතේ වාගේම මෙහෙත් මළසිරුරු ගොඩ ගසන බවට ප්‍රසිද්ධයි. හමුදාව, පොලිසිය සහ අතුරු හමුදා කල්ලි වටේම කැරකෙනවා. මුලින්ම භාරන්න අරගෙන රෙදි කඩමාලු හම්බ වුනේ මිනිස්සුන්ටයි. එදා ශ්‍රීලනිපයේ හිටපු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග සහ පවිත්‍රා වන්නිආරච්චි එතැනට ආවා. දේශපාලන න්‍යාය පත්‍ර වලටයි, දේශපාලන විරුද්ධවාදීන්ට පහර දෙන්නයි සූරියකන්ද යොදාගත්තා.'[138]

පොදුවේ බොහෝවිට සිදුවූ දේ නම්, සිදු කරන ලද අපරාධවලට දේශපාලකයකු හෝ ඔවුන්ට සමීප වෙනත් අය සම්බන්ධ නම්, ක්‍රියාවලිය අඩාල කිරීම පෙරදැරි කරගත් දේශපාලන මැදිහත්වීම් සිදුවීමයි. මඩකලපු දිස්ත්‍රික්කයේ, කලුවන්චිකුඩියේ 2014 දී හමුවූ මිනීවළ සම්බන්ධ විමර්ශන, ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී සහ කොළඹ සිටින රජයේ රස පරීක්ෂක වැනි ව්‍යවහාරික විශේෂඥයන් පරිශ්‍රයට නොපැමිණීම නිසා කල් දැමීම් සිදු වුනත්, ආරම්භයේදී කඩිනම් කෙරුනේ එහි ඇති සිරුරු LTTE විසින් මරා දමන ලද්දන්ගේය, යන උපකල්පනයෙනි. පසුව විමර්ශන අත් හිටවිණි; බොහෝ අය විශ්වාස කරන්නේ විමර්ශන දිගටම කරගෙන යාමෙන්, 2004 දී LTTEය හැරගොස් 2008දී මහින්ද රාජපක්ෂ රජයට නිල වශයෙන් සම්බන්ධ වූ විනායගමූර්ති මුරලිදරන් (හෙවත් කර්නල් කරුණා)[139] සමූහ මිනීවළට ඇති සම්බන්ධයක් හෙළිවෙතැයි ආණ්ඩුව වටහා ගැනීම ඊට හේතුව බවයි. පළමු පැමිණිල්ල ලැබී අවුරුදු දහයකට ආසන්න කාලයක් ගතවී තිබුණත් කිසිදු මෘතදේහ ගොඩ ගැනීමක් සිදුවී නැත.

මාතලේ කැනීම් සිදුකෙරුණු 2013 දී, එවක ආරක්ෂක ලේකම් වූ ගෝඨාභය රාජපක්ෂ (1989 ජූලි සිට 1990 ජනවාරි දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ හමුදා සම්බන්ධීකාරක නිලධාරියාව සිටි[140] ඔහු පසුව ශ්‍රී ලංකාවේ ජනාධිපති විය) මාතලේ ඇතුළු මධ්‍යම පළාතේ අවුරුදු පහකට වඩා පැරණි පොලිස්

වාර්තා සියල්ල විනාශ කර දමන්නට අණ දුන් බව[141] වාර්තා වේ. එම මාධ්‍ය වාර්තාව නිලධාරීන් විසින් කිසි කලෙකත් ප්‍රතික්ෂේප කර නැත. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට අනුව විමර්ශන ක්‍රියාදාමයට බාධා කිරීම සම්බන්ධයෙන් ඔහුටත්, ඊට සම්බන්ධ බවට චෝදනා ලබන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ආර් ඩී එස් මැදවත්ත, සහ මධ්‍යම පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එම් ආර් බී අඹන්වෙළ ඇතුළු අනිකුත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ රජය පියවර ගත යුතු ය.[142] මාතලේ දිස්ත්‍රික්කය භාර නිලධාරීන් වගඋත්තරදායකත්වයෙන් බැඳ තැබීමට අසමත් වීම ගැන බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් හෝ අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (WGEID) ඇතුළු එක්සත් ජාතීන්ගේ විශේෂ පටිපාටි ආයතන හතරක් 2023 ජනවාරියේදී ආණ්ඩුවට ලිඛිතව දන්වා යවා තිබුණි.[143]

මෘතදේහ ගොඩ ගැනීමේ විමර්ශන ක්‍රියාවලියට දේශපාලකයන් ඇඟිලි ගැසූ වෙනත් ක්‍රම ද තිබුණි. නිදසුනක් ලෙසින්, ශේෂයන්ගෙන් ලබාගත් අස්ථි සාම්පලවල DNA අතුරුදහන් වූවන්ගේ පවුල්වල DNA සමග සැසඳේද යන්න තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණ පවත්වන මෙන් වෝහාරික විශේෂඥයන්ට නියෝග කරන ලෙස මාතලේ බලහත්කාරයෙන් අතුරුදහන් කළ බවට සැක කෙරෙන වින්දිතයන්ගේ ඥාතීන් මහෙස්ත්‍රාත්වරයා හමුවේ පෙත්සමක් ගොනු කළ පසු, ජනාධිපති මහින්ද රාජපක්ෂ මාතලේ සමූහ මිනීවල සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා 2013 ජුනි 20 වැනි දා පරීක්ෂණ කොමිසමක් පත් කළේය. විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස් අයි ඉමාම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද එහි සෙසු සාමාජිකයන් වූයේ හිටපු පාර්ලිමේන්තු මහලේකම් ධම්මික කිතුල්ගොඩ සහ විශ්‍රාම ලත් මහාධිකරණ විනිසුරු බන්දුල අතපත්තු ය.[144] ඊට අයත් වරම වූයේ මෘත දේහයන්ට අදාළ කාලසීමාව හඳුනාගැනීම, මෘතදේහයන් හඳුනා ගැනීම, ඔවුන් මිය ගියේ කවදාද සහ කෙසේද, සහ මරණ සිදුවූයේ නීති විරෝධී ක්‍රියාවකින් ද යන්න සොයා බැලීමයි. තවද, වගකිවයුත්තන් හඳුනාගැනීමේ ක්‍රම නිර්දේශ කිරීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, පුනරාවර්තනය නොවීම සහතික කිරීමට පියවර ගැනීම සහ පවුල්වලට ලබාදිය යුතු යම් සහන වේ නම් ඒවා නිර්දේශ කිරීම වරමට අයත් විය.[145] මෙම ත්‍රිපුද්ගල කොමිසමට සිය පරීක්ෂණය පැවැත්වීමට නියම කර තිබුණේ මාතලේ මහේස්ත්‍රාත් සහ පොලිස් පරීක්ෂණයට සමගාමීව ය.

වෝහාරික විශේෂඥයන්ගේ ඉල්ලීම පරිදි ශේෂයන්ගේ නියැදි ඇමරිකා එක්සත් ජනපදයේ බීටා ඇනලිටික් ආයතනයට යැවීමට (ශ්‍රී ලංකාවේ එසේ සිදු කෙරුණු පළමු වතාව මෙයයි) මහේස්ත්‍රාත්වරයා නියම කළේය. වධබන්ධනයට ගොදුරු වූ ලකෂණ දැක්වෙන සාක්ෂි ශේෂයන්ගේ තිබුණු බව පිළිගත්තත්, බීටා ඇනලිටික් වාර්තාව අනුව යමින් කොමිසම නිගමනය කළේ ශේෂයන් 1950 ට පෙර කාලයකට අයත් බවයි. සුසාන භූමියෙන් සොයාගන්නා ලද මානව කෘති ගණනාවක් පදනම් කොටගෙන මිනීවල 1980 අග භාගයට අයත් බවට කාල නිර්ණය කළ, මාතලේ කැනීම් කටයුතු සිදුකළ වෝහාරික පුරාවිද්‍යාඥ රාජ් සෝමදේව, බීටා ඇනලිටික් වාර්තාවට විරෝධය පල කරමින් යෝජනා කළේ දූෂ්‍ය වීමක් හේතුකොටගෙන කාබන් කාල නිර්ණ වාර්තාව පුරාවිද්‍යා කාල නිර්ණයට පරස්පර වන්නට ඇති බව ය.[146] කොමිසම විසින් 2015 දී සිය අවසාන වාර්තාව ජනාධිපති සිරිසේනට බාර දෙන ලදී. වාර්තාව කිසි කලෙක ප්‍රසිද්ධියට පත් නොකෙරුණත්, එය තමන් අතට පත්වූ බව කී 'සන්ඩේ ටයිම්ස්' පුවත්පත විසින් 2015 මැයි මාසයේදී එහි නිගමන වාර්තා කරන ලදී.[147]

## 2.4 සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව හා පරිශ්‍ර කළමනාකරණය

මෘත ශරීර ගොඩගැනීමේ නියැලී සිටින විමර්ශකයන්ට මෙන්ම 'විමර්ශනයට ඇති සම්බන්ධය කවරාකාර වුවත්' නීතිඥයන්ටත් බියගැන්වීමකින්, බාධාවකින්, අඩන්තේට්ටමකින් හෝ අනිසි මැදිහත් වීමකින් තොරව තම වැඩ කටයුතු කරගැනීමට රාජ්‍යය සහතික විය යුතු බව මිනසෝටා මූලපත්‍රයේ නියමයකි.[148]

සිරුරු ගොඩගැනීමේ නිරත වුවන්ට තර්ජන එල්ලවීම පිළිබඳ වාර්තා ලැබී තිබේ. සූරියකන්ද කැනීම් සිදුවෙමින් පැවති 1995 ජනවාරි 17 වැනිදා විරුද්ධ පක්ෂයේ ප්‍රධාන නීතිඥයා නඩු විභාගය කල් දමන ලෙස ඉල්ලා සිටියේ ඇතැම් සාක්ෂිකරුවන්ට තර්ජන එල්ලවීම සහ ඔහු ජනවාරි 10 වැනිදා උසාවියේ සිට නිවෙස බලා යද්දී වෙඩි පහරකට ඉලක්ක වීම නිසා ය. යාපනයේ, චෙම්මනි හි සමූහ මිනීවළවල් (ඉහත බලන්න) පිළිබඳ සාක්ෂි අනාවරණය කළ ලාන්ස් කෝප්‍රල් සෝමරත්න රාජපක්ෂට තර්ජනය කොට ගුටි බැට දෙන ලදී. ඔහුගේ බිරිඳට 'හමුදාවේ සමහර සාමාජිකයන්'ගේ අත්සනින් එවා තිබූ ලියුම් දෙකක කියා ඇත්තේ උසාවියට දෙන ලද ප්‍රකාශය නොවරදවාම ඉල්ලා අස් කරගන්නා ලෙස ය.[149]

ඉඩ ලැබෙන පළමු අවස්ථාවේම සමූහ මිනීවළ සුරක්ෂිත කොට තබා, අවසර නොලත් කිසිම නිලධාරියකුට එහි ඇතුල් වීමට ඉඩ නොදීම මිනසෝටා මූලපත්‍රයේ නියමයකි.[150] තවද, එම ස්ථානයට ඇතුල් වන සියලුම නිලධාරීන් සහ ඔවුන් ආ ගිය දිනය සහ වෙලාව ඇතුළත් වාර්තාවක් තබාගත යුතු ය යන්න එහි අවශ්‍යතාවකි. සාක්ෂි සමග අන්තර් ක්‍රියාකාරිත්වයේ යෙදෙන පුද්ගලයන්ගේ DNA සහ ඇඟිලි සලකුණු මූලාශ්‍ර සාම්පල ලෙසින් ලබාදිය යුතු ය.[151]

සූරියකන්ද සමූහ මිනීවළ අපවේෂණය කොට ඇති බවට බරපතල සැකයක් පැවතිනි.[152] එමෙන්ම, කැනීම් ආරම්භ වීමට කලින් චෙම්මනියේ සාක්ෂි ඉවත් කරගන්නා ලද බවටත් කටකතා පැතිර ගියේය.[153]

### අසම්පූර්ණ කැනීම්

පැහැදිලි ප්‍රතිපත්තියක් නැති හෙයින් කැනීම් සිදුවන බිම්වලට සපයා ඇති ආරක්ෂාව ප්‍රමාණවත් නොවීම ද සැලකිල්ලට ගත යුත්තකි. සිරුරු ගොඩගන්නා අවස්ථාවේ ඉන්නා පොලිසිය ගොඩලෑම් අවසන් වූ පසු එතැනින් ඉවත් වේ. මාතලේදී මෙය සිදුවිය. ඇතැම් අවස්ථාවලදී, තවත් ගොඩගැනීමට සිරුරු ඇතැයි නිරීක්ෂකයන් සැක කළත්, මහේස්ත්‍රාත්වරුන් නඩුව අවසන් කොට තිබේ.[154] මේ සැකය 2013 දීත් 2018 දීත් මන්නාරමේ දී පල වුණද, පොලිසිය ඉවත් වී තිබේ. මෙය පරිශ්‍ර අපවේශනයට මග පාදයි.

මානව හිමිකම් කඩවීමක් සිදුවූ කල්හි පලදායී විමර්ශනයක් සිදුකළ යුතු බව සමූහ මිනීවළ ආරක්ෂා කිරීම පිළිබඳ මුල් පෙලේ විශේෂඥවරියකද, බෝර්න්මත් මුලපත්‍රයේ සහ සංස්කාරක වරියකද වන මෙලනි ක්ලින්ක්නර් සඳහන් කර ඇත. තුන්වැනි පාර්ශවයක් (පළමුව ප්‍රතිචාර දක්වුවන්ද ඇතුළුව) විසින් සමූහ මිනීවළක් අපවේශනය හෝ ඇවිස්සීම සිදු කර නැති බව තහවුරු කරගැනීම පිණිස භූමියෙන් ලබාගත් සාක්ෂිවල විශ්වසනීයත්වය ආරක්ෂා කරගැනීමද මීට අයත් වේ.[155]

## 2.5 මාරුකිරීමේ 'මැරි ගෝ රවුම'

මළසිරුරු ගොඩගෙන පවත්වන පරීක්ෂණ ක්‍රියාවලියට බලපෑම් කිරීම පිණිස උත්සාහදරන රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ තවත් පොදු උපායක්වන්නේ මහේස්ත්‍රාත්වරුන්, පොලිස් නිලධාරීන් හෝ වෙනත් නිලධාරීන් මාරුකිරීම ය. 2023 වන විට මන්නාරමේ මළසිරුරු ගොඩගෙන කරන පරීක්ෂණවලට හත් දෙනෙකුට නොඅඩු මහේස්ත්‍රාත්වරුන් සංඛ්‍යාවක් සම්බන්ධවී ඇත.[156] කිහිපදෙනෙකු සාමාන්‍ය රාජකාරි ලේඛනය අනුව මාරුකර ඇති අතර අනෙක් අය දේශපාලන පීඩනය නිසා මාරුකර ඇතැයි වාර්තාවෙයි.

ඇතැම් අවස්ථාවලදී, උසාවි නඩුකර විශේෂයෙන් ඒවා උතුරු නැගෙනහිරට අදාළ සිදුවීම් වී ඇත්නම් ඔවුන් විසින්ම මාරුකර ඇත. උදාහරණයක් ලෙස දක්වන්නේ නම් 2000 වසරේ මැදදී, චෙම්මනි නඩුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත මාරුකරන ලද අතර එසේ කරන ලද්දේ තමන්ට යාපනය මහේස්ත්‍රාත් උසාවිය හමුවේ පෙනීසිටීමට ඇත්නම් තමන්ගේ ජීවිත ගැන බියක් පවතින බව යුද හමුදා නිලධාරීන් තර්කකිරීමෙන් පසුවය.[157] පෙත්සම්කරුවන් කොළඹට පැමිණීමට බියෙන් පසුවූ අතර එයට හේතුව ගමන්කිරීම පිණිස නිෂ්කාශන ලබාගැනීමට ඔවුන්ට තමන්ගේ ගමනෙහි අරමුණ යුද හමුදාවට එරෙහිව සාක්ෂිදීම පිණිස බව හෙළිකිරීමට සිදුව තිබීමයි.[3]

2018 දී මන්නාරමේ භූමිභාගය සම්බන්ධයෙන් කටයුතු කළ අධිකරණ වෛද්‍ය නිලධාරියා 2019 දී කොළඹට මාරුකරන ලදී. 2018 දී මන්නාරමෙන් සොයාගත් සමූහ මිනීවළෙන් ගොඩගත් සිරුරු හඳුනාගැනීමක් සිදුවී නැත. 2013 දී මිනී ගොඩගෙන පරීක්ෂණ සිදුකළ අධිකරණ වෛද්‍ය නිලධාරියා අනුරාධපුරයටත් පසුව මාතලේටත් යවන ලද අතර එහිදී ඔහුට රැස්කර ගත් මළ සිරුරු සම්බන්ධයෙන් විශ්ලේෂණ සිදුකර අවසන්කිරීමට නොහැකි විය.

මාතලේ සිද්ධියේදී, අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල් හඳුනාගැනීම පිණිස භාෂා ත්‍රයෙන්ම පුවත්පත්වල දැන්වීම් පළකරන ලෙස විනිශ්චයකාර චතුරිකා සිල්වා මහත්මිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝගකිරීමෙන් පසුව ඇය මෙම නඩුව ඇසීමෙන් මාරුකරනු ලැබුවාය.[159] නව විනිශ්චයකාරවරයා අතිරේක දිව්රුම්පත්‍ර බාරගැනීම ප්‍රතික්ෂේප කළ අතර එම දිව්රුම්පත්‍ර ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට යොමු කළේය. (ඉහත සඳහන බලන්න)[160] වල්පිට ගොවිපලෙහි සමූහ මිනීවළ ගැන පරීක්ෂණ ඉදිරියට සිදුකිරීම සම්බන්ධයෙන් පෞද්ගලික උනන්දුවකින් ක්‍රියා කළ මිනුවන්ගොඩ මහේස්ත්‍රාත්, පාලිත බණ්ඩාරනායක මහතා 1996 දී මාරුකරන ලද අතර, මෙම නඩුව මීගමුවට මාරුකරනු ලැබ පසුව අත්හැර දමා ඇත.[161]

ශ්‍රී ලංකාවේ නීතිය අනුව , සියලුම අධිකරණ වෛද්‍ය නිලධාරීන් (කොළඹ ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි හැර) සෑම වසර 4 කදී මාරුකළ හැකි ය. මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ ආරම්භ කර ඇති අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු මාරු කළ විට, ඔහු හෝ ඇය වෙනුවෙන් පත්කරන ලද නිලධාරියාට එය පවරාගැනීම දුෂ්කර ය. මෙය නිරාකරණය පිණිස 2018 වසර මුලදී අධිකරණ වෛද්‍ය සහ ධූලකවේද ආයතනයේ අධිකරණ වෛද්‍ය නිලධාරි මානවවිද්‍යා නැමති තනතුරක් ඇතිකරන ලදී. ඉන් අපේක්ෂා කරන ලද්දේ සමූහ මිනීවළවල් හමු වූ විට මෙම නිලධාරියාට නියෝග යොමු කරන අතර සමූහ මිනීවල සොයාගත් ප්‍රදේශය අවට අධිකරණ වෛද්‍ය නිලධාරීන් ඇතුළත් කණ්ඩායමක් පත්කරනු ලැබේ. මෙය ලියන අවස්ථාව වන විට, ආරම්භකර ඉදිරියට ගෙනයමින් පවතින මළසිරුරු ගොඩගෙන කරන පරීක්ෂණ නොමැති අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය රසායනාගාරයේදී සොයාගත් ඇතැම් සාම්පල සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුවෙමින් පවතී.



මහාචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල ඇතුළු වෝහාරික විශේෂඥයන් 1999 චෙම්මනි සමූහ මිනීවළ ආශ්‍රිත මෘතදේහ ගොඩගැනීමේ කාර්යයෙහි නියැලෙමින්





## 2.6 තාක්ෂණ ශිල්ප ඥානය

සමස්ත ලංකා ජනාධිපති පරීක්ෂණ කොමිසම, එහි අවසන් වාර්තාවෙන්, රටෙහි අධිකරණ වෛද්‍ය ධාරිතාව ශක්තිමත් කිරීමට පුළුල් පරාසයක පොදු නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර සමූහ මිනිවළවල්වලට අදාළ ඒවාද එයට ඇතුළත්වෙයි. 'අවශ්‍ය කුසලතා පවතින තෙක්' මිනී ගොඩගෙන පරීක්ෂණ නොපැවැත්වීම සහ ඩීඑන්ඒ ප්‍රගුණනය, පරිගණක ආශ්‍රයෙන් මුහුණු ප්‍රතිනිර්මාණය සහ පිළිගැනුම, වීඩියෝ අධිස්ථාපනකිරීම සහ මානවමිතික විශ්ලේෂණ ඇතුළු ව්‍යාධිවේදීන් සහ වෙනත් විද්‍යාඥයන් පුහුණු කිරීම පිණිස මානව හඳුනාගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම; සහ අතරතුර කාලයේදී , සමූහ මිනිවළවල් සම්බන්ධයෙන් වන තොරතුරු රැස්කිරීම සහ මෙම කාර්ය පැවරීම සඳහා උචිත ආයතනයක් යන කරුණු ද විශේෂඥයන් නිර්දේශ කර ඇත.[162]

මේවායින් කිසිම නිර්දේශයක් ක්‍රියාත්මක කර නැත.[163] ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිලධාරීන් අඩුලුහුඩුකම් පිළිබඳව දන්නා අතර, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහාය ඇතිව ඔවුහු ඇටසැකිලි නෂ්ටාවශේෂ විශ්ලේෂණය සඳහා මාර්ගෝපදේශ සකස්කරමින් සිටිති.[164] මෙම මාර්ගෝපදේශවලට අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ ස්ථාපිත ප්‍රශස්ත පරිචයන් ඇතුළත්වනු ඇති බව අපේක්ෂා කෙරෙයි.[165]

2020 දී සත්‍ය, යුක්තිය, හානිපූරණය සහ නැවත සිදුනොවීමේ වගකීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ශ්‍රී ලංකාවේ පොලීසියේ පවතින තාක්ෂණ ධාරිතාව ප්‍රමාණවත් නොවන බවත් එම තත්වය විමර්ෂණයක මුල් අදියරවලදී අසාර්ථකවීම්වලට තුඩුදෙන බවත් පෙන්වා දී ඇත.[166]

ඔහු ප්‍රකාශ කර ඇත්තේ:

'ලඝු නොවන පරීක්ෂණ මට්ටමේදී විමර්ශණ පටන්ගන්නා පොලිස් බලකායේ ප්‍රමාණවත් නොවන විමර්ශණ ධාරිතාවයේ සංකලනයක් ඇත; අධිකරණ වෛද්‍ය විශේෂඥතාව විසිර ඇත ; මධ්‍යගත ලේඛන හෝ ප්‍රලේඛන කළමනාකරණ ආධාර ලබාගැනීමට ප්‍රවේශයක් නැතිව ස්වාධීන උපදේශකවරුන් ලෙස වැඩකරන (අධිකරණ වෛද්‍ය නිලධාරීන් අතර) වගවීමක් නොමැතිවීම ; පරීක්ෂණයක මුල් අදියරවලදී නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉටුකරන සීමිත කාර්යභාරය හා එය ප්‍රගතියක් අත්කරගැනීම වැළැක්වීම. ප්‍රධාන නඩුවල සාක්ෂි සහ ලිපිලේඛන ස්වාභාවික ආපදාවලදී නැතිවීම ගැන වාර්තාවීම් සමඟින් තොරතුරු සංරක්ෂණය වැනි මූලිකාංග පවා නිතරම ප්‍රමාණවත් ලෙස නොපැවතීම. මේවා මෙම ද්‍රව්‍ය ඩිජිටල්කරණය සහ ආරක්ෂිත රැකවරණය යටතේ තැබීම වැනි කාර්යයන්ගෙන් වැළැක්විය හැකිවෙයි.'[167]

අධිකරණ වෛද්‍ය විශේෂඥයන් විසින් ඉටුකරනු ලබන තත්‍ය මිනී ගොඩගැනීම් අදාළ කාර්යයන් අනුව බලනවිට, 1994 දී සූරියකන්දේදී ගල්කටු සහ බුල්ඩෝසර් යොදාගැනීමේ සිට 2013 දී මාතලේ සහ 2013 දී සහ 2018 දී මන්නාරමේ දී වඩාත් වෘත්තීය අන්දමින් වැඩකිරීම දක්වා ක්‍රමවේද 'වැඩිදියුණුවී' ඇත. යම් දුරකට මෙය සිදුව ඇත්තේ අන්තර්ජාතික විශේෂඥයන් නිරීක්ෂකයන් ලෙස සම්බන්ධවීම , (යාපනය දිස්ත්‍රික්කයේ , 1999 දී චෙම්මනිදී අධිකරණ වෛද්‍ය මානව විද්‍යාඥයෙක් සහ අධිකරණ වෛද්‍ය ව්‍යාධිවේදියෙක්

ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙනුවෙන් නිරීක්ෂකයන් ලෙස සහ අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යාඥයෙක් සහ හදිසි මරණ පරීක්ෂකවරයෙක් මානව හිමිකම් සඳහා වන වෛද්‍යවරුන්[168] වෙනුවෙන් ක්‍රියා කළහ), ශ්‍රී ලාංකික අධිකරණ වෛද්‍ය විශේෂඥයන්ට විදේශ පුහුණුව ලබාදීම සහ සමූහ මිනීවළවල් පිහිටි භූමිවලදී අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීෂකයෙකු වශයෙන් ඉටුකරන සිය කාර්යභාරය සහ පුහුණුව ලබාදීම පිණිස විදේශ අධිකරණ වෛද්‍ය විශේෂඥයන් මෙරටට ගෙන්වා ගැනීම නිසාය.[169]

එසේවුවත්, ශ්‍රී ලංකාවේ තත්‍ය අධිකරණ වෛද්‍ය ධාරිතාව සීමිතව පවතින අතර යම් මිනී ගොඩගෙන පවත්වන පරීක්ෂණයක ප්‍රතිඵල පරීක්ෂා කිරීම පිණිස පිටරට යැවීමට සිදුව ඇත. චෙම්මනිහි ගොඩගත් මළසිරුරුවල අස්ථි සාම්පල DNA පරීක්ෂණ සඳහා ඉන්දියාවේ හයිද්‍රාබාද්හි අධිකරණ වෛද්‍ය විද්‍යා රසායනාගාරයට යැවූ අතර ඊළඟට DNA පරීක්ෂණ සඳහා එක්සත් රාජධානියට යවනු ලැබීය. ප්‍රසිද්ධ කළ වාර්තාවක් නැති අතර යම් වාර්තාවක් කිසිදිනක ලබාගත්තේදැයි යන්න ද පැහැදිලි නැත. 1996 දී , කොළඹ උපදේශක අධිකරණ වෛද්‍ය නිලධාරි බොල්ගොඩ වැවෙන් සහ අසල පිහිටි ගංගා දෙකකින් සොයාගත් මළසිරුරු 25 න් 21 ක හිස්කබල් (ඇමුණුම බලන්න) එක්සත් රාජධානියේ ග්ලස්ගෝ විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය සහ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය විශේෂඥ වෙත යවන ලද අතර එහිදී මළ සිරුරු හඳුනාගැනීමට මුහුණු ප්‍රතිනිර්මාණය සහ වීඩියෝ අධිස්ථාපනය භාවිත කර ඇත.[170] එතැන් සිට එවන් උසස් අධිකරණ වෛද්‍ය ශිල්පක්‍රම යොදාගත් බවක් දැනගැනීමට නැත.

එක් ජ්‍යෙෂ්ඨ අන්තර්ජාතික අධිකරණ වෛද්‍ය විශේෂඥයෙකු පෙන්වාදෙන්නේ වෙනත් රටවල් සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විශේෂඥයන් අතර ඔවුන්ගේ වාර්තා බාරදීමේදී සැලකිය යුතු ප්‍රමාද ඇති බවයි.[171] ඔවුන්ට කාලය ප්‍රමාණවත් නොවීම හෝ වෙනත 'හේතු නිසා මෙම ප්‍රමාද සිදුවිය හැකිය. උදාහරණයක් දක්වතොත්, මන්නාරමේ සතොස ගොඩනැගිල්ලේ ගොඩගත් මළසිරුරු සම්බන්ධයෙන් වූ අධිකරණ වෛද්‍ය වාර්තාව 2019 ජූනි 30 දා වන විට බාරදීමට නියමිතව තිබුණද 2023 මැයි දක්වා තවමත් එය බාරදී නැත. මෙම මිනී ගොඩගැනීම් පිළිබඳව සමීපව නිරීක්ෂණය කරන මූලාශ්‍ර සැකයෙන් පසුවන අතර ප්‍රමාදය ගැන ඉදිරිපත්කරන කරුණ ගැන අවිශ්වාසය පළකලත් ප්‍රමාදයට බල පෑ හේතු ලෙස සඳහන් කරන්නේ මිනී ගොඩගත් භූමියෙන් හමුවූ ඇතැම් මෙවලම් පරීක්ෂණ කණ්ඩායමට බාරදී නොමැති බවයි.[172]

අදාළ පාර්ශවකරුවන් අතර පවතින මන්දගාමී සම්බන්ධීකරණය සහ තත්කාර්ය පදනමින් විශේෂඥයන් පරීක්ෂණවලට මෙරටට ගෙන්වා ගැනීම සමග බැඳී පවතින ප්‍රමාදයන් ශ්‍රී ලංකාවේ සමූහ මනීවළවල් ගැන පරීක්ෂණ ඉදිරියට ගෙනයාමේදී නිරීක්ෂණය කරන ලද අභියෝග වෙයි.[173] හේතුව කුමක්දැයි සෑමවිටම පැහැදිලි නැතත්, උසාවි නියෝග අනුව කටයුතු කිරීමේදී විද්‍යාඥයෝ සහ පොලීසිය සෙමින් කටයුතු කරති. ඔවුන් සම්පූර්ණයෙන්ම යටකරදැමීමක් නිසා එය සිදුවිය හැකි නමුත් එයද දේශපාලන බලපෑම නිසා සිදුවූවක් විය හැකිය. උදාහරණයක් දක්වන්නේ නම්, 2015 දෙසැම්බර් මාසයේදී, පවුල් වෙනුවෙන් පෙනීසිටි නීතිඥයෝ ගොඩගත් මළසිරුරුවල සාම්පල ආර්ජන්ටිනාව, පේරු හෝ ගේතමාලා අධිකරණ වෛද්‍ය මානවවිද්‍යා කණ්ඩායම් වෙත යවන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අණ කරන ලෙස මහේස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලා සිටියහ. කෙසේවතත් රජයේ නීතිඥවරයා මීට විරුද්ධ වූ අතර මහේස්ත්‍රාත්වරයා නිල වශයෙන් එම ඉල්ලීම සලකා බැලුවේ නැත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අනික් අතින් සාම්පල ඇමරිකා එක්සත් ජනපදය වෙත යවන ලෙස උසාවියෙන් ඉල්ලා සිටියේය. අවසානයේ එම සාම්පල ඇමරිකා එක්සත් ජනපදය වෙත යවන ලදී.

පසුව, ගෝතමාලාවේ අධිකරණ වෛද්‍ය මානවවිද්‍යාඥයන් පිරිසක් ශ්‍රී ලංකාවේ නිල නොවන සංචාරයක යෙදුණු අතර පුහුණු කිරීම් ලබාදී ඇත. මන්නරමේ මිනීවලවල් තිබූ භූමිභාග කරා නොගිය ඔව්හු කිසිම මිනීගොඩගෙන කරන පරීක්ෂණයකට හෝ මළසිරුරු විශ්ලේෂණවලට හෝ සහභාගි නොවූහ.

කාබන් පරීක්ෂණ හෝ අස්ථි සාම්පලවල DNA පරීක්ෂණ සම්බන්ධයෙන් වන පටිපාටියේ රැස්කිරීම, සංරක්ෂණය සහ සාමාන්‍ය ක්‍රියාවලිය ගැන පැහැදිලිතාවයක් නැත. මාතලේ සමූහ මිනීවළ ගැන පරීක්ෂණ කොමිසමේ වැඩකටයුතුවලදී මෙය සිදුවූ අතර, එහිදී අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යාඥයාට සහ ව්‍යාධිවේදියාට කාට කුමන වගකීමක් ඇත්ද යන්න ගැන පැහැදිකමක් නොවීම සහ වැදගත් ලිඛිත සාක්ෂි අතුරුදහන් වී තිබූ අවස්ථාවල ඒ වෙනුවට ඔවුන්ට වාචික සාක්ෂි විශ්වාස කිරීමට සිදුවිය.[174]

අධිකරණ වෛද්‍ය පසුතලයක, ශ්‍රී ලංකාවේ මතුවී ඇති තත්ව පාලන ගැටළු විශේෂය විසඳනු ලබන්නේ රසායනාගාර ප්‍රතීතනය වැනි විනිවිදභාවයෙන් යුත් තාක්ෂණ, විද්‍යාත්මක සහ පරිපාලන ප්‍රතිචාර

මගිනි.[175] වර්තමානයේ තත්ව පාලනය පිණිස ක්‍රමවේදයක් නැති අතර එයට අර්ධ වශයෙන් බලපා ඇති හේතුවක් වන්නේ විශේෂිත කාර්ය මණ්ඩලයේ හිඟයයි. සාමාන්‍ය අපරාධ පරීක්ෂණවලින් දුරස්ථ වන මෙම විමර්ශන සඳහා වෙන්කරන ලද අරමුදල් නැත. සැකසහිත රැඳවුම් ස්ථාන සහ සමූහ මිනීවලවල් පිළිබඳ පරීක්ෂණවලට විශේෂයෙන් අධිකරණ වෛද්‍ය මානව විද්‍යාව සහ අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යාව ගැන අනුපූරක කුසලතාවලින් යුත් කණ්ඩායමක් අවශ්‍ය වෙයි. ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රවල අත්දැකීම් සහ විශේෂිතභාවයෙන් යුත් වෘත්තිකයන් නොමැති අතර මෙය අතුරුදහන්වූවන්ට අත්වී ඇති ඉරණම නිශ්චයකිරීමට ඇති බරපතල බාධකයක් බව තහවුරුවී ඇත.[176] හුදෙක් රහස්‍ය වාර්තාවක් ඉදිරිපත්කිරීමට විදේශ විශේෂඥයන්ට ආරාධනය කිරීමෙන් හෝ සාක්ෂි ලේඛනගත කිරීමේ බෙහෙවින් වැදගත් නිසි ක්‍රියාවලියක් සහතික කිරීමට සුළු විනිවිදභාවයකින් යුතුව සාම්පල පිටරට යැවීමෙන් විශ්වසනීයත්වය ඇති නොවන බව පැහැදිලි ය. ඒ වෙනුවට, අන්තර්ජාතික සහ දේශීය විශේෂඥයන් සම්බන්ධවන වත්මන් මහේස්ත්‍රාත් පරීක්ෂණ ක්‍රියාවලියට වඩා වෙනස් පටිපාටියක් යටතේ සඵලබව සනාථ වී ඇති සංසක්ති ප්‍රවේශයක් තිබිය යුතු ය.[177] වත්මන් නෛතික සහ ප්‍රතිපත්ති රාමුවට විශාල වෙනස්කම් සිදු නොකළ හොත් මෙය ඉටුකරගත නොහැකි දෙයකි.

## 2.7 සම්පත් සීමා කිරීම

දි මිනෙසෝටා මූලපත්‍රය ට අනුව සැකසහිත මරණ සම්බන්ධයෙන් පවත්වන පරීක්ෂණවලට සුදුසුකම්ලත් පරීක්ෂකයන් සහ අදාළ වන විශේෂඥයන් ඇතුළු ප්‍රමාණවත් තරමට මූල්‍ය සහ මානව සම්පත් අවශ්‍යවෙයි.[178] මුහුණු ප්‍රතිනිර්මාණය සහ වීඩියෝ අධිස්ථාපනයකිරීම මගින් 1996 දී මළසිරුරු හඳුනාගැනීමට දැරූ ප්‍රයත්නය නිසා බොල්ගොඩ වැවෙන් සහ අසල පිහිටි ගංගාවලින් හමුවූ මළසිරුරු පහක් හඳුනාගැනීමට හැකිවූ සිද්ධිය ඒකෝචිත ලෙස පවතී.[179]

එසේවුවත්, අධිකරණ අමාත්‍යාංශය ඉතා මෑතකදී මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීම පිණිස අරමුදල් සපයන ලෙසට කළ ඉල්ලීම් නොසලකා හැරියේය. උදාහරණයක් ලෙස දක්වන්නේ නම්, කලුවන්චිකුඩි[180] මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමට විශේෂඥයන් කණ්ඩායමකට ආධාර සැපයීම පිණිස අයවැයක් වෙන්කරගැනීම පිණිස අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු කළ ඉල්ලීමක් අධිකරණ අමාත්‍යාංශය නොසලකා හැරියේය. පරීක්ෂණ අතහැර දමන ලද අතර මේ දක්වා එවන් පරීක්ෂණ පැවැත්වීමක් සිදුවී නැත.[181]

අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ සිට, එය මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමේ ඇතැම් අංශවලට එය මුදල් ලබාදී ඇත. උදාහරණයක් ලෙස දක්වන්නේ නම්, කාබන් පරීක්ෂණ සඳහා මන්නාරමින් ගොඩගත් සිරුරුවල සාම්පල ෆ්ලොරිඩා වෙත යැවීමට එය මුදල් ගෙවීය. අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමට මූල්‍ය ආධාර සැපයූ අතර විමර්ශන ක්‍රියාවලියේදී මහජන විශ්වාසය දිනාගැනීමට සහ එම ස්ථානයෙන් ලබාගත් අස්ථි සහ දත් සාම්පලවලට අදාළ සාක්ෂි ආරක්ෂාකිරීමට අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ බාර දුන්නේය. අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය ආදර්ශ වශයෙන් දැක්වෙන අස්ථි සහ දත් සාම්පල හයක් විකිරණ කාබන් පරීක්ෂණ සඳහා ඇමරිකාවේ මයාමිහි රසායානාගාරයක් වන බෙටා ඇනලිකිටික් වෙත බාරදී ඇත. 2019 පෙබරවාරි මාසයේදී, කාබන් පරීක්ෂණයේ ප්‍රතිඵලවලින් යෝජනා කරන ලද්දේ එම මළසිරුරු ක්‍රිස්තු වර්ෂ 1450 සිට 1650 දක්වා ඓතිහාසික කාල පරිච්ඡේදයක මළසිරුරු බවයි.[182] අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලය මහේස්ත්‍රාත්වරයා ඉදිරිපත් කළ කරුණුවලින් නිර්දේශ කළේ වෙනත් පවතින තොරතුරු සියල්ල විශ්ලේෂණය අනුව කාබන් පරීක්ෂණයේ ප්‍රතිඵල සලකා බැලිය යුතු බවත් සවිස්තරාමක වාර්තාවක් සලකා බැලීමෙන් පසුව ඉදිරි විමර්ශණ ගැන නිගමනයකට එළඹිය යුතු බවත්ය. 2019 මාර්තු 22 දා විමර්ශන කණ්ඩායම සමග රැස්වීමකින් පසුව, මහේස්ත්‍රාත්වරයා කැනීම් නතර කරමින් නිකුත්කර තිබූ තාවකාලික නියෝගය සම්පූර්ණ විමර්ශකයන් කණ්ඩායම විසින් මහේස්ත්‍රාත්වරයාගේ නියෝග අනුව අවසන් කර ඇති කාබන් පරීක්ෂණයේ සහ වෙනත් පරීක්ෂණවල ප්‍රතිඵල ඇතුළු සවිස්තරාත්මක වාර්තාවක් බාරදීමට යටත්ව, දීර්ඝ කළේය.[183] මෙය ලියන වෙලාව වන තෙක් මෙම සවිස්තරාත්මක වාර්තාව බාරදී නොමැත.

## 2.8 නීතිපති කාර්යාලයේ කාර්යභාරය

නීතිපතිවරයාගේ කාර්යාලයේ ස්වාධීනත්වයක් නැතිකම ගැන දීර්කාලයක සිට ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සැලකිල්ලට භාජනයවී ඇත. මළසිරුරු ගොඩගෙන පරීක්ෂණ පැවැත්වීමේ සන්දර්භය තුළ, සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේ දුර්ලභ සිද්ධියේදී, නීතිපති දෙපාර්තමේන්තුව නඩු අත්හැරීමේ තීරණවලයට, සැකකරුවන් ඇපමත නිදහස්කිරීමට ඉඩදීමේදී, හෝ පවත්නා පටිපාටි ප්‍රමුඛතා අනුව පෙළගැස්වීමට අසමත්වීම ගැන කේන්ද්‍රීය වෙයි. උදාහරණයක් ලෙස දක්වන්නේ නම්, 1998 දී යාපනය දිස්ත්‍රික්කයේ චෙම්මනි සමූහ මිනීවළ කැනීමේදී පංච පුද්ගල කමිටුවක් අතුරුදහන්වීම් 15 ක් සම්බන්ධයෙන් වගකිවයුතු හමුදාවල සාමාජිකයන් හඳුනාගත් අතර යුද හමුදාවේ 4 දෙනෙක් අත්අඩංගුවට ගනු ලැබූහ. එම කමිටුවේ වාර්තාව කිසිදිනක ප්‍රසිද්ධියට පත් නොකරන ලදී. එවකට නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ මොහාන් පීරිස් ගේ නියෝග යටතේ, 2020 ජූලි මාසයේදී සැකකරුවෝ ඇපමත නිදහස් කරනු ලැබූහ.[184] එම සිව්දෙනා පසුව රැකියාවේ උසස්වීම ලදහ.[185]

ඒ හා සමානව 1995 දී, නීතිපතිවරයාගේ කාර්යාලය උසාවියේ පෙනී සිටීමට අසමත් වූ විට, කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා බොල්ගොඩ වැවේ සහ කොළඹ ආසන්නයේ වෙනත් ජල මාර්ගවල පාවී තිබූ මළසිරුරු 21 ට අදාළ සැකසහිත මරණ ගැන චෝදනා ලැබසිටි විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් තිදෙනාට එරෙහි නඩුව නිශ්ප්‍රභා කළේය. ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා පැවසුවේ නීතිපතිවරයාගේ කාර්යාලය උසාවියට පැමිණනොසිටීම 'යුක්තිය පසිඳලීමට' බාධාවක් බවයි.[186] පසුව නීතිපතිවරයාගේ කාර්යාලය ඔවුන්ට එරෙහිව ප්‍රමාණවත් සාක්ෂි නැති බව තීරණය කළ අතර ඒ වෙනුවට විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කළේය.[187] [188]

පටිපාටිකරවල මුල් අදියරවලදී නීතිපතිවරයාගේ කාර්යාලයේ නියෝජිතයන් නැවත නැවත ප්‍රමාදකිරීම් කර ඇත. උදාහරණයක් දක්වන්නේ නම්, චෙම්මනි පරීක්ෂණවලදී නැවත නැවතත් කළ ප්‍රමාදකිරීමේ ඉල්ලීම්වලින් මහේස්ත්‍රාත්වරුන් සහ වින්දිතයන්ගේ පවුල් වෙනුවෙන් පෙනීසිටින නීතිඥවරුන් අතර ඉච්ඡාභංගය ඇතිවීමට හේතුවිය.[189] එක් මානව හිමිකම් සංවිධානයක් නීතිඥවරයාගේ කාර්යභාරය කෙටියෙන් ප්‍රකාශ කළේ:

**ඔවුන් පැමිණ, ඔවුන්ගේ මාර්ගය සකස්කර ගෙන අනික් පාර්ශවයට ඉඩක් නොතබා මෙම ක්‍රියාවලිය පවරා ගන්නා අතර අනික් පාර්ශවයට සියල්ල මුල සිට ආරම්භකිරීමට සිදුව ඇත. එය ඕනෑකමින් සිදුකරන්නේ නඩුව දිග්ගැස්සීමටය. ඔවුන්ට පවුල් නම් කිරීමට සහ ලජ්ජාවට පත්කිරීමටද අවශ්‍යයි.**[190]

WGEID සහ සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ නැවත සිදුනොවීමේ වගකීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත යළි යළි නිර්දේශ කර ඇත්තේ නීතිපතිවරයාගේ කාර්යාලය ප්‍රතිව්‍යූහගතකිරීමක් සහ වඩාත් විශේෂිතව සමස්ත ලංකා කොමිෂම නිර්දේශ කළ පරිදි ස්වාධීන ජන අභියෝජන සේවාවක් පිහිටුවීමටය.[191] විශේෂ නියෝජිතයා ශ්‍රී ලංකා රජය දැඩිලෙස දිරිගන්වන්නේ,

**'වර්තමානයේ රජයේ අභිචෝදක සහ රජයේ නීතිඥ යන කාර්ය දෙකම කරන නීතිපති කාර්යාලය ප්‍රතිව්‍යූහගතකිරීමට සළකා බලන ලෙසයි. රජයේ**

නිලධාරීන් විසින් සිදුකරන ලද අපරාධ ආමන්ත්‍රණය කරන විට මෙම ද්විත්ව කාර්යය විසින් බැඳියා පිළිගැටුම් නිර්මාණය කිරීමේ අවදානම් ඇත. පරීක්ෂණ දිගටම පවත්වාගෙනයාමට හෝ අත්හිටුවීමට සහ භාෂාමය සහ වාර්ගික වශයෙන් විවිධ වූ සහ කිපෙන සුලු සමාජයක, අපරාධ පටිපාටි සඳහා ස්ථාන නියම කිරීමට නීතිපතිවරයාට ඇති අධිබලය නඩුවක ප්‍රගතියක් අත්කරගන්නේද යන්නේදී මුළුමනින්ම පාහේ නිශ්චයීය කාර්යභාරයක් ඉටුකරන අතර එය විශාල වශයෙන් හේතුව නොකිවහැකි සහ දුෂ්කරතාවලින් සංයුක්තය.' [192]

බොහෝ සිවිල් සමාජ ද ස්වාධීන අභියෝජක කාර්යාලයක් පිහිටුවීම වෙනුවෙන් දශක ගණනාවක සිට කතා කරයි. කෙසේවුවත්, වරින්වර බලයට පත්වූ රජයන්ගෙන් මේ සම්බන්ධයෙන් ව්‍යාපාරයක් ආරම්භවී නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයෙන් නීතිපතිවරයා පත්කිරීම සහ ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම දේශපාලනීයකරණය කළ අතර එසේවූයේ තනතුරකට පත්කිරීමට හා පහකිරීමට බලය ඇත්තේ ජනාධිපතිවරයාට බව සහතික කිරීමෙනි.[193] 21 වැනි සංශෝධනය මෙය තරමක් ආපස්සට ගත් අතර තවමත් පත්කිරීම් සිදුකිරීම පාලනය හිමි පක්ෂය විසින් පත්කරන ලද තැනැත්තන්ගේ ආධිපත්‍යය ඇති ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශයට යටත්ව සිදුවෙයි.

# 3. නිගමන සහ නිර්දේශ

ප්‍රධාන ජාත්‍යන්තර අපරාධ සහ අනෙකුත් බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සිදු වූ විට, කවදා, කුමන ගැටුමකදී ඒවා සිදුවූවාද යන්න නොතකා එවැනි දෑ සම්බන්ධයෙන් වගඋත්තරදායකත්වය සහතික කිරීමට ශ්‍රී ලංකා රජයට ඇති නොහැකියාවට හෝ නොකැමති බවට, මෘතදේහ ගොඩගැනීමේදී සිදුවූ බහුවිධ අසමත්වීම තවදුරටත් සාක්ෂි සපයයි. මෙය වින්දිතයන්ට සත්‍යය දැනගැනීම ඇති අයිතිය ඇතුළුව ඔවුන්ගේ අයිතිවාසිකම් පූර්ණ වශයෙන්ම උල්ලංඝනය කිරීමකි. බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස සිදු වූ සමූහ සුසාන බිම් පිළිබඳ විමර්ශනයන්ද ඇතුළත්, අපයෝජනයට ලක්වීමට හේතු සහ පසුබිම් තත්වයන් පිළිබඳ තොරතුරු සොයන පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සැපිරීම සඳහා ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය බැඳී සිටී. සමූහ සුසාන සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී සාධනීය සහ සහනදායී ක්‍රියාමාර්ග ගැනීමට ජාත්‍යන්තර නීතිය යටතේ රජය බැඳී සිටියි.  සිදුවූයේ කුමක්ද සහ එය සිදු වූයේ ඇයිද යන්න පිළිබඳව වින්දිතයන්ගේ පවුල්වලට ඇති ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමටද ඍජුව සහ වක්‍රව වගකිවයුත්තන් හඳුනා ගැනීමට සහ අපයෝජන රටාවන් තේරුම් ගැනීමටද අවශ්‍ය සාක්ෂි එක්රැස් කිරීම සඳහා අපයෝජනයන් විමර්ශනය කිරීමට අදාළ අඛණ්ඩ හා ක්‍රමානුකූල ප්‍රයත්නයන්ද ඇතුළත්ව සමූහ මිනීවළවල් විමර්ශනය කිරීම සම්බන්ධයෙන් සාධනීය සහ සහනදායී ක්‍රියාමාර්ග ගැනීමට ජාත්‍යන්තර නීතිය යටතේ රජය බැඳී සිටියි.[194]

මෘත ශරීරවල ඒකාග්‍රතාවත්, ඒ ආශ්‍රිත සාක්ෂි සහ අදාළ විමර්ශනයන් සුරක්ෂිත කිරීමත් සඳහා සමූහ සුසාන ඇති ස්ථාන ආරක්ෂා කිරීම ජාත්‍යන්තර නීතිය යටතේ ප්‍රමුඛතම කාර්යයකි. මිනිස් අස්ථි ශේෂයන් දූෂ්‍යවීම, කෙලෙසීම හා සොරාගැනීම වැළැක්වීමත්, මිනී භාරාවුස්සන්නන්ගෙන් සහ ද්විතියික ස්ථානවලට සිරුරු ගෙනයාමෙන්/ප්‍රතිස්ථාපනය කිරීමෙන් හඳුනාගැනීමෙන් වැළකී සිටීමට උත්සාහ කරන අපරාධකරුවන්ගෙන් ආරක්ෂා කරගැනීමත් අදාළ ආරක්ෂණ ක්‍රියාමාර්ගයන් මගින් සුරැකිය යුතු ය.

යම් රාජ්‍යයකට ඒ සඳහා දේශපාලන අධිෂ්ඨානයක් නොමැති නම් හෝ එම වගකීම ඉටු කිරීමට නොහැකි නම්, ඒ සඳහා සහාය වීමට ජාත්‍යන්තර ප්‍රජාවට වගකීමක් ඇත. රාජ්‍ය ආයතනයක් ලෙස අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයට වින්දිතයන්ගේ පවුල්වලට සහය වීමට සහ ස්වාධීන විනිවිදභාවයකින් එම කාර්යභාරය ඉටු කිරීමට නොහැකි නම්, ඔවුන්ට සහාය වීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ අතුරුදහන්වූවන් පිළිබඳ අන්තර්ජාතික කොමිසම ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව මැදිහත් විය යුතුය.

මෙම වාර්තාව මගින් හඳුනාගෙන ඇති (පවුල්වල සහභාගීත්වයෙහි ඌනතාව, සීමිත වෝහාරික ශක්‍යතා, නොපැහැදිලි කාර්ය පටිපාටි, දේශපාලන මැදිහත්වීම් යනාදී) බහුතරයක් අසමත්වීම්, ජාත්‍යන්තර සහ දේශීය නීතිය උල්ලංඝනය කිරීමක් වන සත්‍යය දැනගැනීමට වින්දිතයන්ට ඇති අයිතිය වැළැක්වීමට රජය විසින් සිතාමතා ගනු ලබන පියවරයන්ට සමාන වේ. බලහත්කාරී සහ නොකැමැත්තෙන් සිදුකෙරෙන අතුරුදහන්කිරීම් සම්බන්ධ අන්තර්ජාතික ක්‍රියාකාරී කණ්ඩායම, සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ පුනරාවර්තනය නොවීම සහතික කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරයා ද ඇතුළත් එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියාපටිපාටි ආයතන මගින් මෙකී අසමත්වීම් වාර්තා කර තිබේ. විශේෂ නියෝජිතයා මෙසේ නිගමනය කරයි:

**“ශ්‍රී ලංකාව වැනි අතරමැදි ආදායම් සහිත රටක එවැනි**

ප්‍රශ්න තිබීම අසාමාන්‍ය වේ."[195] "සංස්ථාපිතයේ අපරාධ, එනම් වෙනත් වචනවලින් කිවතොත් ජාත්‍යන්තර මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය මහා පරිමාණයෙන් උල්ලංඝනය කිරීම සහ අපහරණය කිරීමේ ප්‍රතිඵලය අත්කර දෙන්නා වූ, රාජ්‍ය උපාංග ක්‍රමානුකූලව හා සම්බන්ධීකරණයක් මගින් සිදුකෙරෙන අපරාධ පිළිබඳ විමර්ශනය කිරීම සහ අභිචෝදනය සම්බන්ධයෙන් දැනට ඇති ප්‍රමාණවත් නොවන ප්‍රවීණතාව වැඩි දියුණු කරගැනීමට ශ්‍රී ලංකාව කටයුතු කළ යුතු ය. විමර්ශන සඳහා විශේෂිත ප්‍රවීණතාවත්, වෝහාරික විද්‍යාව සහ අභිචෝදක උපාය මාර්ගයන් නිර්මාණය කිරීමත් මීට ඇතුළත් වනු ඇත. සංස්ථාපිතයේ අපරාධ පිළිබඳ අධිකරණමය ශක්‍යතා පුළුල් කිරීමත් අත්‍යවශ්‍ය සහ හදිසි කටයුත්තකි."[196]

OMP විසින් කරන ලද කාර්යය ඇතුළුව, 2017 සහ 2020 වසරවල එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා අවසන් වරට ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ සිට මේ දක්වා යම් ප්‍රගතියක් ලබා ඇතත්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා ස්ථාපිත නිවැරදි භාවිතාවන්ට අනුකූලව මෘතදේහ ගොඩගැනීම සිදුකෙරෙන බව සහතික කිරීම සඳහා තවත් බොහෝ දේ කිරීමට ඉතිරිව තිබේ.
අනාගත පරම්පරාවන් වෙනුවෙන් සහ කාල සීමාවලින් ඔබ්බට ගොස් සමූහ මිනී වළවල් හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම සහ විමර්ශනය කිරීම ඇතුළුව ඒවා කළමනාකරණය කිරීම සඳහා නිශ්චිත නීතියක් සහ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව විසින් බලාත්මක කළ යුතු ය. රාජ්‍ය සහ ප්‍රාදේශීයබඳ අධිකාරීන්, පවුල් සහ සැළකිල්ලක් දක්වන ප්‍රජාවන්ගේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් නෛතික ව්‍යුහයක් ස්ථාපනය කිරීම මෙයට ඇතුළත් විය හැකි අතර ඒ සඳහා අන්තර්ජාතික රතු කුරුස කමිටුව හෝ අතුරුදහන්වූවන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම වැනි ජාත්‍යන්තර ඒජන්සියක් නියෝජනය කරන විශේෂඥයකු ද ඇතුළත් කරගත හැකි ය. එවැනි අධිකාරියක්, දේශපාලනඥයන් රහිත පාරදෘෂ්‍ය එකක් විය යුතු ය.

# 3.1. අතීත මෘතදේහ ගොඩගැනීම් ප්‍රතිස්ථාපනය සඳහා නිර්දේශ

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගතයුතු යඃ

1. හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම සහ විමර්ශනය ඇතුළත් වන ලෙස සමූහ මිනීවළවල් කළමනාකරණය සහ මෘතදේහ ගොඩගැනීම් පිළිබඳ නිශ්චිත නීතියක් සහ ප්‍රතිපත්තියක් බලාත්මක කිරීම; සංරක්ෂණ ක්‍රියාවලියට සොහොන්වලින් හෝ පසෙන් ඉවත් කරන ලද අස්ථි ශේෂයන් ආරක්ෂිතව ගබඩා කිරීම ඇතුළත් විය යුතු අතර භාරකාරත්ව දාමය නිරුපද්‍රිත බවට සහතික විය යුතුය;

2. සමූහ මිනීවළවල් සහ මෘතදේහ ගොඩගැනීම් පිළිබඳ කාරණය අධීක්ෂණය කිරීම සඳහා රජයේත්, ප්‍රාදේශීයබඳ අධිකාරීන්ගේත් නියෝජිතයන්ගෙන්ද, වෝහාරික විශේෂඥයන්ගෙන් ද, පවුල් සහ මේ පිළිබඳ සැලකිල්ලක් දක්වන ප්‍රජාවන්ගෙන් ද සැදුම්ලත් නෛතික ආයතනයක් පිහිටුවීම;

3. පිළිතුරු බලාපොරොත්තුවෙන් සිටින ඥාතීන් වෙනුවෙන් සෑම මෘතදේහ ගොඩගැනීමක් හා සම්බන්ධව පවුල් සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කිරීම;

4. ගොඩගත් මෘතදේහ අතර තම ඥාතීන් සිටින බවට සැක කරන පුද්ගලයන් සමග සක්‍රීයව සම්බන්ධ වී, ඔවුන්ගේ පූර්ණ අනුමැතිය ඇතිව පූර්ව මරණ පරීක්ෂණ දත්ත සහ DNA රැස් කිරීම;

5. අස්ථි ශේෂයන් සහ සන්තකව තිබූ දේවල් හා ඒ දක්වා සොයාගන්නා ලද භාණ්ඩ හඳුනා ගැනීමට ඥාතීන්ට අවස්ථාවක් ලබා දීම; හඳුනාගන්නා ලද කවර හෝ භාණ්ඩයක් වේ නම් ඒවා ඔවුන්ගේ පවුල්වලට පෙරළා ලබාදීම;

6. සමූහ මිනී වළවල් පිළිබඳ විමර්ශන ඇතුළුව බලහත්කාර අතුරුදහන්වීම් පිළිබඳ විමර්ශන ක්‍රියාවලියට අවහිර කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අය, 2018 බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතෙහි 12 (4) වගන්ති ප්‍රකාරව, නීතිය හමුවට ගෙන ඒම;

7. අතුරුදහන් වූවන්ගේ පවුල්වල සමීප උපදේශනයෙන් සහ සහයෝගීතාවයෙන්, මේ දක්වා සිදු කරන ලද සියලුම මෘතදේහ ගොඩගැනීම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම, සොයාගැනීම් සම්පූර්ණයෙන් ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම;

8. ජාත්‍යන්තර විශේෂඥයන්ද ඇතුළත්ව, යෝජිත නීතිමය රාමුව, ප්‍රතිපත්ති සහ සමූහ මිනී වළවල් පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සම්බන්ධයෙන් පාරදෘශ්‍ය බවින් යුතු උපදේශන ක්‍රියාවලියක් පැවැත්වීම සහ එකී සමූහ මිනී වළවල් පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියද ඇතුළුව සෑම ව්‍යුහයක් සහ ප්‍රතිපත්තියකටම මිනසෝටා සහ බෝන්මත් මූලපත්‍රවල (Minnesota and Bournemouth Protocols) ප්‍රතිපාදන පූර්ණ වශයෙන්ම ඇතුළත් කිරීම;

9. සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ගෞරවනීයව හා නීත්‍යානුකූලව ක්‍රියා කිරීම පටිපාටිමය (එනම් පීඩාවට පත් වූවන්ට ඔවුන්ගේ අවශ්‍යතා සහ ඉල්ලීම් ප්‍රකාශ කිරීමට අවශ්‍ය තත්ත්වයන් නිර්මානය කිරීම මගින්) සහ නියමාකාර (එනම් ප්‍රතිවිරුද්ධතා, ගැටුම් සහ ආතතීන් තුලනය කිරීම මගින්) යන දෙයාකාරයෙන්ම රාජ්‍ය බලධාරීන් අවබෝධ කර ගත් බව සහතික කරගැනීම; ඒ සඳහා " නිදහස්, පූර්ව සහ දැනුවත් කැමැත්ත" යන ප්‍රමිතීන් හරහා තහවුරු කරගත් වින්දිතයින්ගේ පවුල්වල සහ සමූහ මිනීවළවල් පිහිටා ඇති ඉඩම් අයත් වන්නාවූ ප්‍රජාවන්ගේ සක්‍රීය, අර්ථවත් සහභාගීත්වය අවශ්‍ය කෙරේ;

10. අත්තනෝමතික ඝාතන සහ අතුරුදහන් කිරීම් ඇතුළු සමූහ මිනී වළවල පැවැත්ම හා සම්බන්ධ

බහුවිධ උල්ලංඝනයන් විමර්ශනය කිරීම තුළින් සත්‍යය සඳහා පවුල්වලට ඇති අයිතිවාසිකමට රාජ්‍ය සහ වෙනත් පාර්ශ්ව බැඳී සිටින බව රජය පිළිගන්නා බවට සහතික කිරීම;

11. විශේෂයෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් සමග සම්බන්ධවීමේදී වින්දිත පවුල්වලට මනෝ-සමාජ සහාය සම්පාදනය කෙරෙන බවට සහතික කිරීම. මානසික සෞඛ්‍ය තත්ත්වයන්ට ප්‍රතිකාර ලබාදීම, ආගමික සහාය, සමාභිලාෂී කණ්ඩායම්වල සහයෝගය මෙන්ම පවුල්වල සහාය ද මීට ඇතුළත් විය යුතු ය. පහසුවෙන් ලබාගත හැකි සේවාවන්හි ගුණාත්මක බව පිළිබඳ ඇති නිශේධනාත්මක ආකල්ප, සෙසු ජනයාගේ විනිශ්චයට පාත්‍රවීම පිළබඳ හැඟීම්, පහසුවෙන් ලබාගත හැකි සේවාවල ඌනතාව සහ උපකාර ලබාගත හැක්කේ කොහෙන්දැයි නොදැන සිටීම යන කරුණු නිරන්තරයෙන් හමුවන බාධක වේ. අවශ්‍ය වන්නේ අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට ප්‍රායෝගික සහ තොරතුරුමය සහයෝගය මෙන්ම විමර්ශන, සමූහ සුසාන සහ මෘතදේහ ගොඩගැනීම් යනාදිය සම්බන්ධව කටයුතු කිරීමේදී ඥාතීන් හා සමීපව කටයුතු කිරීම ඇතුළු අතුරුදහන්වූ ඥාතියකු සෙවීමේ සමස්ත ක්‍රියාදාමය තුළ භාවමය සහයෝගීතාව සැපයීමයි;

12. අනාවරණය කරගැනීමේ, මෘතදේහ ගොඩගැනීමේ සහ අස්ථි ශේෂයන් සම්බන්ධ වෝහාරික විශ්ලේෂණයේ සෑම අදියරකදීම, මහේස්ත්‍රාත්වරයාගේ, ප්‍රදේශබද පොලිසියේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ සහ තනි පුද්ගල අධිකරණ වෛද්‍ය විශේෂඥයන්ගේ (ප්‍රාදේශීය අධිකරණ වෛද්‍ය නිළධාරී, ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය නිළධාරී, වෝහාරික මානව විද්‍යාඥයන්, පුරාවිද්‍යාඥයන්, විකලාංග දන්ත ශල්‍යවෛද්‍යවරුන් සහ අනෙකුත් විශේෂඥයන් ඇතුළුව) පුද්ගල වගකීම් සවිස්තරාත්මකව විදහා දැක්වීම;

13. සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ද ඇතුළුව රට තුළ අධිකරණ වෛද්‍ය ධාරිතාව ශක්තිමත් කිරීම සහ "අපේක්ෂිත ප්‍රවීණත්වය අත්කර ගන්නා" තෙක් මෘතදේහ ගොඩගැනීමෙන් වැළකී සිටීමට සහ DNA ආකෘති ගොඩනැංවීම, පරිගණකගත මුහුණු ප්‍රතිනිර්මාණය හා හඳුනාගැනීම, වීඩියෝ අධිස්ථාපනය සහ මානවමිතික විශ්ලේෂණය ඇතුළුව ව්‍යාධි විද්‍යාඥයන් සහ අනෙකුත් විද්‍යාඥයන් පුහුණු කිරීම සඳහා මානව හඳුනාගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට දීප ව්‍යාප්ත ජනාධිපති විමර්ශන කොමිසමේ ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ ඒ අතරතුර සමූහ මිනීවළවල් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ එය එසේ කිරීම සඳහා සුදුසු ආයතනයකට පැවරීම. සමූහ මිනී වළවල් සොයා ගැනීමට සහ කළමනාකරණයට විශාල පරාසයක පැතිරුණ ඩිජිටල් තාක්ෂණය වැඩි වැඩියෙන් දායක වේ. චන්ද්‍රිකා ඡායාරූප, ඩ්‍රෝන ඡායාරූපකරණය, LiDAR, භූ අවකාශ විශ්ලේෂණය සහ තාපරූපනය[197] මෙයට ඇතුළත් වේ. සුසාන බිම් හඳුනා ගැනීමට සහ ඇතැම් විට ඒවා කාල නිර්ණය කිරීමට මෙම නව තාක්ෂණයන් භාවිතා කරයි. සොයාගත් සොහොන් ආකූල නොකරනු වස් ඒවා සොයා ගැනීමේ රහස්‍යබව රැක ගැනීමේ හැකියාවද ඒවායින් සපයයි.[198]

14. නව නෛතික සහ ප්‍රතිපත්තිමය රාමුව ස්ථාපනය කොට, වෝහාරික ධාරිතාව පූර්ණ වශයෙන්ම ශක්තිමත් කරන තෙක් අලුතෙන් මෘත දේහ ගොඩගැනීමේ කටයුතු ක්‍රියාවට නැංවීමෙන් වැළකී සිටීම;

15. ඕනෑම මෘතදේහ ගොඩගැනීමකදී ජාත්‍යන්තර නිරීක්ෂකයන් සිටීම සහ කාර්යයේ සංකීර්ණත්වය මත අවශ්‍ය සෑම විටම ජාත්‍යන්තර වෝහාරික වෛද්‍ය විශේෂඥයන් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීමට කැපවීම;

16. මෘතදේහ ගොඩගැනීම් හේතුවෙන් සිදුවන ඕනෑම නඩු පැවරීමක් ස්වාධීන හා අපක්ෂපාතී ආකාරයකින් සිදු කෙරෙන බව සහතික කිරීම සඳහා, නීතිපති කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ස්වාධීන මහජන අභිචෝදන සේවාවක් ඇති කිරීම;

17. ශ්‍රී ලාංකීය සමාජයේ වාර්ගික සහ ආගමික බහුවිධභාවය හඳුනා ගත යුතු අතර මෙම ප්‍රජාවන්ට ඔවුන්ගේම විවිධ චාරිත්‍ර වාරිත්‍ර සහ භාවිතයන් ඇති අතර විශේෂයෙන් මරණයට හේතුව ප්‍රචණ්ඩකාරී හෝ නිශේධනය කරන අවස්ථාවන්වලදී එවැනි දේ ශෝකය සහ අභිමිවීම් ඇතිකරලන ව්‍යාකුලත්වය මධ්‍යයේ සැනසීම ලබා දෙයි. ආගමික නිදහස, විශ්වාසය හෝ ප්‍රකාශනයේ නිදහස ඇතුළුව ඔවුන්ගේ මානව හිමිකම් ක්‍රියාත්මක කිරීමට අදාළ වන පරිදි, මෙම සිරිත් විරිත් සහ චාරිත්‍ර වාරිත්‍ර නිරීක්ෂණය කිරීමට රාජ්‍යය බැඳී සිටී;

18. සිවිල් සමාජය සහ අතුරුදහන් වූවන්ගේ පවුල් සමඟ පූර්ණ උපදේශනයෙන් පසු, ශ්‍රී ලංකාවේ මූලික වාර්තාව, බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් පිළිබඳ කමිටුව වෙත යැවීම. මෙය අතුරුදහන්වීම් වැලැක්වීම සහ ඒවාට පිළියම් යෙදීම සම්බන්ධයෙන් රටේ තත්ත්වය පිළිබිඹු කිරීමේ මගක් ද වේ.

19. අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයේ විමර්ශනවල සොයාගැනීම් 'කිසිදු සාපරාධී හෝ සිවිල් වගකීමක් ඇති නොකරන' බව පවසන එම පනතේ 13 (2) වගන්තිය අවලංගු කිරීම සහතික

කිරීම;
20. මහේස්ත්‍රාත්වරු සමග සහයෝගයෙන් කටයුතු නොකිරීම සහ මහේස්ත්‍රාත්වරයකුගේ නියෝග ක්‍රියාත්මක නොකිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කිරීම;

21. දැඩි ලෙස ප්‍රමාදිත කාර්යයක් වූ, මෘතදේහ ගොඩගැනීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම; මෙහිදී ජාතික සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ප්‍රතිපත්තියේ කොටසක් ලෙස කේවල නියෝජිතායතනවල කාර්යභාරය පැහැදිලි කරමින් එම කෙටුම්පත සකස් කළ යුතු ය.

22. භාරකාරත්වයේ දාමය සම්බන්ධයෙන් සලකිලිමත්වීම සහතික කිරීම සහ අධිකරණ ක්‍රියාවලියේදී සාක්ෂිවල පිළිගත හැකි බව අවදානමට ලක් නොවන බව සහතික කිරීම සඳහා ගනු ලබන පියවර පිළිබඳ ප්‍රතිපත්ති ලේඛනයක් විස්තරාත්මකව ප්‍රකාශයට පත්කිරීම;

23. යෝජිත මරණ පරීක්ෂණ පිළිබඳ පනත බලාත්මක කිරීම;

24. වින්දිතයන්, ඔවුන්ගේ ඥාතීන් සහ සාක්ෂිකරුවන් තර්ජන, බිය ගැන්වීම්, හිරිහැර කිරීම් සහ පළිගැනීම්වලට එරෙහිව නීතියෙන් සහ ප්‍රායෝගිකව ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා 2015 අංක 4 දරන අපරාධවලට ගොදුරුවූවන් සහ සාක්ෂිකරුවන්ට සහය දැක්වීමේ සහ ආරක්ෂා කිරීමේ පනත තවදුරටත් සංශෝධනය කිරීම සහ වින්දිතයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ පවතින පිළියම් පිළිබඳ තොරතුරු සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් ඇති බවට සහතික වීම. [199]

## 3.2. ඉදිරියේදී මෘතදේහ ගොඩගැනීම් සඳහා OMP වෙත සහ ICRC හා ICMP ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව[200] වෙත නිර්දේශ

1. වෙනත් සමූහ මිනීවළවල් තිබීමට ඉඩ ඇති ස්ථාන පිළිබඳව සොයා බැලීම සඳහා වෘත්තීයමය වශයෙන් නිපුණතා සහිත විශේෂඥ ඒකකයක් පිහිටුවා, ඒවායේ වෝහාරික වෛද්‍ය ධාරිතාව ශක්තිමත් කිරීම සහ DNA පරීක්ෂාව ඇතුළුව ප්‍රමාණවත් සම්පත් එහි ඇති බව සහතික කිරීම;

2. අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, සමූහ මිනීවළවල් තිබීමේ විභවයක් ඇති සියලුම ස්ථාන පරීක්ෂා කර, බෝන්මත් මූලපත්‍රයෙහි (Bournemouth Protocol) දක්වා ඇති පියවරයන්ට අනුකූලව, ඒවායේ ආරක්ෂාව සහතික කිරීම සඳහා දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම;

3. ධුර කාලයෙහි සුරක්ෂිතබව, සේවා කොන්දේසි, පිරිස් පරිපාලනය සහ උසස්වීම් හා සේවයෙන් පහකිරීම් ඇතුළු අධිකරණයේ විනය කටයුතු මෙන්ම ජාත්‍යන්තර අපරාධ පිළිබඳ පුහුණුව ඇතුළුව, අධිකරණයේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම.

# ඇමුණුම: සමූහ සුසාන පිළිබඳ තොරතුරු

**1**

**දිනය** : 1989

**ස්ථානය** : හෝකන්දර, කොළඹ දිස්ත්‍රික්කය

**පසුබිම** : 1987-89 ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල සමයේ සිරුරු

**සොයාගන්නා ලද ශේෂයන්** : සිරුරු 19 කි. සියලුම වින්දිතයන්ගේ නම් දනී.[201]

**වර්තමාන තත්ත්වය** : සිද්ධිය පිළිබඳව බස්නාහිර, දකුණ සහ සබරගමුව කොමිසම් සභාවේ අවසාන වාර්තාවේ දෙවැනි වෙළුමේ දැක්වෙන සවිස්තර සාරාංශයකට අනුව, වින්දිතයන් වන්නේ 1989 අගෝස්තු 13 වැනිදා සහ ඊට පසු සතියේ අත් අඩංගුවට ගන්නා ලද පුද්ගලයන් ය. ඒ දිනය ජනතා විමුක්ති පෙරමුණ විසින් ඝාතනය කරන ලද ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති ගේ පියාගේ අවසන් කටයුතු සිදුකෙරුණු දිනයයි. එදිනම අමරගොඩ - හෝකන්දර පාරේ බෝම්බයක් ද පුපුරා ගොස් තිබුණි.[202] මරා දමනු ලැබුවන්ගේ සිරුරු පොලිස් ස්ථානාධිපතිගේ පියාගේ හත් දවසේ දානය දා බෝම්බය පුපුරා ගිය වළට දමා පුළුස්සන ලදී. එම සිරුරු මහේස්ත්‍රාත් නියෝගයකින් ගොඩගන්නා ලද බව බස්නාහිර, දකුණ සහ සබරගමුව කොමිසමේ අවසන් වාර්තාවේ පළමු වෙළුමේ තහවුරු කෙරෙතත්, ඒ පිළිබඳ වැඩිදුර විස්තර නැත.[203]

**2**

**දිනය** : 1989

**ස්ථානය** : අංකුඹුර, මහනුවර දිස්ත්‍රික්කය

**පසුබිම** : 1987-89 ජවිපෙ කැරැල්ල සමයේ සිරුරු.

**සොයාගන්නා ලද ශේෂයන්** : 39

**වර්තමාන තත්ත්වය** : මේ මිනීවල පිළිබඳව බස්නාහිර, දකුණ සහ සබරගමුව කොමිසමේ අවසන් වාර්තාවෙන් තහවුරු කෙරේ. එම සිරුරු මහේස්ත්‍රාත් නියෝගයකින් ගොඩගන්නා ලද බව කොමිසම සඳහන් කරයි.[204]

## 3

**දිනය** : 1989

**ස්ථානය** : නිකවැරටිය, කුරුණෑගල දිස්ත්‍රික්කය

**පසුබිම** : 1987-89 ජවිපෙ කැරැල්ල සමයේ සිරුරු

**සොයාගන්නා ලද ශේෂයන්** : 20

**වර්තමාන තත්ත්වය** : මෙම වළ පිළිබඳව බස්නාහිර, දකුණ සහ සබරගමුව කොමිසමේ අවසන් වාර්තාවෙන් තහවුරු කෙරේ. එම සිරුරු මහේස්ත්‍රාත් නියෝගයකින් ගොඩගන්නා ලද බව කොමිසම සඳහන් කරයි.[205] ගොඩගැනීමෙන් පසුව සිරුරුවලට කුමක් වීදැයි දැනගන්නට නැත.

## 4

**දිනය** : 1989

**ස්ථානය** : විල්පිට, අකුරැස්ස, මාතර දිස්ත්‍රික්කය

**පසුබිම** : 1987-89 ජවිපෙ කැරැල්ල සමයේ සිරුරු

**සොයාගන්නා ලද ශේෂයන්** : මළ සිරුරු සංඛ්‍යාව නිශ්චිතව දැනගන්නට නැත.

**වර්තමාන තත්ත්වය** : බස්නාහිර, දකුණ සහ සබරගමුව කොමිසමේ අවසන් වාර්තාවට අනුව, මිනීවල ඇත්තේ යුද හමුදා කඳවුරක් පිහිටි ස්ථානයේය.[206]

## 5

**දිනය** : 1990

**ස්ථානය** : වවුල්කැලේ, ගම්පහ දිස්ත්‍රික්කය

**පසුබිම** : ජවිපෙ කැරැල්ල සමයේ සිදු වූ අවසාන සමූහ ඝාතනය ලෙස සැළකේ.

**සොයාගන්නා ලද ශේෂයන්** : වවුල්කැලේ රක්ෂිතය තුළ 12 දෙනකු ඝාතනය කොට ටයර් දමා පුළුස්සා දමන ලදී.

**වර්තමාන තත්ත්වය** : ගම්පහ දිස්ත්‍රික්කයේ ගම් කීපයක වයස අවුරුදු 17ත් 34ත් අතර තරුණයන් අඩුම වශයෙන් 34 දෙනකු වීරගුල සහ ගනේමුල්ල පොලිස් ස්ථානවල පොලිස් නිලධාරීන් විසින් අත් අඩංගුවට ගෙන අත්තනගල්ලේ රක්ෂිත වනාන්තරයට ගෙනයන ලදී.[207] මේ අතරින් 12 දෙනකුට වධහිංසා පමුණුවා, වෙඩි තබා, ටයර් දමා පුළුස්සන ලද අතර, එක් වින්දිතයකු ගැලවී පලා ආවේ වෙඩි වැදුණු තුවාල සහිතව[209] ය . සිරුරු පුලුස්සන්නට යොදාගත් ලී කොට සහ ටයර් ඇවිලෙමින් තිබෙනු දුටු බව සමූහ මිනීවළ නිරීක්ෂණයට ගිය අධිකරණ වෛද්‍ය නිලධාරියා සටහන් කොට තිබුණි.[210] දිවි ගලවාගත් එකම වින්දිතයා සහ අත් අඩංගුවට ගැනීම් දුටු වින්දිතයන්ගේ ඥාතීන් ලබාදුන් විස්තර අනුව මුලින්ම අත් අඩංගුවට ගන්නා ලද පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාව 14 කි. නීතිපති උපදෙස් පරිදි 1990 දී මහේස්ත්‍රාත්වරයකු විසින් හත් දෙනකු නිදහස් කර හරින ලදී. ඉතිරි හත් දෙනාට පැහැරගැනීම සහ මිනීමැරීම සම්බන්ධයෙන් නඩු පවරන ලදී. එක් වගඋත්තරකරුවකු 1991 නොවැම්බරයේදී නාඳුනන තුවක්කුකරුවකු විසින් ඝාතනය කරන ලද අතර ඉතිරි හය දෙනාට 1994 මුලදී අධිචෝදනා පත්‍ර භාරදෙන ලදී.[211] කෙසේ වෙතත්, සාක්ෂි පරස්පරතා හේතුවෙන් සියලු දෙනාම 2000 දී නිදොස් කොට නිදහස් කරන ලදී. දිවි ගලවාගත් ඇසින් දුටු එකම සාක්ෂිකරුවා 2017 අප්‍රේල් මාසයේදී මිය ගොස් තිබේ.[212]

## 6

**දිනය** : 1994

**ස්ථානය** : වල්පිට රජයේ ගොවිපොළ, මිනුවන්ගොඩ, ගම්පහ දිස්ත්‍රික්කය

**පසුබිම** : ජවිපෙ සැකකරුවන්ගේ සිරුරු බවට සැක කෙරේ.

**සොයාගන්නා ලද ශේෂයන්** : පළාතේ මහේස්ත්‍රාත්ගේ නියමයෙන් මළ සිරුරු 30ක් පමණ ගොඩ ගන්නා ලදී.

**වර්තමාන තත්ත්වය** : බස්නාහිර, දකුණ සහ සබරගමුව කොමිසම් සභාවේ අවසන් වාර්තාව අනුව මේ සමූහ මිනීවල භාරනු ලැබුයේ ගොවිපලකට, ප්‍රදේශයේ තැපැල් කන්තෝරුවකට, බැංකුවකට සහ මංසන්ධිය අසල පුද්ගලික වෙළෙඳ සලකට එල්ල කරන ලද ජවිපෙ ප්‍රහාරයකින් අනතුරුවය. 1994 මූලික විමර්ශනයෙන් පසු බස්නාහිර පළාත් සභාවේ සභාපති ආරියරත්න ජයතිලක ඇතුළු සැකකරුවන් 14 දෙනකු අත් අඩංගුවට ගන්නා ලදී. අත් අඩංගුවට ගන්නා ලද්දවුන් අතර සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නොයෙල් කුඩාහෙට්ටි 1995 නොවැම්බරයේදී ඇප පිට නිදහස් කරන ලදී. ඇප නියෝගය අවලංගු කරන ලෙස නීතිපති කාර්යාලය මීගමුව මහාධිකරණයෙන් කළ ඉල්ලීමකට අධිකරණය එකඟ විය. කෙසේවෙතත්, එයින් අවුරුද්දකට පසු සැකකරුවන් 11ක් නිදහස් කරන ලෙස නීතිපති කාර්යාලය අධිකරණයෙන් ඉල්ලා සිටියේය.[213] නඩු විභාගය සිදුකළ මහේස්ත්‍රාත් පාලිත බණ්ඩාරනායක මාරුකර යවන ලදී. ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණින් පාලක පොදුජන පෙරමුණට පැති මාරු කිරීමෙන් පසු ආරියරත්න ජයතිලක නිදොස් කොට නිදහස් කෙරිණි. 2000 දී දේශපාලනයෙන් විශ්‍රාම ගිය ඔහු 2015 දී මිය ගියේය.[214] නියෝජ්‍ය පොලිස්පතිවරයකු ලෙසින් විශ්‍රාම ගිය නොයෙල් කුඩාහෙට්ටි 2021 මාර්තුවේ දී මියගියේය.[215] මුලින්ම අත් අඩංගුවට ගන්නා ලද පොලිස් නිලධාරීන් අතරින් අයකු වූ නිමල් ප්‍රනාන්දු, පසුව සේවයේ පිහිටුවා වයඹ පළාතේ පොලිස් ස්ථානාධිපතිවරයකු පත් කරන ලදී. [216]

## 7

**දිනය** : 1994

**ස්ථානය** : සූරියකන්ද, රත්නපුර දිස්ත්‍රික්කය

**පසුබිම** : 1987-89 ජවිපෙ කැරැල්ල සමයේ මෘත ශේෂයන්

**සොයාගන්නා ලද ශේෂයන්** : මළ සිරුරු 300කට අධිකය. ඇඹිලිපිටියෙන් අතුරුදහන් කරනු ලැබූ පාසල් දරුවන් ඇතුළු තරුණයන් 46 කගේ සිරුරු එහි වල දමා ඇති බව පැවසේ. එහෙත් කැනීම් සිදුකරන ලද වෘත්තීය නොවන ස්වභාවය නිසා සාක්ෂි විනාශ වී ගොසිනි.

**වර්තමාන තත්ත්වය** : මිනීවළ පරිශ්‍රයෙන් හමුවූ දෑ පිළිබඳ මහේස්ත්‍රාත් පරීක්ෂණයක් ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් පියසේන රණසිංහගේ අධීක්ෂණය යටතේ 1994 ජනවාරි 3 දා ආරම්භ කෙරිණි. රුහුණු විශ්ව විද්‍යාලයේ අධිකරණ වෛද්‍ය ඒකකයේ මහාචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල, ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි එල් බී එල් අල්විස් සහ කොළඹ දකුණ ශික්ෂණ රෝහලේ වෛද්‍ය නිලධාරී එස් එම් කොළඹගේ කැනීම් භාරව කටයුතු කළහ. නුපුහුණු ශ්‍රමය සහ ගල්පොරෝ, බුල්ඩෝසර් වැනි මෙවලම් යොදාගෙන හෑරීම නිසා බොහෝ මෘත ශේෂයන් විනාශයට පත්වී, ඇටසැකිලි කලවම් වී තිබුණි.[217] මුල්ම දිනයේ සිරුරු 20කට අයත් යැයි සැලකෙන හිස් කබල් හතක් සහ මිශ්‍ර අස්ථි ගණනාවක් ගොඩ ගන්නා ලදී. එම සාක්ෂි මුද්‍රා තබන්නට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. ජනවාරි 8 වැනිදා තවත් කැණීමක් සිදු කිරීමට නියමිතව තිබුණි. එහෙත්, පරිශ්‍රයට පැමිණි විපක්ෂයේ නීතිඥවරුන්ගේ පිළිගැනීම වූයේ මිනීවල අපවේශනය කොට ඇති බවයි. එක් වළක් තවදුරටත් හාරා ඇති බවටද, වතුර පිරුණු තවෙකකට පස් දමා ඇති බවටද, එක වළකට හිස් කබලක් සහ කහ සිවුරක් අලුතින් දමා ඇති බවටද ඔවුහු ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් හමුවේ විරෝධතාවක් ගොනු කළහ. මේ අලුත් 'සාක්ෂි' ද මුද්‍රා තබන ලෙස මහේස්ත්‍රාත් නියෝග කළේය. ජනවාරි 8 දා සවස් වනවිට තවත් හිස්කබල් හයක් සහ අත්, පා කිහිපයක අස්ථි ද රැස් කොට ගෙන තිබුණි. ඇතැම් අස්ථි බාල වයස්කාරයන්ට අයත් බවක් දිස්වුනු අතර අඩුම වශයෙන් හිස් කබල් දෙකක ඇස් වසා බැඳ තිබුණි. ඒ අතරවාරයේ රජය විසින් සමූහ මිනී වළෙන් හමුවූ දෑ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු කණ්ඩායමක් පත් කරන ලදී. කැනීම් සිදු කෙරුණු

සමස්ත කාලයේම පාහේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීහු වළ අසල සිටියහ. ජනවාරි 10 වැනිදා, ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේදී ශේෂයන් හඳුනා ගැනීමට මහජනතාවට අවස්ථාවක් සලසා දෙන ලදී. ඉන් අනතුරුව මේ ඇට කැබලි මිනිස් අස්ථි බවට සහතික කිරීමට, මරණ සිදුවන්නට ඇති කාලය නිර්ණය කිරීමට සහ මරණයට හේතුව නිගමනය කිරීමට කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යවන ලදී. ඇතැම් සාක්ෂිකරුවන්ට මරණ තර්ජන එල්ලවීම සහ තමන්ටත් නිවෙස බලා යද්දී වෙඩි පහරකට ලක් වන්නට සිදුවීම නිසා නඩු විභාගය කල් දමන ලෙස විපක්ෂය වෙනුවෙන් පෙනී සිටි ප්‍රධාන නීතිඥයා 1995 ජනවාරි 17 වැනිදා ඉල්ලා සිටියේය. මාධ්‍ය වාර්තාවලට අනුව ආණ්ඩුව පවසා තිබුනේ අධිකරණ වෛද්‍ය නිලධාරී වාර්තා ලැබුණු පසු ඉදිරි පියවර තීරණය කරන බවයි.[218]

සිසු දරුවන්ගේ දෙමාපියන් විසින් කරන ලද බරපතල  උද්ඝෝෂණවලින් අනතුරුව, 1995 දී වයස අවුරුදු 15ත් 17ත් අතර වූ ශිෂ්‍යයන් 24ක් ඇතුළු  25 දෙනකු ඝාතනයට කුමන්ත්‍රණය කිරීම ඇතුළු චෝදනා 80ක් සම්බන්ධයෙන් නම දෙනකුට එරෙහිව අධි චෝදනා ගොනු කරන ලදී. කුමන්ත්‍රණය කිරීම, මිනීමැරීමේ අරමුණින් පැහැරගෙන යාම සහ අතුරුදහන් කිරීම සඳහා සෙවන හමුදා කඳවුරේ අයුතු ලෙස සිරකොට තබා ගැනීම සම්බන්ධයෙන් 1999 පෙබරවාරියේදී හමුදා නිලධාරීන් හය දෙනකුට සහ විදුහල්පතිවරයකුට දස අවුරුදු සිර දඬුවම් පනවන ලදී.[219] එසේ වෙතත්, මරා දැමීමට පෙර දරුවන් රඳවා තිබු සෙවන හමුදා කඳවුරේ උසස්ම හමුදා නිලධාරියා වූ  අණ දෙන නිලධාරී එවක ලුතිනන් කර්නල් ආර් පී ලියනගේ (රොහාන් පරාක්‍රම -'පැරී'- ලියනගේ) පැහැරගැනීමට තිබු සෘජු සම්බන්ධය ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොතිබුණු හෙයින් ඔහු නිදොස් කොට නිදහස් කරන ලදී.[220]  2002 මුලදී ගොනු කරන ලද අභියාචනයකින් සොල්දාදුවන් හතර දෙනකුගේ සහ විදුහල්පති ගේ වරදකාරිත්වය තහවුරු කරන ලදී. ලුතිනන් කර්නල් ආර් පී ලියනගේ නිදහස් කර යැවීමට එරෙහිව නීතිපති අභියාචනයක් ගොනු කළේ නැත. ඒ දෙමාපියන්ගේ අකැමැත්ත මැද ය. ඔහු පසු කලෙක බ්‍රිගේඩියර් තනතුරට උසස් කරන ලදී.[221] ඒ, ලියනගේ ඒ සම්බන්ධ වගකීමක් ඉසිලූ බව සෙවන කඳවුරේ අතුරුදහන් කිරීම් පිළිබඳව බස්නාහිර, දකුණ හා සබරගමුව අතුරුදහන් කිරීම් පිළිබඳ කොමිසම සම්පාදනය කළ විශේෂ වාර්තාවකින් නිගමනය කර තිබියදීය.[222]

## 8

**දිනය** : 1994

**ස්ථානය** : එස්සැල්ල, ගම්පහ දිස්ත්‍රික්කය

**පසුබිම** : 1987-89 ජවිපෙ කැරැල්ල සමයේ මෘත ශේෂයන්.

**සොයාගන්නා ලද ශේෂයන්** : මහේස්ත්‍රාත් නියමයෙන් 1994 ඔක්තෝබර් 13-14 දිනවල කැනීම් සිදු කරන ලදී.

**වර්තමාන තත්ත්වය** : බස්නාහිර, දකුණ හා සබරගමුව අතුරුදහන් කිරීම් පිළිබඳ කොමිසමේ අවසන් වාර්තාවට අනුව මේ ශේෂයන් අයත් වන්නේ පළාතේ හමුදා කඳවුරකින් (B හමුදා කඳවුර ලෙස හඳුන්වා ඇත) 1989 සැප්තැම්බර් 19 දා ගෙනයන ලද සිරකරුවන් 15කට හෝ 16 කට ය. ඒ අතර කාන්තාවෝ  තුන් දෙනෙක්ද වෙති.[223] ඒ වාර්තාවටම අනුව සමූහ මිනීවළ පිහිටියේ එස්සැල්ල, යටගම ප්‍රාථමික විද්‍යාලය අසල ය. සමූහ මිනීවළක් ඇති කිරීමට පෙර "ජවිපෙ ප්‍රහාරයකින් මියගිය හමුදා නිලධාරියකුගේ නිවස අසල කානුවක දමා තිබු වෙඩි වැදුණු තරුණ පිරිමි හා කාන්තා මළ සිරුරු  ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කරනු ලැබීමෙන් අනතුරුව, ට්‍රක් රථවල ශබ්ද සහ වෙඩි හඬ" ඇසුණු බව බස්නාහිර, දකුණ හා සබරගමුව අතුරුදහන් කිරීම් පිළිබඳ කොමිසම නිරීක්ෂණය කර තිබුණි.[224]

## 9

**දිනය** : 1995

**ස්ථානය** : බොල්ගොඩ වැව, කොළඹ දිස්ත්‍රික්කය

**පසුබිම** : මේ සිරුරු දෙමළ විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයන් යැයි සැක කෙරුණු දෙමළ තරුණයන්ගේ බවට විශ්වාස කෙරේ. කොළඹ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් කරන ලද පශ්චාත් මරණ පරීක්ෂණයක් සහ 1990 නොවැම්බර් මස බ්‍රිතාන්‍යයේ ග්ලාස්ගෝ විශ්ව විද්‍යාලයේ සිදුකළ මුහුණු ප්‍රතිනිර්මාණය හා වීඩියෝ අධිස්ථාපනය ඇතුළු ගැඹුරු ව්‍යෝහාරික විභාගවලින් අනතුරුවත් පස් දෙනකු අඳුනා ගනු ලැබිණි.[225] හඳුනාගනු ලැබූ සිරුරු ඔවුන්ගේ ඥාතීන්ට භාර දෙන ලද්දේ දැයි දැනගන්නට නැත.

**සොයාගන්නා ලද ශේෂයන්** : බොල්ගොඩ වැවේ, අලව්ව ඔයේ සහ දියවන්නා ඔයේ පාවෙන මල සිරුරු 21ක් හමුවී තිබේ.

**වර්තමාන තත්ත්වය** : අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කරන ලද විමර්ශනවලින් අනතුරුව 1996 දී පොලිස් විශේෂ කාර්ය සාධක බලකායේ 21 දෙනකු හා සාමාන්‍ය වැසියන් තිදෙනකු අත් අඩංගුවට ගන්නා ලදී. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් හමුවට පමුණුවන ලද ඔවුන් රිමාන්ඩ් භාරයට පත් කෙරිණි. ඒ අතරින් නිලධාරීන් තුන් දෙනකුට අලගස්වාමි කුමාරසිංහම් හෙවත් කන්නන් ලෙස හඳුනා ගන්නා ලද එක් වින්දිතයකු පැහැරගෙන, සාවද්‍ය ලෙස සිරකොට තබාගැනීමේ චෝදනා ගොනු කෙරිණි. ඔවුන්ට එරෙහිව ප්‍රමාණවත් සාක්ෂි නැතැයි තීරණය කළ නීතිපති දෙපාර්තමේන්තුව ඒ වෙනුවට විනය පියවර ගන්නා ලෙස නිර්දේශ කළේය.[226]

## 10

**දිනය** : 1999

**ස්ථානය** : දොරේඅප්පා ක්‍රීඩාංගණය, යාපනය දිස්ත්‍රික්කය

**පසුබිම** : සිරුරු කාගේදැයි පැහැදිලි නැත. හමුවූ ඇටසැකිලි 1987 දී උතුරු පළාතේ වාඩි ලා සිටි ඉන්දීය සාම සාධක හමුදා (IPKF) විසින් ඝාතනය කොට වල දමන ලද යාපනය වාසීන්ගේ බවට සැක කෙරේ.

**සොයාගන්නා ලද ශේෂයන්** : දොරේඅප්පා ක්‍රීඩාංගනයේ අලුතින් ක්‍රීඩක පහසුකම් ඉදිකිරීම සඳහා අත්තිවාරම් දමද්දී ඇටසැකිලිවල කම්කරුවන්ගේ සවල් වැදී තිබේ.[227]

**වර්තමාන තත්ත්වය** : කැනීම් කටයුතු දින පහක් තිස්සේ සිදුවිය. මුල් දිනයේ ඇටසැකිලි අටක්ද, ඊළඟ දිනයේ 16ක්ද, තුන්වැනි දිනයේ 25ක්ද හමුවී තිබේ.[228]

**දිනය** : 1999

**ස්ථානය** : චෙම්මනි, යාපනය දිස්ත්‍රික්කය

**පසුබිම** : මේ සමූහ මිනීවළවල් ඇති ස්ථානය 1996 දී අනාවරණය වූයේ පාසල් ශිෂ්‍යාවක වූ ක්‍රිෂාන්ති කුමාරස්වාමි ඝාතනය කොට ඉක්බිතිව ඇගේ මව, සොහොයුරා සහ අසල්වාසියකු ද ඝාතනය කිරීම සම්බන්ධයෙන් ලාන්ස් කෝප්‍රල් සෝමරත්න රාජපක්ෂ ඇතුළු සෙබළුන් පස් දෙනකුට එරෙහි නඩු විභාගය පවත්වාගෙන යද්දී ය. ඇයගේ සිරුර ගොඩගන්නා ලද ස්ථානයේ තවත් සිරුරු 400ක් පමණ වල දමා ඇති බව නඩු විභාගයේදී රාජපක්ෂ ප්‍රකාශ කළේය.

**සොයාගන්නා ලද ශේෂයන්** : 15

**වර්තමාන තත්ත්වය** : අතුරුදහන් කිරීම් 15 කට වගකිවයුතු හමුදා සාමාජිකයන් පංච පුද්ගල කමිටුවක් විසින් 1998 දී හඳුනා ගන්නා ලදී. කමිටු වාර්තාව කිසිවිටෙකත් ප්‍රසිද්ධියට පත් කෙරුණේ නැත. හමුදා නිලධාරීන් හතර දෙනකු අත් අඩංගුවට ගන්නා ලදී. කැනීම් සිදුකරන ලද්දේ වෝහාරික විද්‍යාව පිළිබඳ රුහුණු විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අධිකරණ වෛද්‍ය නිලධාරී චන්ද්‍රසිරි නිරිඇල්ල යටතේ ය.[229] චෙම්මනියේ ඇතැම් කැනීම් කටයුතු ජාත්‍යන්තර වෝහාරික විශේෂඥයන් සහ ඇම්නස්ටි ජාත්‍යන්තරය විසින් අධීක්ෂණය කරන ලදී. විශේෂඥයන් කවරකුවත් කැනීම්වලට සම්බන්ධ වූයේ නැත.

DNA පරීක්ෂණ සඳහා අස්ථි නියැදි ඉන්දියාවේ හයිදරාබාද් වෝහාරික විද්‍යාගාරයටත්, එතනින් බ්‍රිතාන්‍යයටත් යවන ලදී. හමුදා සහ පොලිස් භටයන් අතලොස්සක් ආරම්භයේදී අත් අඩංගුවට ගත්තේ වුවද, අධි චෝදනා ගොනු කෙරුණේ නැත. නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝගයෙන් සැකකරුවන් ඇප මත මුදා හරින ලදී. නඩුව පසුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට මාරුකර යවන ලද්දේ යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටියහොත් තම ජීවිතයට අනතුරක් වෙතැයි හමුදා නිලධාරීන් තර්ක කිරීමෙන් අනතුරුව ය. 2006 ජනවාරි මාසයේදී නඩුව නිමාවට ගෙන එනු ලැබුවේ නීතිපතිවරයාගේ උපදෙස් නැති හෙයින් තව දුරටත් නඩුව පවත්වාගෙන යා නොහැකි බව පොලිසිය කොළඹ මහේස්ත්‍රාත්වරයාට දැනුම් දීමත් සමග ය. එසේ කෙරුණේ පොලිස් විමර්ශනවලින් අනාවරණය කරගත් දෑ නීතිපති දෙපාර්තමේන්තුවට භාර දී තිබියදී ය.[230]

ඉන් අනතුරුව, මෙම නඩුවේ ප්‍රධාන සැකකරුවන්ට උසස්වීම් ලබා දී තිබේ. කපිතාන් සී ජේ ටී කේ ලලිත් හේවාට පානදුරයේ හමුදා නිවාඩු නිකේතනයක් භාර ජ්‍යෙෂ්ඨ ලුතිනන් කර්නල් පදවියක් ලැබුණි. කපිතාන් ටී ඩී ශෂික පෙරේරා මන්නාරමේ හමුදා කඳවුරක් භාර ජ්‍යෙෂ්ඨ ලුතිනන් කර්නල් ලෙස පත් කොට, පසුව කලාවැව හමුදා කඳවුරට අනුයුක්ත කරන ලදී. ලුතිනන් සචින්ද්‍ර විජේසිරිවර්ධන මුලතිව් හමුදා කඳවුර භාර කනිෂ්ඨ ලුතිනන් කර්නල් කොට පසුව පනාගොඩ යුද්ධ හමුදා මූලස්ථානයට අනුයුක්ත කෙරිණි. ලුතිනන් ඒ යටගම විශ්‍රාම ගොසිනි.[231] සම්බන්ධ වුවන් ලෙසින් සෝමරත්න විසින් නම් කරන ලද බවට වාර්තාවන කිසිවකුටවත් එරෙහිව චෝදනා ගොනු කෙරුණේ නැත. ඒ අය අතර ජයතිලක, නසාර්, සමරවික්‍රම, පරිවාසික සෙබල පෙරේරා, සෙබල ජේ එම් ජයසිංහ, ලුතිනන් තුඩුගල[232], ලුතිනන් උදයකුමාර, මේජර් කරුණාසේකර, කැප්ටන් ජයවර්ධන, කෝප්‍රල් බණ්ඩාර, පරිවාසික සෙබල නිශාන්ත, පරිවාසික සෙබල අල්විස් (මිය ගොසිනි), පරිවාසික සෙබල මුතුබණ්ඩා, සාජන් සිල්වා යන හමුදා සාමාජිකයන් සහ කොස්තාපල් ප්‍රියදර්ශන, නිලධාරී අබ්දුල් හමීඩ් සහ නිලධාරී සමරසිංහ[233] යන අය වෙති. ක්‍රිෂාන්ති කුමාරස්වාමි දූෂණය කොට මරා දැමීමට වරදකරු වූ සෝමරත්න රාජපක්ෂ ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් විඳිමින් සිටී.

## 12

**දිනය** : 2000

**ස්ථානය** : මිරුසුවිල්, යාපනය දිස්ත්‍රික්කය

**පසුබිම** : වින්දිතයන් අතුරුදහන් වී සතියකට පසු 2000 දෙසැම්බර් 25 වැනිදා කැනීම් කටයුතු ආරම්භ විය.

**සොයාගන්නා ලද ශේෂයන්** : දරුවන් තිදෙනකුගේ ඇතුළුව අභ්‍යන්තරිකව උන්හිටි තැන් අහිමිවූ අට දෙනකුගේ සිරුරු ගොඩගන්නා ලදී. පස් අවුරුදු එක දරුවකුගේ සිරුරේ වද හිංසාවට ගොදුරු වූ ලකුණු තිබුණි.

**වර්තමාන තත්ත්වය** : නඩු විභාගය අවසන් වීමට අවුරුදු 15ක් ගතවිය. ආරම්භයේ දී නඩුව චාවකච්චේරි මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලදුව හමුදා නිලධාරීන් 14 දෙනකු අත් අඩංගුවට ගන්නා ලදී. තමන්ගේ ජීවිතයට අනතුරක් වෙතැයි බිය පල කළ සැකකරුවන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමකින් අනතුරුව නඩුව අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයට මාරු කරන ලදී. ඉන් අනතුරුව අගවිනිසුරු විසින් කොළඹ මහාධිකරණයේ නඩුව විභාග කිරීමට විනිසුරු මඩුල්ලක් පත් කරනු ලැබුණි. අවස්ථා ගණනාවකදීම නඩුව කල් දමනු ලැබීය.[234] දීර්ඝ අධිකරණ කාර්යදාමයකින් අනතුරුව යුද හමුදාවේ දිගුදුර විහිදුම් බලකායේ සාමාජික සුනිල් රත්නායකට 2015 දී මරණ දණ්ඩනය පනවන ලද අතර තවත් චූදිතයන් හතර දෙනකු සියලු චෝදනාවලින් නිදහස් කෙරිණි. අභියාචනාධිකරණය විසින් 2015 දී දඬුවම තහවුරු කරන ලදී. දඬුවම නියම කොට අවුරුදු පහක් ගතවෙත්ම 2020 වසරේදී එවක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, ජනාධිපති සමාවක් ලබා දී රත්නායක නිදහස් කර යැවීය.[235] 2021 දී ඇමරිකා එක්සත් ජනපදය රත්නායක එරටට ඇතුල් වීම තහනම් කළ අතර[236] 2023 මුලදී කැනඩාව විසින්ද එම පියවරම අනුගමනය කරන ලදී.[237]

## 13

**දිනය** : 2010

**ස්ථානය** : ගණේෂපුරම්, කිලිනොච්චි දිස්ත්‍රික්කය

**පසුබිම** : කළු පොලිතීන් මලු වලින් ඔතා තිබු මල සිරුරු පරණ වැසිකිලි වළක් ශුද්ධ කරන අතරතුර හමුවිය.

**සොයාගන්නා ලද ශේෂයන්** : 6

**වර්තමාන තත්ත්වය** : https://www.dailymirror.lk/article/mass-grave-in-kilinochchi-4058.html?fbrefresh=1505404589

## 14

**දිනය** : 2012

**ස්ථානය** : මාතලේ, මාතලේ දිස්ත්‍රික්කය

**පසුබිම** : මාතලේ මහ රෝහලේ ඉදිකිරීමක ජෛව වායු ඒකකයක් ස්ථාපිත කරමින් සිටි කම්කරුවන්ට මානව මෘත ශේෂයන් හමුවිය. මාතලේ මහේස්ත්‍රාත් උසාවියේ නඩු අංකය ඊ 1810/12 වෙයි.

**සොයාගන්නා ලද ශේෂයන්** : දරුවන් තිදෙනකුගේ ඇතුළුව අභ්‍යන්තරිකව උන්හිටි තැන් අහිමිවූ අට දෙනකුගේ සිරුරු ගොඩගන්නා ලදී. පස් අවුරුදු එක දරුවකුගේ සිරුරේ වද හිංසාවට ගොදුරු වූ ලකුණු තිබුණි.

**වර්තමාන තත්ත්වය** : කැනීම් කරන ලද්දේ මහේස්ත්‍රාත් චතුරිකා ද සිල්වාගේ අධිකාරීත්වය යටතේ ය. අතුරුදහන් වුවන්ගේ ඥාතීන්ට සහ සාක්ෂිකරුවන්ට ඉදිරිපත් වන ලෙස ඉල්ලා ජනමාධ්‍යයේ ප්‍රසිද්ධ දැන්වීම් පලකරන ලෙස කරන ලද නියෝගය පොලිසිය පිළිපැද්දේ නැත.

වෝහාරික පුරාවිද්‍යාඥ මහාචාර්ය රාජ් සෝමදේවගේ වාර්තාවට අනුව, ගිනි අවි හා මොට උපකරණ යොදාගත් බවත්, හිස්කබලට ඇණ ගැසූ හා හිස් ගසා දමන ලද බවත් දැක්වෙන ලකුණු ගොඩගත් සිරුරුවලින් අනාවරණය වී ඇත. ශේෂයන් අතරින් හමුවූ ඇතැම් මානව කෘති පදනම් කරගත් ඔහුගේ නිගමනය වූයේ මල සිරුරු 1980 අග භාගයට අයත් බව ය. අස්ථි සාම්පල පරීක්ෂණ කටයුතු සඳහා විදේශයකට යවන ලෙස මහේස්ත්‍රාත්වරයා දුන් නියෝගය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සති හයකට වැඩි කාලයක් නොතකා හරින ලදී. මහේස්ත්‍රාත් පරීක්ෂණයක් කෙරෙමින් තිබෙන නිසා ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු වෙනත් නීතිඥවරුන් විරෝධය පල කරද්දීත්, හිටපු ජනාධිපතිවරයා ත්‍රිපුද්ගල විමර්ශන කොමිසමක් පත් කළේය. විනිසුරුවරයා වහාම මාරුකර යවා වෙනකකු පත් කරන ලදී. අමතර දිවුරුම් ප්‍රකාශ බාරගැනීම ප්‍රතික්ෂේප කළ අලුත් විනිසුරුවරයා එතෙක් ලැබී තිබුණු දිවුරුම් ප්‍රකාශ ජනාධිපති කොමිසමට යොමු කළේය. 156 දෙනකුගෙන් සාක්ෂි රැස් කළ කොමිසම විසින් චීනයේ විද්‍යාගාරයකින් සහ එක්සත් ජනපදයේ ෆ්ලොරිඩාවේ බීටා ඇනලටික් ආයතනයෙන් වෝහාරික වාර්තාවක් ලබාගැනීමට නියම කරන ලදී.[228]

නියැදි ලබාගෙන මුද්‍රා තබා ඊට අදාළ ලියවිල්ලේ පිටපතක් මාතලේ මහේස්ත්‍රාත් වෙත යැවූ අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් බීටා ඇනලටික් (එක්සත් ජනපදයේ විශේෂඥ සමාගමක්) නිශ්චිත මාර්ගෝපදේශ ප්‍රකාර මුල් ලියැවිල්ල විද්‍යාගාරයට යවන ලදී. විධාන දාමය පවත්වාගෙන යන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියැදි බාර දෙන ලදී. කාබන් කාල නිර්ණය සඳහා විශේෂඥ අධීක්ෂණයකින් තොරව යවන ලද සාම්පල බීටා ඇනලටික් විසින් නිගමනය කෙරුනේ 1950 ගණන්වලට පෙර කාල වකවානුවකට අයත් බව ය.[239]

බීටා ඇනලටික් නිගමනයට විරුද්ධව තර්ක කළ වෝහාරික පුරාවිද්‍යාඥ රාජ් සෝමදේව යෝජනා කර සිටියේ පුරාවිද්‍යා කාල නිර්ණයට වෙනස් නිගමනයක් කාබන් දාතම වාර්තාවේ ඇත්තේ සාම්පල දූෂ්‍ය වීමක් නිසා විය හැකි බව ය. 2015 දී ආණ්ඩු මාරුව සිදුවූ පසු, විමර්ශනය නැවත ආරම්භ කළ කොමිසම විසින් 1950 ට පෙර කාල නිර්ණය පිළිබඳ උපකල්පනය අනුමත කරන ලදී. ජනාධිපති මෛත්‍රිපාල සිරිසේනට දෙන ලද වාර්තාව කිසිදාක ප්‍රසිද්ධියට පත් කෙරුනේ නැත. මහේස්ත්‍රාත් නඩු විභාගය 2015 දී අවසන් කරන ලදී. ඊට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ උනන්දුවක් ඇතැම් පාර්ශවයන් වෙතින් පළ වුනත්, 2023 ආරම්භය වනවිටත් කිසිදු අභියාචනයක් ගොනු කර තිබුනේ නැත.[240]

## 15

**දිනය** : 2013

**ස්ථානය** : තිරුකේතීස්වරම්, මන්නාරම් දිස්ත්‍රික්කය

**පසුබිම** : මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයේ B768/13 අංකය දරන නඩුව. ආණ්ඩුවේ මූලාශ්‍ර චෝදනා කරන්නේ මේ එල්ටීටීඊ ය විසින් මරා දමන ලද යුද හටයන්ගේ මළ සිරුරු බව ය. වෙනත් මූලාශ්‍රවල චෝදනාව නම් මේ රජයේ හමුදා විසින් අතුරුදහන් කරන ලද වින්දිතයන් බවයි.

**සොයාගන්නා ලද ශේෂයන්** : 80 කට වැඩි ය.[241] තවත් සිරුරු ගොඩගන්නට තිබෙන බවට විශ්වාස කෙරේ.

**වර්තමාන තත්ත්වය** : 2013 දෙසැම්බර් 22 වැනිදා මන්නාරම මහේස්ත්‍රාත් ආනන්දි කනගරත්නම් විනිසුරුවරිය පරීක්ෂණයක් ආරම්භ කළාය. ඇය සොහොන් බිමට මූලික නිරීක්ෂණයට ගියේ 1999 චෙම්මනි විමර්ශනයට සම්බන්ධ වී සිටි අධිකරණ වෛද්‍ය නිලධාරී ඩී එල් වෛද්‍යරත්න සමග ය.[242] 2014 ජනවාරියේදී අධිකරණ වෛද්‍ය නිලධාරියා කියා සිටියේ රෙදිපිළි හෝ මිනිස් අතින් නිමවන ලද කිසිදු මානව කෘතියක හෝ සලකුණක් මිනීවළේ තිබුණේ නැති බව ය. අස්ථි ශේෂ සංරක්ෂණය සඳහා 80කට වැඩි පෙට්ටි ගණනක පුරවාගෙන, ලේබල් ගසා, මුද්‍රා තැබූ ඔහු, ඒවා අධිකරණ නියෝගයක් යටතේ ගබඩා කිරීම සහ වැඩිදුර පරීක්ෂණ සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට ප්‍රවාහනය කර තිබේ. ඇතැම් අස්ථි ශේෂවල වෙඩි උණ්ඩවලින් පසාරු කෙරුණු ලකුණු තිබුණු බවද, තවත් ඒවායේ අත් පිටුපසට බැඳ තිබුණු බවද වාර්තා වේ.

මෙය 1930 ගණන්වල සිට භාවිතා කෙරුණු සාමාන්‍ය කනත්තක් විනා සමූහ මිනීවළක් නොවන බව 2014 අප්‍රේල් මාසයේ දී පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය. ඥාතීන් විසින් පෙත්සම් ගොනු කරන ලදුව 2016 දී කැනීම් නැවත ආරම්භ වී අස්ථි ශේෂ දෙකක් සොයා ගනු ලැබුණි.

වෝහාරික පුරාවිද්‍යාඥයකු/ මානව විද්‍යාඥයකු මිනීවළට අදාළ කාල නිර්ණය කිරීමට පෙර භූ විද්‍යාඥයෙක් සහ පරමාණු විශේෂඥයෙක් ඔවුන්ගේ වාර්තා ඉදිරිපත් කළහ. මෙය අසාමාන්‍ය ය.

අනුරාධපුර ශික්ෂණ රෝහලේ තබා ඇති අස්ථි ශේෂ අධිකරණ නියෝගයකින් තොරව බැහැර කිරීම 2015 ඔක්තෝබරයේදී මහේස්ත්‍රාත් විසින් තහනම් කරන ලදී. ආර්ජන්ටිනාවේ, පේරුවියාවේ සහ ගෝතමාලාවේ වෝහාරික

මානව විද්‍යාඥ කණ්ඩායම් වෙත සාම්පල යවන්නට 2015 දෙසැම්බරයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එකඟ විය. කෙසේ වෙතත්, මෙය සිදු නොවුණි. කල් යත්ම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගෝතමාලාවේ වෝහාරික මානව විද්‍යාඥ කණ්ඩායම හා සම්බන්ධ වී තිබුණත්, අනෙක් අය හා සම්බන්ධ වී නැත. ගෝතමාලා වෝහාරික කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණ යම් පුහුණුවක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මන්නාරමේ සුසාන භූමියට නොගිය ඔවුහු කිසිදු කැනීමකට සහභාගී නොවූහ.

2023 මුල භාගයේදී, ඇතැම් ශේෂයන් අධිකරණ නියෝගයෙන් අස්ථි වින්‍යාසයක් සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ වෝහාරික හා මානව විද්‍යා දෙපාර්තමේන්තුවට ගෙනයන ලදී. අන්තිමේදී, උපදේශක අධිකරණ වෛද්‍ය නිලධාරී වෛද්‍යරත්න විසින් එක්සත් ජනපදයේ, ෆ්ලොරිඩාවේ බීටා ඇනලිටික් වෙත යැවීම සඳහා 2023 ජනවාරි 3 වැනිදා සාම්පල ලබාගන්නා ලදී. කෙසේ වෙතත්, කිසිදු නියෝගයක් හා මුදල් නැති තැන ඒවා තවමත් ඇත්තේ මහේස්ත්‍රාත් අධිකරණය භාරයේ ය.

## 16

**දිනය** : 2014

**ස්ථානය** : කළුවන්චිකුඩි, මඩකළපු දිස්ත්‍රික්කය

**පසුබිම** : කාත්තන්කුඩි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B172/14.

මෘත ශේෂයන් එල්ටීටීඊ සංවිධානය විසින් කළ ඝාතනවල වින්දිතයන්ගේ - විශේෂයෙන්ම 1990 ජූලි 12 වැනිදා කුරුක්කල්මඩමින් පැහැරගන්නා ලද මුස්ලිම්වරුන්ගේ - යැයි විශ්වාස කෙරේ.

**සොයාගන්නා ලද ශේෂයන්** : 160 කට වඩා විය හැකි ය.[243] එකදු මෘත දේහයක්වත් අද වනතුරු ගොඩ ගෙන නැත.

**වර්තමාන තත්ත්වය** : එල්ටීටීඊ ය විසින් මරා දමන ලද එක් පුද්ගලයකුගේ පුත්‍රයා උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව (LLRC) සහ අතුරුදහන් වීම් පිළිබඳ ජනාධිපති කොමිසම ඉදිරියේ සාක්ෂි දුන්නේය. 1990 ජූලියේදී මරා දමන ලද මුස්ලිම්වරුන් එල්ටීටීඊය විසින් වළ දමන ලද ස්ථානය හඳුනා ගත හැකි බවට පළාතේ මුස්ලිම් නියෝජිතයන් ජනාධිපති කොමිසම ඉදිරියේ සාක්ෂි දුන්හ. ආරක්ෂක හමුදා සම්බන්ධයක් ඇතැයි පැවසුණු ස්ථානවලට වඩා යුහුසුළුව ආරම්භයේදී ආණ්ඩුව විසින් මේ පරිශ්‍රය විමර්ශනය කරන ලදී.[244] කෙසේ වෙතත්, කොළඹ සිටි ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී සහ රජයේ රස පරීක්ෂක ආදී වෝහාරික විශේෂඥයන් පැමිණ නොසිටීම වැනි හේතු නිසා විමර්ශන කිහිප වාරයක් කල් දමනු ලැබුණි.

එවක් පටන්, විමර්ශන ඇනහිට ඇති අතර කිසිදු මෘත ශරීර ගොඩලෑමක් සිදුවූයේ නැත. මේ සමූහ මිනීවළේ කැනීම් දිගටම කරගෙන යාමෙන් එල්ටීටීඊය අතහැර 2008 දී මහින්ද රාජපක්ෂ පාලනයට හවුල් වූ විනායගමූර්ති මුරලිදරන් (කර්නල් කරුණා)ගේ සම්බන්ධයක් හෙළිවනු ඇතැයි රජය වටහා ගැනීම ඊට හේතුව ලෙසින් පෙනී යයි.[245]

අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නියෝජිතයන් සමග සැක කටයුතු ස්ථානය වෙත යාමට 2019 දී OMP ය විසින් කාත්තන්කුඩි මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලුම් කරන ලදී.[246] ඊට අවසර ලැබුනේද යන්න පැහැදිලි නැත.

## 17

**දිනය** : 2018

**ස්ථානය** : මන්නාරම, මන්නාරම් දිස්ත්‍රික්කය

**පසුබිම** : මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක ඊ232/18. ඇටසැකිලි කෙසේ පැමිණියේ දැයි තවමත් පැහැදිලි නැත.

**සොයාගන්නා ලද ශේෂයන්** : 2018 දෙසැම්බර් වනවිට දරුවන් 28ක් ඇතුළු 318 කගේ ඇටසැකිලි ගොඩගෙන තිබුණි.

**වර්තමාන තත්ත්වය** : මිනීවළ අනාවරණය වුනේ සතොස ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතුවලදී ය. හිමිකරුවන්

විසින් ඒ බව පොලිසියට දන්වන ලදී. සැක කටයුතු සතොස මිනීවළ පරිශ්‍රයේ විමර්ශන සඳහා නිරීක්ෂකයකු ලෙසින් සහභාගී වන්නට OMP ය 2018 නොවැම්බරයේ දී ඉල්ලීමක් කළේය. සොයා ගන්නා ලද දෑ අතර කකුල් එකට ගැටගැසීම සඳහා යොදාගන්න ලද යකඩ කම්බි තිබුණි.[247] 2019 දීත් OMPය නඩු කටයුත්ත නිරීක්ෂණයේ යෙදුනු අතර, ව්‍යෝහාරික මානව විද්‍යාඥයන්ගේ සහායෙන් විමර්ශනයේ ඒ දක්වා ප්‍රගතිය සමාලෝචනය කළ OMP ය, අනාවරණය කරගත් දෑ ඥාතීන්ගේ නියෝජිතයන් ඇතුළු අදාළ පාර්ශව සමග සාකච්ඡා කළේය.

2019 ජනවාරියේදී, අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් ෆ්ලොරිඩාවේ, මයාමි හි බීටා ඇනලිටික් වෙත අස්ථි සහ දන්ත නියැදි බාරදෙනු ධඑප කොමසාරිස්වරයකු සහ ඥාතීන්ගේ නීතිඥ නියෝජිත දෙපලක් (CHRD) විසින් නිරීක්ෂණය කරන ලදී. 2019 පෙබරවාරියේදී ලැබුණු රේඩියෝ කාබන් දත්ත පරීක්ෂාවෙන් කියවුනේ එම සාම්පල 15-18 ශතවර්ෂවලට අයත් ඒවා විය හැකි බවයි. ප්‍රතිඵල ලැබීමෙන් අනතුරුව මන්නාරම මහේස්ත්‍රාත්වරයා තාවකාලිකව කැනීම් නවත්වා අංග සම්පූර්ණ වාර්තාවක් දෙන ලෙස විමර්ශන කණ්ඩායමට නියෝග කළේය. එය තවමත් බාර දී නැත.

